
වාර්ෂික වාර්තාව

2021

පටුන

- සම්බන්ධීකරණ තොරතුරු..... 01
- දැක්ම සහ මෙහෙවර 02
- සංස්ථාමය තොරතුරු 03-07
- සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව..... 08-40
- මූල්‍ය වාර්තා 41-44
    - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....41
    - ආදායම පිළිබඳ ගිණුම් ප්‍රකාශය..... 42
    - ස්කන්ධය මත වෙනස්වීම් පිළිබඳ ගිණුම් ප්‍රකාශය..... 43
    - මුදල් ප්‍රවාහ ප්‍රකාශය..... 44
- ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්..... 45-60
- විගණකාධිපති වාර්තාව..... 61-73
- විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතන ගත් ක්‍රියාමාර්ග.....74-92



දැක්ම හා මෙහෙවර

දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත්වීම

ධ්‍යක්ෂක මණ්ඩලය අධ්‍යක්ෂක මණ්ඩලය 2021

මෙහෙවර

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගිත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ දේශීය නිෂ්පාදනයට සහ වතු සේවක පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම දායකත්වයක් ලබාදීම.

අධ්‍යක්ෂක මණ්ඩලය

නීතිඥ ශ්‍රීමාල් විජේසේකර මහතා

සභාපති

පත්වීම් දිනය 2020.01.23

අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්

ආර්.ඒ.ආර්.එස්.මායාදුන්න මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ අමාත්‍යාංශ නිරීක්ෂක
පත්වීම් දිනය 2020.01.28

ඩී.ඒ.මනෝරත්න මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

ජේ.එල්.ඒ.සම්පත් නලින්ද මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

එස්.එම්.සි.එස් සිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

ඩී.ආර්.සුසන්ත සේනාරත්න මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

ඒ.එම්.සුමේධ රේණුක බණ්ඩාර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

කුෂාන් වැගොඩපොළ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.01.28

ඩබ්.ඩබ්.එම්.බී.පී.කඹුරාදෙනිය මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පත්වීම් දිනය 2020.10.12


කළමනාකරණය - ප්‍රධාන කාර්යාලය 2021

නම	තනතුර
නීතිඥ ශ්‍රීමාල් විජේසේකර මහතා	සභාපති
එච්.එන්.පී.ජිනසේන මහතා	සාමාන්‍යාධිකාරී
ජේ.එච්.අයි.ජයසුන්දර මහතා	වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන
එස්.අයි.එම් හසන් මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
කේ.ඒ.එච්.ඩී.පෙරේරා මහත්මිය	කළමණාකාරිනී - ප්‍රසම්පාදන
කේ මුණසිංහ මහතා	කළමණාකරු- නීති
බී.වී.එල්.සී.බෙනරගම මහත්මිය	කළමණාකරු - ඉඩම්
ඩබ්.ඩී.ඩබ්.කීර්ති මහතා	කළමණාකරු - අළෙවි
ඊ.ආර්.අයි.බී.එස්.එස්.බණ්ඩාර මහතා	අභ්‍යන්තර විගණක
ආර්.ජී.එස්.එච්.ගුණතිලක මහතා	ගණකාධිකාරී
ආර්.වයි.ජී.එස්.යාපා මහතා	සහකාර කළමණාකරු -ප්‍රවාහන
ජී.ඩී.එස්.සී.සුදසිංහ මෙනවිය	සහකාර කළමණාකරු - පාලන/මානව සම්පත්
පී.වී.ප්‍රදීප් මහතා	සහකාර කළමණාකරු - ඉඩම්
එච්.එම්.එස්.එන්.හේරත් මිය	සහකාර කළමණාකාරිනී- අළෙවි
පී.සී.ජේ.පනාගොඩ මහතා	සහකාර ගණකාධිකාරී
අයි.පී.කුරුප්පු මහතා	විගණන නිළධාරී
ජී.බී.සී.ෆොන්සේකා මහතා	පරිපාලන නිළධාරී


කළමණාකරණය - වැවිලි 2021

නම	තනතුර
පී. අයි.එල්.පෙරේරා මහතා	වතු අධිකාරී, කැලෑබොක්ක රාජ්‍ය වතුයාය
ඒ.සී.අබේවර්ණ මහතා	වතු අධිකාරී, රංගල රාජ්‍ය වතුයාය
කේ.ඩී.එම්.පී.වීරසිංහ මහතා	වතු අධිකාරී,හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය
එස්.වයි.ලියනගේ මහතා	වතු අධිකාරී, කොටගහ රාජ්‍ය වතුයාය
ආර්.ඒ.ආර්.එම්.රණවක මහතා	වතු අධිකාරී,හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය
ටී.එම්.පී.අයි.කේ.තෙන්නකෝන් මහතා	වතු අධිකාරී, ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය
ආර්.ඒ.එම්.දයාරත්න මහතා	වතු අධිකාරී,ගෝමර රාජ්‍ය වතුයාය
ඩබ්.ටී.කේ.සමරතුංග මහතා	වතු අධිකාරී,මිඩ්ලන්ඩ්ස් රාජ්‍ය වතුයාය
ටී.ආර්.එච්.හේවගේ මහතා	වතු අධිකාරී,හාගල රාජ්‍ය වතුයාය
වයි.ඒ.ටී.බී.වඩුගොඩපිටිය මහතා	වතු අධිකාරී, අලකොල්ල රාජ්‍ය වතුයාය
ජී.ඩබ්.ජී.විජේරත්න මහතා	වතු අධිකාරී, ඕපල්ගල රාජ්‍ය වතුයාය
අයි.ඩබ්.ආර්.ජයවර්ධන මහතා	වතු අධිකාරී, වලහන්දුව රාජ්‍ය වතුයාය
ඩී.ඩබ්.ටී.සී.දන්තසිංහ මහතා	වතු අධිකාරී,වයිතලාව රාජ්‍ය වතුයාය
ජී.කේ.ආර්.බී.කිරිඇල්ල මහතා	වතු අධිකාරී, විහාරගල රාජ්‍ය වතුයාය
එම්.එම්.සී.බී.ඇහැලමල්පෙ මහතා	වතු අධිකාරී,වුඩ්සයිඩ් රාජ්‍ය වතුයාය
සී.ජේ.දසනායක මහතා	විදේශ නිවාඩු
සී.එච්.එච්.කේ.ජී.ලක්රුවිර මහතා	වැඩ ආවරණ වතු අධිකාරී, නිකොළොය රාජ්‍ය වතුයාය
එස්. ඩබ්.එම්.සි.එස්. අලදෙණිය මහතා	කුඩාඔය රාජ්‍ය වතුයාය

සංවිධාන ව්‍යුහය


සංවිධාන ව්‍යුහය
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලය සහ වතුයායන්
සභාපති
HM 2-1
HM 1-1
MM 1-1
JM 1-1
MA 5-2
MA1-1
PL 3
PL 1
අභ්‍යන්තර විගණක (1)
ගණකාධිකාරී (1)
නීති නිලධාරී (1)
පරිපාලන නිලධාරී (1)
වැවිලි අංශය
විගණන නිලධාරී (1)
සහකාර ගණකාධිකාරී (1)
පරිපාලන නිලධාරී (1)
ප්‍රධාන කාර්යාලය
ප්‍රාදේශීය කාර්යාලය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් තේ වතුවල ව්‍යාප්තිය



1	Alakolla
2	Cottaganga
3	Galphella
4	Goomara
5	Hagalla
6	Harepark
7	Hunasgeria
8	Kallebokka
9	Kudaoya
10	Midlands
11	Nicholoya
12	Opalgala
13	Rangalla
14	Waithalawa
15	Walahanduwa
16	Wiharagala
17	Woodside

රූපය 02- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ වතු ව්‍යාප්තිය

සභාපතිතුමාගේ සමාලෝචනය 2021



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලාභ ලබන රාජ්‍ය ව්‍යවසායක් බවට පත්කිරීමට 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද වැඩසටහන් තවදුරටත් සාර්ථක කර ගැනීම අරමුණු කොට ගෙන සංස්ථාවේ අනෙකුත් ඉලක්කයන් සැලසුම් සහගතව ලගාකර ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය මෙන්ම ඉහළ කළමනාකාරීත්වය විසින් 2021 වර්ෂය තුළදී ආයතනයේ කටයුතු මෙහෙයවීම සිදු කරන ලදී.

2021 වර්ෂයේ දී සංස්ථාවේ අලාභය රුපියල් මිලියන 231.19 වූ අතර පෙර වර්ෂයට අලාභය රුපියල් මිලියන 149.63 විය. මෙම අලාභ තත්ත්වයට හේතුන් මෙම වසරේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් පමණක් නොව දීර්ඝ කාලයක් තිස්සේ සංස්ථාවේ මතු වී තිබූ ගැටළු රාශියක ප්‍රතිඵලයක් වේ. විශේෂයෙන් අලාභය වැඩිවීමට හේතු වුයේ 2021 වර්ෂයේ මාර්තු මාසයේ සිට රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත කම්කරු වැටුප් වැඩි වූ අතර එමගින් සමස්ථ වියදම 34% කින් පමණ ඉහල යන ලදී.

සෑම අංශයකින්ම අධික අලාභ ලබමින් මහාභාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රතිපාදන මත යැපෙමින් පැවති මෙම රාජ්‍ය ව්‍යවසාය ඉන් මුදවා ගත හැකි විභවයක් සහිත සම්පත් වලින් හෙබි ආයතනයක් බව කළමනාකරණය විසින් 2020 වර්ෂය තුලදීම හඳුනාගෙන ක්‍රියාකළ අතර පාඩුව අවම කරමින් ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීමේ නිශ්චිත වැඩපිළිවෙලක් දිර්ඝකාලීන, මධ්‍යකාලීන හා කෙටිකාලීන ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සකස් කර ගත යුතුව තිබිණි. ඒ සඳහා මූලිකව ආයතනය සතු සම්පත් මොනවද යන්න පිලිබඳව මනා වැටහීමක් ලබා ගත යුතු වුවද ආයතනය සතු ඉඩම් පිලිබඳව නිවැරදි තොරතුරු නොමැති වීම නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කිරීමේදී මුහුණ දුන් බරපතල ගැටළුවක් විය. මෙම ආයතනයේ කළමනාකාරීත්වය භාර ගන්නා විට අනිවාර්යෙන් පැවතිය යුතු ව්‍යාපාරික සැලැස්මක් හෝ ඒ මත සකස් වූ ක්‍රියාකාරී සැලැස්මක් නොවිය.

එබැවින් නිශ්චිත ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම මූලික කාර්යයක් ලෙස සලකා ක්‍රියාකරමින් එතෙක් ආයතනය මෙහෙයවීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල තීරණ කළමනාකරුවන් හා වතු අධිකාරිවරුන් සමඟ සාකච්ඡා කොට කෙටිකාලීන වැඩපිළිවෙළක් සකස් කර ගනිමින් ආයතනයේ කළමනාකරණ කටයුතු මෙහෙයවන ලදී.

වර්ෂ 1994 සිට ආරම්භ කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ කළමනාකරණය කරමින් පාලනය වනුයේ මැදරට කලාපයට අයත් මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කයන් තුල පිහිටි වතුයායන් වන අතර (ඇල්කඩුව වැවිලි සමාගම පිහිටුවීමෙන් පසු) ඒවා වතුයායන් 16ක් ලෙස පාලනය කරමින් පැවතිණි. එම වතුයායන් 16 අතරින් හෙයපාර්ක්, වුඩ්සයිඩ් හා වෛතලාව යන වතුයායන් වරින් වර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකරණ තීරණ මත පෙර වර්ෂ වලදී පුද්ගලික පාර්ශවයන්ට බදු දීමට ලක් කොට ඉන්පසු නිසි පරිදි පාලනය නොවීමෙන් නැවත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කර ඇත. එලෙස බදුදීම හේතුවෙන් එම වතුයායන්ද නිසිපරිදි නඩත්තු කොට කළමනාකරණය නොකිරීම මත විශාල වගකීම් ප්‍රමාණයක් ඉතිරි වී ඇති අතර ඵලදායිතාවයෙන් අඩු තත්ත්වයක පැවැතිණි.

ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දුව වතුයාය හා බදුල්ල දිස්ත්‍රික්කයේ විහාරගල වතුයාය පෞද්ගලීකරණය කිරීමෙන් අනතුරුව ඒවායේ ඉතා කුඩා කොටස් පෞද්ගලික අංශයන් අත්හැර දැමීම හේතුවෙන් නැවත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතට ගෙන පාලනය කරනු ලැබුවද එලදායිතාවය ඉතා අඩු තත්වයක පැවති අතර නිසි වගාවන් සිදු නොවීමත්, පරිපාලන වියදම් දැරීමට සිදුවීම හේතුවෙන් අධික පාඩු ලබමින් එම වතුයායන්හි රාජකාරියේ නියුතු කාර්ය මණ්ඩලය නඩත්තු කිරීමද මේ දක්වා එම වතුයායන් සංවර්ධනය කිරීමට ක්‍රියා නොකිරීම නිසා ආයතනයේ අධික පාඩුවක් ලැබීමට මූලික හේතුවක් බවට සඳහන් කල හැක.

ඒ අනුව 2021 වර්ෂය වන විට ආයතනයේ පැවති වාර්තා අනුව පාලනය වූ වතු ප්‍රමාණය වතු 17ක් වූ අතර ඒවායේ සඳහන් වූ සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර 11,013.70 කි. එසේ වුව ද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කයහි පැවති සියලු වතුයායන් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශිත නකල්ස් කඳු පන්තිය වටා පිහිටා තිබූ අතර ඉන් සැලකිය යුතු භූමි ප්‍රමාණයක් දළ බෑවුම් හා සෝදාපාළුවට ලක්වී ඇති වගාකිරීමට නුසුදුසු ඌන උපයෝජිත ඉඩම් ලෙසත් වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් පයිනස් වගාව සඳහා යොදා ගෙන ඇති බව වාර්තා අනුව හඳුනා ගත හැක. තවද 2007 වර්ෂයේදී නකල්ස් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශිත ගැසට් නිවේදනය නිකුත් කිරීමත් සමඟ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව ආදායම් ලබා ගනිමින් තිබූ විශාල භූමි ප්‍රමාණයක් නකල්ස් රක්ෂිතයට හා එහි ස්වාරක්ෂක කලාපයට (Buffer Zone) ඇතුලු වීමත් සමඟ තේ වගාවෙන් හා එනසාල් වැනි වෙනත් අතුරු බෝග වලින් හා වාණිජ වගාවලින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට ලැබෙමින් තිබූ ආදායම් අහිමි වී ඇත. එලෙස රක්ෂිත භූමි බවට ප්‍රකාශයට පත්වීමෙන් පසු ඉවත් වූ බිම් ප්‍රමාණය කුමක්ද යන්න ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නියමිත පරිදි මැන හඳුනාගෙන නොමැත. ආදායම් ලබමින් තිබූ භූමි භාගයන් රක්ෂිතයක් බවට පත්වීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සිදුවූ පාඩුවද ගණනය කර නොමැති අතර වන්දි ලැබීමක් ද සිදු වී නොමැත.

රක්ෂිත ලෙස අත්පත් කරගෙන ඇති භූමිය වෙන් කර හඳුනා ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් ලෙස හඳුනා ගන්නා ලද අතර මෙම ඉඩම් සම්පූර්ණයෙන් මැන ගැනීමට අවශ්‍ය මූලික අරමුදල් නොමැතිවීම නිසා ඒ වන විට වැවිලි අමාත්‍යාංශය හරහා ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ කලමනාකරණය වන ඉඩම් මැනීම වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය යටතේ සිදුකරන ලද වැඩසටහනට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඉඩම් මැනීමද ඇතුලත් කරන ලෙසට ගරු වැවිලි අමාත්‍යවරයාගෙන් කරන ලද ඉල්ලීමට අනුව ඒ සඳහා කැබිනට් අනුමැතියද ලබා ගැනීමට වැවිලි අමාත්‍යාංශය ක්‍රියා කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු බවට සංඛ්‍යාලේඛණ වල සඳහන් (නකල්ස් රක්ෂිතයට අයත් වී ඇති බිම් කොටස් සමඟ) සමස්ත භූමි ප්‍රමාණයෙන් තේ වගාව පවතිනුයේ 37.50% භූමි ප්‍රමාණයක් වන අතර එය ප්‍රමාණයෙන් හෙක්ටයාර 4,074ක් පමණ වේ. මෙම ප්‍රමාණයෙන්ද සෘජුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව තේ වගාව මගින් ආදායම් ලබාගැනීමට කලමනාකාරණය කරනු ලබනුයේ හෙක්ටයාර 2,540 පමණ අඩු ප්‍රමාණයක් වීම කණගාටුවට කරුණකි. එම භූමි ප්‍රමාණයේ ඇත්තේ වඩාත් හොඳ අස්වැන්නක් ලබා ගත හැකි තේ වගාවක් නොවන අතර පවතින තේ පදුරු ප්‍රමාණයද හෙක්ටයාරයකට පැවතිය හැකි අගයට වඩා අවම ප්‍රමාණයක් වේ.

එම වගාව අතුරෙන් 30.4% රිකිලි තේ (VP) වගාවද, 32.8% පැරණි ඇට තේ (Seedling) වගාවද පවතී. තවද පැරණි ඇට තේ වගාව නිසිපරිදි නඩත්තුව නොගෙවීම හා සංස්ථාව මගින් කළමනාකරණය ඵලදායි නොවන බව පෙර වර්ෂ වලදී හඳුනාගැනීම හේතුවෙන් 36.8% භූමි ප්‍රමාණයක් වතුයායේ පදිංචි සේවකයන්ට භාර දී අස්වැන්න දළු කිලෝවකට මිලක් ගෙවා ගැනීමේ (Out grower) හෙවත් Contract Plucking යන ක්‍රමවේදය කාලයක සිට ක්‍රියාත්මක කරයි. එම ක්‍රමය යටතේ සංස්ථාවේ ආදායමට කිසිදු සාධනීය දායකත්වයක් නොලැබේ.

පසුගිය දශකයක දෙකකට වැඩි කාලයක් නව තේ වගාවක් සිදු කිරීම හා පවතින වගාව නිසි පරිදි නඩත්තු කිරීමක් සිදුකර නොමැති බවට තහවුරු විය. ඉහත දත්තයන්ට අනුව සංස්ථාව ලාභදායී තත්ත්වයට ගෙනවිත් තිරසාර රාජ්‍ය ව්‍යාවසායක් දක්වා ගෙනයාමට අනිවාර්යෙන් කඩිනමින් නැවත තේ වගාව ඇති කර අවම වශයෙන් මාසික අමුදළු අස්වැන්න දළු කිලෝ 1,250,000 සීමාවට ගෙනයාම අනිවාර්ය අවශ්‍යතාවක් සේ හඳුනා ගෙන නැවත තේ වගාව ආරම්භ කරන ලදී.

ඒ අනුව, 2021 වර්ෂය අවසාන වන විට හෙක්ටයාර 10.75 පමණ භූමි ප්‍රමාණයක් නව වගාව හා නැවත තේ වගාවන් (New Planting/ Re- Planting and Infilling) වතුයායන්හි සිදුකිරීමට පියවර ගනු ලැබීය. 2022 වර්ෂයේ සිට මහා පරිමාණයෙන් තේ වගාව සිදු කිරීම සඳහා මූලික තේ පැළ තවාන් ඇති කිරීම (Tea Nurseries) වතුයායන් කිහිපයක් මුල් කරගෙන ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ආදායම් වැඩිකිරීම සඳහා ප්‍රධාන වශයෙන් නිපදවන සියලුම අමු තේ දළු බාහිර පාර්ශවයන්ට විකිණීම නතර කොට සංස්ථාවේ කර්මාන්ත ශාලාවන්හි ප්‍රමිතියෙන් උසස් තේ දළු නිෂ්පාදනය කිරීම කළමනාකරණයේ මූලික ඉලක්කය විය. ඒ අනුව, ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ මැදිහත්වීම මත 2021 වර්ෂයේ තේ කර්මාන්තශාලා සඳහා නවීන තාක්ෂණය එක් කිරීම සඳහා අයවැයෙන් වෙන්කරන ලද මුදලින් රුපියල් මිලියන 14ක මුදලක් ශ්‍රී ලංකා රාජ්ය වැවිලි සංස්ථාවේ ගෝමර කර්මාන්තශාලාව (ඕතොඩොක්ස් (Orthodox) වර්ගයේ තේ නිෂ්පාදනය කරනු ලැබේ) නවීන තාක්ෂණය උපයෝගී කොට නැවත පිහිටුවීම සඳහා ලබා දෙන ලදී.මෙමඟින් වර්ෂය පුරාම විවෘත්‍ය නොවන නිමි තේ අදායමක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ. එසේම, 2021 වර්ෂය තුළ නැවත තේ වගාව හා කර්මාන්තශාලා නවීකරණය හා නඩත්තුව වෙනුවෙන් රුපියල් මිලියන 47.34 වියදමක් කරනු ලැබ අතර ඉන් රුපියල් මිලියන 33.3 ප්‍රමාණයක් සම්පූර්ණයෙන් සංස්ථාව විසින් උපයන ලද මුදලින් වියදම් කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පසුගිය වර්ෂ ගණනාවක්ම සමස්ත පාඩුවක් ලැබීමට ප්‍රධාන හේතුවක් වනුයේ අමුතේ දළු කිලෝ ග්‍රෑම් 01ක නිෂ්පාදන පිරිවැය ඉහළ යාමයි. එකී සමස්ත නිෂ්පාදන පිරිවැයෙන් (COP) 48.47% දළ වශයෙන් වැය වනුයේ වතුයායන්හි පරිපාලන වියදම් වෙනුවෙනි. මෙම පරිපාලන වියදම සමීපව දෛනිකව නිරීක්ෂණය කරමින් වියදම් පාලනය කරමින් ද අත්‍යවශ්‍ය පරිපාලන වියදම් දැරීමටද ක්‍රියාකිරීම සිදු කරන ලදී. එසේම ඉදිරියේදී ලාභ ඉපයීම සඳහා එම පරිපාලන වියදමට සාපේක්ෂව ආදායම් වර්ධනය කිරීම අනිවාර්යය අවශ්‍යතාවයක් ලෙස හඳුනා ගෙන කළමනාකරණ තීරණ ගැනීමට ක්‍රියා කරන ලදී.

2021 වර්ෂයේ මාර්තු 05 වන දිනට රජය ප්‍රතිපත්තිමය තීරණය මත වතු කම්කරු දෛනික වැටුප රුපියල් 1,000 දක්වා වැඩිකරනු ලැබූ අතර ඒ අනුව කම්කරුවකු වෙනුවෙන් දෛනිකව රුපියල් 1,150 මුදලක් ව්‍යවස්ථාපිත දීමනා සමඟ වියදම් වේ. රජයේ තීරණයට අනුගත වෙමින් මාර්තු මස සිට වැඩි වූ කම්කරු වැටුප ගෙවීමට ක්‍රියා කරන ලදී. ඒ අනුව, ආයතනයේ සමස්ත වියදම 34.5% කින් 2021 මාර්තු මස සිට වැඩි විය.

ඒ අනුව 2021 වර්ෂය තුළ අලුතින් වැඩි වූ කම්කරු වැටුප් වෙනුවෙන් දැරීමට සිදු වූ සමස්ත වියදම රුපියල් මිලියන 147.30 ක් වූ අතර එම වැටුප් වැඩිවීමට අදාළ වියදම සම්පූර්ණයෙන්ම ආයතනය විසින් වර්ෂය තුල උපයන ලද අදායමෙන් ගෙවීමට අවශ්‍ය පියවර ගනු ලැබීය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සමස්ත වියදම 2021 වර්ෂය තුළ කම්කරු වැටුප් වැඩිවීම මධ්‍යයේ වුවද මහා භාණ්ඩාගාරයට බරක් නොවී සහ මහා භාණ්ඩාගාරයෙන් කිසිදු මුදලක් ලබා නොගෙන කළමනාකරණය කර ගැනීමට හැකිවීම ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයක් විය.

මෙම වර්ෂය තුළදී ද නොගෙවා හිඟව තිබූ පැරණි ව්‍යවස්ථාපිත දීමනා වෙනුවෙන් අධිකරණයන්හි පවරා තිබූ නඩු වෙනුවෙන් රුපියල් මිලියන 25.06 පමණ මුදලක් ගෙවීමට සිදු වූ අතර ඉන් නඩු 116 ප්‍රමාණයක් අවසන් කිරීමට හැකි විය. එහෙත් ඒ වන විට නොගෙවා තිබූ ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධව නඩු 80 ප්‍රමාණක් අලුතින් සංස්ථාවට එරෙහිව අධිකරණයන්හි ගොනු කර තිබුණි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව බැංකු මගින් ලබාගෙන තිබූ ණය සහ බැංකු අයිරා මත මෙම වර්ෂය තුළ ගෙවීමට සිදු වූ සමස්ත ණය පොලී ප්‍රමාණය රුපියල් මිලියන 27.09කි. ඉහත සඳහන් කරුණු මත මෙම වර්ෂය තුළ ද වර්තමාන සේවකයන්ගේ ව්‍යවස්ථාපිත දීමනා නිසි පරිදි ගෙවීමට හැකි වූයේ එක් මසක් පමණක් වීම කනගාටුවට කරුණකි.

එයට හේතුව වූයේ එක්වරම කම්කරු වැටුප් වැඩිවීම නිසා ආයතනික වශයෙන් 34.5 %කින් වැඩිවූ වියදම් හා පැරණි ව්‍යවස්ථාපිත දීමනා හා බැංකු පොලී සඳහා ගෙවූ මුදල් වේ. මේ ආකාරයෙන් වූ සියලු ගෙවීම් ආයතනය විසින් වාර්ෂිකව උපයා ගත් මුදල් මගින් ගෙවීම සිදු කරන ලදී.

2021 වර්ෂය තුළ සමස්ත පාඩුව රුපියල් මිලියන 249ක් වූ අතර එය 2020 වර්ෂයට සාපේක්ෂව වැඩි වීමකි. එසේ වූවත් 2021 වර්ෂය තුළ ඇස්තමේන්තුගත නොකල කම්කරු වැටුප් වැඩිවීම නොවන්නට මෙම වර්ෂය තුළ 2020 වර්ෂය සාපේක්ෂව පාඩුව තවත් විශාල ලෙස අඩු කර ගැනීමට හැකියාව තිබුණු බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

2021 අප්‍රේල් මාසය තුළ රසායනික පොහොර භාවිතය සම්පූර්ණයෙන්ම රජය ප්‍රතිපත්තියක් මත නතර කිරීම හේතුවෙන් නියමිත ආකාරයට වතුයායන්ට පොහොර යෙදවීම සිදු කිරීමට නොහැකි විය. කෙසේ වුවද පොහොර ලේකම් කාර්යාලය මගින් ලබාගත හැකි උපරිම පොහොර ප්‍රමාණය ලබා ගැනීමට ක්‍රියා කරන ලදී.

එවැනි බාධා මධ්‍යයේ වුවද 2021 වර්ෂය තුළ 2020 වර්ෂයට වඩා වැඩි අමු දළු අස්වැන්නක් ලබාගැනීමට හැකිවීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව නව දැක්මක් යටතේ කළමනාකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැක. 2021 වර්ෂයේ ලබාගත් අස්වැන්න 2013 වර්ෂයෙන් පසු ලබාගත් වාර්තාගත වැඩිම අස්වැන්න බවට පත් විය.

කළමනාකරණ පියවර හා තීරණ මත 2021 වර්ෂය තුල ලබා ගත් සමස්ථ අමු දළු අස්වැන්න කිලෝ ග්‍රෑම් 8,385,002 ක් විය. ලබා ගත් අමු දළු අස්වැන්නෙන් කිලෝ ග්‍රෑම් 3,072,360 ප්‍රමාණයක් සංස්ථාවේ කර්මාන්තශාලා මගින් නිෂ්පාදනය කරනු ලැබීය. ඒ අනුව නිෂ්පාදිත නිමි තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 660,723 විය. එම ප්‍රමාණය 2020 වර්ෂයට සාපේක්ෂව පිලිවෙලින් 3.38% හා 3.54% වැඩි වීමකි. එවැනි ප්‍රතිඵලයක් ලගා කර ගත හැකි වූයේ ලබා දිය හැකි මුලා තත්ත්වයන් යටතේ පොහොර යෙදීම හා අනෙකුත් කෘෂිකාර්මික යෙදවුම් සැපයීම හා වැඩි සුපරීක්ෂණය යෙදවීම හේතුවෙනි.

2021 වර්ෂය තුල නිෂ්පාදන පිරිවැය රු.1,033,504,673 වූ අතර එය 2020 වර්ෂයට සාපේක්ෂව 12.01% ඉහළ යාමකි. එයට හේතු වූයේ ප්‍රධාන වශයෙන් කම්කරු වැටුප් 34% කින් වැඩි වීමයි. එසේම සමස්ථ ශුද්ධ විකුණුම් සාමාන්‍ය අගය 460.43 ක් විය. එය 2020 වර්ෂයට සාපේක්ෂව 5.71% අගය ඉහල යාමක් විය.

2021 වර්ෂය තුලදීද රටේ කොවිඩ් තත්වය මාස ගණනාවක් පැවතීම නිසා සංචරණ සීමා සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ හා රජයේ චක්‍රලේඛ අනුව අනුගත වී වතුයායන් හා ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලු පරිපාලන ක්‍රියා අඛණ්ඩව හා බාධාවකින් තොරව සිදු කරගෙන යාමට හැකි විය.

වන කළමනාකරණ සැලැස්මට (Forestry Management Plan) අනුව 2021 වර්ෂය තුල නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුගතව හා රජයේ ආයතන මගින් ලබාගත් තක්සේරු වටිනාකම් වලට අනුව දැව නිස්සාරණය සිදු කරන ලද අතර එමගින් වාර්ෂිකව උපයා ගත් අදායම රුපියල් මිලියන 108.59 වූ අතර ඉවත් කරන ලද දැව ගස් ප්‍රමාණය 1,902 විය

සංස්ථාව විසින් නිෂ්පාදන කරනු ලබන ‘‘සංස්ථා තේ’’ විකුණුම් ප්‍රමාණය පසු ගිය වසරට සාපේක්ෂව 2021 වර්ෂයේදී 30.3% කින් වැඩි විය. මෙය ඉතා හොඳ පියවරක් වූ අතර කොවිඩ් තත්වය හමුවේ වුවද එම නිෂ්පාදන වල විකිණීම මෙම වර්ෂය තුල වැඩි කර ගැනීමට හැකි විය. නිෂ්පාදන බෙදාහැරීම සඳහා පැහැදිලි ක්‍රමවේදයක් සකස් කර නව අලෙවි නියෝජිතයින් බඳවා ගැනීම මගින් ආදායම් වැඩි කර ගැනීමට ක්‍රියා කරන ලදී.

ආයතනයේ පරිපාලන ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීම උදෙසා නියමිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් පුරප්පාඩු හා කොන්ත්‍රාත් පදනම යටතේ පැවති තනතුරු හැකිතාක් සම්පූර්ණ කිරීමට ක්‍රියා කරන ලදී. ඒ අනුව දීර්ඝ කාලයකට පසු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වැවිලි තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගනු ලැබූ අතර ප්‍රාදේශීය කාර්යාලයේ පරිපාලනය ශක්තිමත් කරමින් වතුයායන් සමීප අධීක්ෂණයට ලක් කිරීමට එම පත්කිරීම මහත් සේ දායක විය.

මීට පෙර වර්ෂයන්හිදී නිසි පරිදි සිදු නොවූ වතු අධිකාරීවරුන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් මෙම වර්ෂය තුළ දී මාසිකව නිසි ආකාරයට සිදු කරමින් අවශ්‍ය අවස්ථාවන්හිදී වතු නිරීක්ෂණය කරමින් රැස්වීම් පවත්වන ලදී. එමෙන්ම 2021 වර්ෂයේදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වන ලදී.

2021 වර්ෂය තුල ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට විසින් ලගා කර ගන්නා ලද මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනයන් සඳහා මෙම වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා ගත් නිවැරදි තීරණ ඉවහල් වූ බව සඳහන් කරමි. එසේම සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ප්‍රමුඛ සියලුම කාර්ය මණ්ඩලය සිදු කරන ලද කැපකිරීමද අගය කරමි.

ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

නීතිඥ ශ්‍රීමාල් විජේසේකර
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

සංස්ථාපිත පසුබිම

නීතිමය පිහිටුවීම

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 දී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත අංක 4 යටතේ පිහිටුවන ලද අතර පසුව 1962 අංක 12 සහ 1979 අංක 49 දරන පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඓතිහාසික පසුබිම

1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවා ඇති අතර, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පවරා දෙනු ලැබූ වතුයායන් සහ රජය සතු වගාකල බිම් සංවර්ධනය කර නගාසිටුවීමත්, වගාව මනා ලෙස කළමනාකරණය කිරීමත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. තවද, ඉඩම් කොමසාරිස් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරා ගන්නා ලද වතුයායන් කළමනාකරණය කර පවත්වාගෙන යාමට පවරාදීම ද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ තවත් අරමුණක් විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ආරම්භයේ සිටම ක්‍රියාත්මක වූයේ රජයට පවරා ඇති වතු කිහිපයක් සමඟ බැවින්, සංස්ථාව පිහිටුවීමේ අරමුණ ඉතා හොඳින් ක්‍රියාත්මක විය. එබැවින් කෙටි කාලයක් තුළ හෙක්ටයාර 15,000 ක පමණ වතු මිලදී ගැනීමට හැකි විය. ශක්තිමත් පනතක් මගින් ස්ථාපිත කිරීම සහ ඒ අනුව නිසි කළමනාකරණය මෙම වර්ධනයට හේතු විය.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ සහ 1975 සංශෝධිත පනත යටතේ ජනසතු කරන ලද වතුවලින් වතු 250ක් පමණ සහ පවතින භාරයන් අවලංගු කිරීම නිසා අත්පත් කරගත් වතුවලින් වතු 250ක් පමණ එතෙක් හිමිව තිබූ වතු 25ක් පමණ පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සංවර්ධනය හා නගාසිටුවීමේ අරමුණ පෙරදැරිව හිමිකර දෙන ලදි. එලෙසම අත්පත් කරගත් අනෙකුත් වතු ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පිහිටුවීමෙන් පසු එම ආයතනය වෙත පවරාදී ඇත.

විශාල වශයෙන් පුළුල් කළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වැඩිදියුණු කිරීමට කළමනාකරණ ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය විය. එමනිසා වතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා 1977 දී බලයට පත් රජය විසින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇත. ඒ අනුව වතු පරිපාලනය විමධ්‍යගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත 1979 අංක 4 දරන පනත මගින් සංශෝධනය කර ඇත. එම පනතේ 2 වැනි වගන්තියට අනුව ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යන නම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලෙස සංශෝධනය විය.

තවද, 1979 අංක 49 (සංශෝධිත) පනතේ අංක 6 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගමේ අරමුණු පහත පරිදි පුළුල් වී ඇත.

අ) නිසි කෘෂිකාර්මික කළමනාකරණයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා වතු ඉඩම් ප්‍රවර්ධනය කිරීම.
ආ) ඉඩම්වල පවතින වගාවන් ප්‍රතිසංස්කරණය කිරීමෙන් නිසි කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් ඇතිව කෘෂිකාර්මික වගාවන් විවිධාංගීකරණය කිරීම.
ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ විකිණීම.
ඈ) වතුවල සත්ව පාලනය සංවර්ධනය.
ඉ) වතුවල කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ ස්ථාපිත කිරීම සහ හොඳින් නඩත්තු කිරීම.
ඊ) වැවිලි සංස්ථාවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය සියලුම ක්‍රියා පටිපාටි සහ ක්‍රියාකාරකම් සිදු කිරීම.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කළමනාකරණය සහ විමධ්‍යගත ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා 1980 වර්ෂය තුළ බොහෝ පියවර ගන්නා ලදී. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතට පත්ව ඇත. 1980 පෙබරවාරි මාසයේදී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යසාධනය වැඩි කිරීම සඳහා වැඩි බලතල සහිත ප්‍රාදේශීය මණ්ඩල හතරක් පිහිටුවන ලදී. ඒවා SLSPC I, II, III සහ IV ලෙස නම් කර ඇත. 1984 දී මෙම ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කරමින් බලංගොඩ සහ මාතලේ අවට වතු නිසිලෙස කළමනාකරණය කිරීම සඳහා SLSPC V සහ VI ලෙස නම් කරමින් තවත් මණ්ඩල දෙකක් ස්ථාපිතකර ඇත. මේ ආකාරයට වතු කළමනාකරණය විමධ්‍යගත කළද ප්‍රතිපත්ති සම්පාදනය, අලෙවිකරණය, ගබඩාකරණය සහ මූල්‍ය කටයුතු කොළඹ පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි නීතිගත සංස්ථාවේ මධ්‍යම මණ්ඩලය මගින් සිදු කරන ලදී.

මෙම ප්‍රතිසංස්කරණවල අකාර්යක්ෂමතාවය සහ අඩු ඵලදායිතාව අවබෝධ කර ගැනීමෙන් පසුව රජය 1992 දී රාජ්‍ය සංස්ථා සහ දේපළ පෞද්ගලික සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ වැවිලි සමාගම් 22ක් පිහිටුවන ලදී. එම ප්‍රාදේශීය වැවිලි සමාගම් 22 වෙත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලාභදායී සහ ඉහළ කෘෂිකාර්මික ඵලදායිතාවයක් සහිත වතු 402 දිගුකාලීන බදු පදනම යටතේ පවරා දී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ඉතිරිව තිබුණේ දිගුකාලීන පාඩු ලබන උඩරට සහ පහතරට තේ වල ඇති ලාක්ෂණික ගුණාංග නොමැතිකම හේතුවෙන් අඩු විකුණුම් මිලක් සහිත මැදරට තේ නිෂ්පාදනය කරන වතුයායන් 55ක් පමණි. මෙම වතු 55 න් වතු 32 ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් විය. මෙම වතු 32 න් වතු 11 ක් 1993 දී සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමට පවරා දී ඇත. ඒ අනුව, ඉතිරි වතු 11 ක් ඒකාබද්ධ කර වතු 16 ක් පිහිටුවා ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට යටත් කර ඇත. මෙම වතුවල විශාල ප්‍රදේශයක් පැරණි බීජ තේ වලින් සමන්විත වන අතර මහතුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල නකල්ස් කඳුවැටිය අවට ඉඩම් දුර්වල පස් තට්ටුවකින් සමන්විත වේ. එම නිසා මෙම මැදරට වතුවල ස්වභාවිකව කොළ පැහැති දළු අස්වැන්න ඉතා අඩු මට්ටමක පවතී. වෙළෙඳ පොළ මිල පහළ මට්ටමක පැවතීම සහ අස්වැන්න අඩු මට්ටමක පවතින බැවින් මෙම වතු දිගුකාලීන පාඩු සහිත වතු ලෙස සැලකේ.

එසේම 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සියලුම කාර්ය මණ්ඩලයම විශ්‍රාම ගැන්වීමෙන් සියලු කටයුතු නවතා දමා තිබුණි. 1994 දී නව කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් මෙහෙයුම් නැවත ආරම්භ කර ඇත. එදා සිට 2006 වර්ෂය දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයට යටත් කර තිබුණි. 2001 සිට 2004 දක්වා කාලය තුළ පාඩු ලබන මෙම සංස්ථාව රජයට බරක් ලෙස සැලකේ. එබැවින් රජයට බරක් වීම අවම කර ගැනීමේ අරමුණින් සමහර වතු සහ වත්කම් දිගුකාලීන බදු පදනම මත ලබා දී ඇත.

ආයෝජන මණ්ඩලයේ නිර්දේශය යටතේ ඇතැම් ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයට බදු දී තිබූ වෛතලාව, වුඩ්සයිඩ්, හෙයාර්පාර්ක්, කොටගහ කර්මාන්තශාලාව වැනි වතු එම ව්‍යාපෘති අසාර්ථක වීම නිසා බදු දුන් පාර්ශව විසින් අත්හැර දමා ඇත. පසුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හෙයාර්පාර්ක් වත්ත සහ කොටගහ කර්මාන්තශාලාව වගකීම් රැසක් සමඟ පවරා ගැනීමට සිදු විය. අයහපත් කළමනාකරණය හේතුවෙන් අනවසර අත්පත් කර ගැනීම් සහ නඩත්තු නොකිරීම හේතුවෙන් වතුයාය වඩ වඩාත් පාඩු ලබන ආකාරය අත්හැර දැමූ හෙයාර්පාර්ක් වත්තෙන් මනාව පිළිබිඹු විය. පසුව වෛතලාව සහ වුඩ්සයිඩ් වතු වෙනත් පෞද්ගලික සමාගමකට පවරා දුන් අතර නිසි කළමනාකාරීත්වය නොමැතිකම හේතුවෙන් එම සමාගම වුඩ්සයිඩ් වත්ත අතහැර වෛතලාව වත්ත පමණක් තම පාලනය යටතේ තබාගෙන ඇත.

2006 දී රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව රාජ්‍ය ව්‍යවසායක ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයෙන් බැහැර කර උපාය මාර්ගික ව්‍යවසායකයින්ගේ ආයතනයේ විෂය පථයට යටත් කරමින් රජයේ උපායමාර්ගික සංවිධානයක් ලෙස කළමනාකරණය කිරීමට නව ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. කළමනාකරණ උපාය මාර්ගික ව්‍යවසායක කළමනාකරණ ආයතනයේ මැදිහත්වීම යටතේ තේ වගාවන් වෙනස්

වූවා සේම මෙම වතු පරිපාලනය කිරීමේ ක්‍රමවේදයද වෙනස් විය. ඒ අනුව වතුයායේ වත්කම් කළමනාකරණය පිළිබඳ නව සංකල්පයක් හඳුන්වා දී ඇත.

සංස්ථාවේ විවිධ වත්කම් එනම්, දැව සම්පත රු. මිලියන 3000ක් වන අතර, කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීමට ශක්‍යතාවක් ඇති ස්ථාන, කාබන් තිරකිරීම ගණනය කිරීම මගින් අලෙවි කිරීම සහ පාඩු ලබන වතුවල බෝග විවිධාංගීකරණය කිරීම මෙම නව සංකල්පය යටතේ හඳුනාගෙන ඇත.
2007 වසරේ නකල්ස් ලෝක උරුම ගැසට් පත්‍රය සමඟින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත්ව තිබූ ඉඩම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ලෝක උරුමයට නතුවිය. ඒ අනුව වාණිජ වනවගාව, එනසාල් වගාව ඇති ඉඩම් මෙන්ම තේ වගාව ඇති ඉඩම් ද නකල්ස් රක්ෂිතය යටතට පත්ව ඇත. කෙසේවෙතත්, ඉඩම් ප්‍රමාණය රක්ෂිතය යටතට පත් වූ නිසාත් මායිම් අවිනිශ්චිත වූ නිසාත් වතු කළමනාකරණය මෙන්ම රක්ෂිතය කළමනාකරණය කිරීම ගැටලු සහගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වඩාත් ආකර්ෂණීය ස්ථාන

කැලෑබොක්ක 360^0 දර්ශන පථය (වීව් පොයින්ට්)





කැලෑබොක්ක 360^0 වීව් පොයින්ට් (උස: මීටර් 1,175) ප්‍රවනතා ගමනාන්තයක් බවට පත් විය. කඳු මුදුන මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල මායිමේ පිහිටා ඇති අතර හත්ලේ කුඩා ලෝකාන්තය සහ හුන්නස්ගිරිය කන්ද සෑදෙන එකම කඳු මුදුන බෙදා ගනී. කඳුවැටිය උතුරට විහිදෙන අතර නකල්ස්හි බටහිර ස්කන්ධය සමඟ සම්බන්ධ වේ. පැහැදිලි දිනයක, නරඹන්නන්ට මධ්‍යම කඳුකරය, මහනුවර නගරය, සෙම්බුවත්ත වැව සහ නකල්ස් කඳුකරය නිරීක්ෂණය කළහැකි ආකර්ෂණීය ස්ථානයක් වේ.
අමුත්තන්ට නවාතැන් ගැනීමට කඳවුරු බිමක් සහ වතු බංගලා 02ක් ඇත. පැතලි කඳු මුදුනේ මැද භාගයේ නිම කරන ලද හින්දු සිද්ධස්ථානයක් සහ දර්ශන භුක්ති විඳීමට කූරු භාවිතයෙන් සාදන ලද පැල්පතක් ඇත. දහවල් කාලයේදී ප්‍රදේශය ආවරණය වන පරිදි මීදුම නිසා බාධාවකින් තොරව දර්ශන භුක්ති විඳීමට උදෑසන සංචාරය කිරීම වඩා යෝග්‍ය වේ.

බර්න්සයිඩ්





මහනුවර පිහිටා ඇති, බර්න්සයිඩ් බංගලාව රංගල පොල්ගොල්ල ජලාශයේ සී ප්ලේන් ගුවන් තොටුපළේ සිට සැතපුම් 13 ක් දුරින් පිහිටා ඇති ආකර්ෂණීය ස්ථානයකි.

දන්කන්ද වැව - මිඩ්ලන්ඩ්ස්





දර්ශනීය දන්කන්ද වැව මධ්‍යම පළාතේ ජලාශයක් වන අතර එහි උස මීටර් 957 කි. මෙම දන්කන්ද වැව, කිරිමැටියාරන්දට සහ දංකන්ද වත්තට ආසන්නව සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මිඩ්ලන්ඩ්ස් වතුයායට නුදුරින් පිහිටා ඇත.


හුන්නස්ගිරිය






මහනුවර නගරයේ සිට කිලෝමීටර 22ක දුරින් හා මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව ගම්මානයට ආසන්නයේ පිහිටි නකල්ස් කඳු පංතියත් හුන්නස්ෆෝල්ස් දිය ඇල්ලත් දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත්ගත් ආකර්ෂණීය ස්ථානයකි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය මගින් මෙම දිය ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සලසා දී ඇත.

වැවතැන්න - වූඩ්සයිඩ්







වැවතැන්න කඳවුරු භූමිය, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයෙහි මැදමහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති වූඩ්සයිඩ් රාජ්‍ය වතුයායෙහි පිහිටා ඇති අතර මහනුවර නගරයේ සිට කිලෝමීටර 37.9ක දුරින් පිහිටා ඇත. මෙම සුන්දර කඳවුරු භූමියවෙත යන මාවත තරමක් දුෂ්කර වුව ද එය ඉතා සුන්දර අත්දැකීම් බහුල ගමනකි. මහනුවර සිට වැවතැන්න දක්වා යන අතරමඟදී විස්මිත සහ ලෝක ප්‍රසිද්ධ වික්ටෝරියා වේල්ල (ඩෑම්) හමුවීම ද තවත් අපූර්වත්වයකි.

සම්බන්ධීකරණ තොරතුරු

සම්බන්ධීකරණ නිලධාරි	: අමිල ජයවර්ධන මහතා
සම්බන්ධීකරණ මධ්‍යස්ථානය	: ප්‍රාදේශීය කාර්යාලය
ලිපිනය	: ප්‍රාදේශීය කාර්යාලය, ගල්පිහිල්ල, පන්විල.
දුරකථන අංකය	: 081-5634903
ෆැක්ස් අංකය	: 081-5634902
විද්‍යුත් තැපෑල	: regionalofficegp@gmail.com

2021 වර්ෂය තුළ රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය වන වතුයායන්හි තත්ත්වය

2021 වර්ෂය ආරම්භයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි කළමනාකරණය යටතේ වතු 17 ක් තිබූ අතර ඉන් වතු 16ක් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති අතර, වලහන්දුව වතුයාය ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

වගුව 01- වතුයායන්හි විස්තර

අංකය	වතුයායෙහි නම	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
1	අලකොළ	මහනුවර	පන්විල	819.86
2	කොටගහ	මහනුවර	මැදදුම්බර	1,059.81
3	ගල්පිහිල්ල	මහනුවර	පන්විල/කුණ්ඩසාලේ	761.24
4	ගෝමර	මහනුවර	පන්විල	731.13
5	හාගල	මහනුවර	පන්විල	449.49
6	හෙයාපාර්ක්	මහනුවර	උඩුකුඹුර	976.75
7	හූන්නස්ගිරිය	මාතලේ	උකුවෙල	739.72
8	කැලෑබොක්ක	මහනුවර	පන්විල	1,370.36
9	කුඩාඔය	මාතලේ	රත්තොට	36.00
10	මිඩ්ලන්ඩ්ස්	මාතලේ	රත්තොට	1,221.31
11	නිකොළොය	මාතලේ	රත්තොට	332.41
12	ඔපල්ගල	මාතලේ	මැදදුම්බර	723.10
13	රංගල	මහනුවර	මැදදුම්බර	630.60
14	වෛතලාව	මහනුවර	මැදදුම්බර	551.05
15	විහාරගල	බදුල්ල	හල්දුම්මුල්ල	41.90
16	වුඩ්සයිඩ්	මහනුවර	මැදදුම්බර	472.75
17	වලහන්දුව	ගාල්ල	අක්මීමණ	96.22
	මුළු එකතුව			**11,013.70**

වගුව 02 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිල දී ගෙන ඇති වතුයායන්

අංකය	වතුයාය	මිල දී ගත් දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
1	හපුගස්තැන්න	1/1/1972	1,709.31
2	අළුපොළ	1/1/1972	1,228.74
3	ගලබොඩ	1/1/1972	376.92
4	හල්ගොල්ල	1/1/1972	1,006.88
5	රාස්සගල	1/1/1972	776.49
6	විකිලිය	1/1/1972	805.67
7	තිස්පනේ	1/1/1972	384.62
8	මැද්දේකන්ද	1/1/1972	676.11
9	සොගම	1/1/1972	476.11
10	මතුරට	15/05/1975	278.54
11	ඔඩුවෙල	1/6/1973	659.51
12	අයිස්ලැබ්	26/11/1973	382.59
13	වෙදමුල්ල	1/9/1973	484.62
14	රම්බොඩ	1/9/1973	765.18
15	ග්‍රේට්වැලි	1/1/1974	320.24
16	දකුණු මැදඋම්බර	1/2/1974	505.26
17	කැරොලිනා	1/7/1974	1,063.56
18	ගල්ලේබොද්ද	1/7/1974	752.63
19	ගෙතන්ටි	1/7/1974	203.24
20	සෙනට් හේලියර්	1/7/1974	172.87
21	රොහැම්ප්ටන්	15/3/1974	100.61
22	නන්පේරියල්	11/4/1974	203.64
23	උඩපොළ	27/5/1975	278.54
24	ඩෙල්කිත්	19/5/1975	1,223.38
25	ඇල්පිටිය	1/6/1975	785.02
26	ගලහ-සිලික් ප්‍රොජෙක්ට්	1/7/1975	694.33
27	හොටිවිල්	1/7/1975	412.15
28	කැම්පියන්	1/7/1975	848.99
29	ඇහැලියගොඩ	1/8/1975	410.93
30	සපුමල්කන්ද	1/8/1975	646.96
31	දියදාව		280.57
එකතුව			**18,914.21**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් තම ප්‍රාග්ධනය යොදවමින් ඉහත සඳහන් වතුයායන් මිලදී ගෙන ඇත. එම සියළුම වතුයායන් 1992 වතු පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ වැවිලි සමාගම්වල කළමනාකරණයට පත් වී ඇත. එබැවින් එම කිසිදු දේපලකින් අප සංස්ථාවට කිසිදු ආදයමක් නොලැබේ.

වගුව 03 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ගැසට්පත්‍ර මඟින් ලැබුණු ඉඩම්

ගැසට් අංකය	දිනය	ලැබුණු ආකාරය	වතුයායන් ගණන		නාමික වටිනාකම
			ප්‍රාදේශීය වැවිලි සමාගම්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	
150/12	7/24/1981	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	38	0	නැත
181/12	2/27/1989		55	25	නැත
815/10	4/21/1994		122	1	123
195/6	5/31/1982		6	8	123
569/14	8/2/1989		3	0	123
571/14	8/14/1989		1	0	123
206/15	8/20/1982		0	1	123
230/12	2/2/1983		1	0	123
937/2	8/19/1996		8	0	123
157/13	4/3/1975	රජය	5	0	123
439/18	2/6/1987		0	1	123
මුළු එකතුව			**239**	**36**	

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් සහ රජයේ විවිධ ආයතනවලින් වතු වල අයිතිය පවරා ඇත. එම පැවරීම් ඉහත සඳහන් ගැසට් පත්‍ර මඟින් සිදු කර ඇති අතර ඒ අනුව ලැබී ඇති වතු ප්‍රමාණය 275 කි.

වගුව 04- රජයේ විවිධ ආයතන හරහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ලැබුණු ඉඩම්

වතුයාය	ලැබුණු ආකාරය	ලැබුණු දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
හිග්ගොඩ	ඉඩම් කොමසාරිස්	1/10/1960	319.81
රදෙල්ල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	633.60
යටවත්ත	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	522.67
නෙලිඵල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	337.65
පල්ලේකැලේ	ඉඩම් කොමසාරිස්	1/1/1968	1270.04
මුළු එකතුව			**3,083.77**

ඉහත සඳහන් රජය සතුව තිබූ වතුයායන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 වර්ෂයේ දී පිහිටුවීමත් සමඟ සංස්ථාවට පවරා ඇත.ශ්‍රී ලංකා රාජ්‍ය සංස්ථාව විසින් තම ප්‍රාග්ධනය යොදවා වැවිලි කටයුතු සිදුකර ඇත.

වතුයායන්හි භූමි පරිභෝජනය 2021

වගුව 05- වතුයායන්හි භූමි පරිභෝජනය 2021

හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව -2021


වතුයාය	තේ වගා කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)					රබර් (හෙක්ටයාර)		සුළු අපනයන බෝග (හෙක්ටයාර)	දැව වගාව (හෙක්ටයාර)	වෙනත් (හෙක්ටයාර)	මුළු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)
	ආදායම සහිත තේ		කොන්ත්‍රාත් පදනම් මත දළු තේ	තේ නවාන්	නැවත වගාව	පැරණි රබර් වගාව	රබර් නැවත වගාව		ඉන්ධන දැව		
	ඇට තේ	රිකිළි තේ	ඇට තේ								
අලකොළ	155.75	114.95	124.50	1.00	13.00	-	-	68.60	76.38	265.68	**819.86**
කොටගහ	264.46	34.42	141.31	0.40	3.00	-	-	60.69	24.14	531.39	**1,059.81**
ගල්පිල්ල	5.00	165.01	37.31	2.21	7.04	-	-	32.64	70.21	441.82	**761.24**
ගෝමර	96.85	116.73	136.61	-	9.00	-	-	74.80	53.30	243.84	**731.13**
හාගල	77.78	101.80	84.66	0.42	7.00	-	-	1.00	89.62	87.21	**449.49**
හෙයාර්පාර්ක්	164.50	-	183.50			-	-	60.00	-	568.75	**976.75**
හුන්නස්ගිරි	153.14	37.78	34.21	0.60	2.00	-	-	74.77	7.00	430.22	**739.72**
කැලැබොක්ක	112.22	278.24	282.41	1.21	17.50	-	-	534.94	15.00	128.84	**1,370.36**
කුඩා ඔය	-	-	36.00	-	-	-	-	-	-	-	**36.00**
මීඩිලන්ඩ්	104.42	117.41	57.17	1.34	10.00	-	-	271.79	218.84	440.34	**1,221.31**
නිකොළොය	-	47.14	2.43		-	-	-	58.89	18.00	205.95	**332.41**
ඔපල්ගල	36.10	48.90	13.00	1.80	-	53.00	-	170.50	68.00	331.80	**723.10**
රංගල	124.10	85.44	112.70	2.00	5.00	-	-	11.50	152.52	137.34	**630.60**
වෛතලාව	39.20	34.00	74.69		-	-	-	62.06	47.39	293.71	**551.05**
වලහන්දුව	0.30		-	-	4.00	62.56	-	4.00	-	25.36	**96.22**
විහාරගල	0.81	41.09	-	-		-	-	-	-	-	**41.90**
වුඩ්සයිඩ්	-	-	203.31	0.20	5.00	-	-	42.69	38.10	183.45	**472.75**
එකතුව	**1,334.63**	**1,222.91**	**1,523.81**	**11.18**	**82.54**	**115.56**	**-**	**1,528.87**	**878.50**	**4,315.70**	**11,013.70**

වගුව 06- වතුයාන්හි ප්‍රධාන ආදායම් බෝගය වන තේ හා රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමග සංසන්දනාත්මකව


වතුයාය	තේ -අමු දළු (කිලෝ ග්‍රෑම්)									
	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
අලකොළ	952,633	880,458	769,499	787,217	705,364	759,745	734,923	617,413	755,844	812,281
කොටගහ	370,453	258,308	194,663	216,383	170,940	205,002	293,452	253,262	303,817	298,549
ගල්පීල්ල	879,545	880,379	665,646	690,856	675,717	775,779	790,235	681,020	833,568	897,867
ගෝමර	566,360	574,639	486,583	547,711	667,328	764,337	743,270	706,865	849,230	920,770
හාඟල	843,579	774,142	682,702	682,097	429,360	482,980	547,672	412,474	578,153	586,514
හෙයාර්පාර්ක්	399,609	463,485	375,497	298,837	229,330	252,911	298,088	252,867	362,826	349,541
හුන්නස්ගිරිය		520,190	431,449	578,320	515,374	528,226	496,959	487,032	544,822	556,800
කැලැබොක්ක	2,006,814	1,762,933	1,331,815	1,608,769	1,373,408	1,382,689	1,468,809	1,435,669	1,780,625	1,911,748
කුඩාඔය	-	-	-	-	-	-	-	2,581	18,791	20,558
මීඩිලන්ඩ්	669,558	730,241	395,511	586,442	438,614	503,015	586,207	494,211	520,382	518,951
නිකොළොය****			458	1,122	1,550	2,979	159,993	138,379	191,445	187,163
ඔපල්ගල	369,158	430,719	297,287	301,755	247,751	305,494	354,023	263,246	399,514	347,170
රංගල	739,211	658,274	521,922	678,266	604,332	492,346	606,262	579,595	662,545	641,661
වෛතලාව***							228,362	157,356	211,812	249,160
විහාරගල	-	-	-	-	-	-	-	9,267	20,116	25,471
වුඩ්සයිඩ්**							22,153	44,463	68,485	60,799
එකතුව	**7,796,920**	**7,933,768**	**6,153,032**	**6,977,775**	**6,059,068**	**6,455,503**	**7,330,409**	**6,535,701**	**8,101,974**	**8,385,002**

වතුයාය	රබර් - ලේටෙක්ස් (කිලෝ ග්‍රෑම්)									
	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
වලහන්දුව	39,218	44,861	40,140	36,809	37,522	42,470	33,395	28,122	29,660	19,063

****	නිකොළොය රාජ්‍ය වතුයාය 2010-2013 සිට මීඩිලන්ඩ්ස් සමග ඒකාබද්ධ කෙරිණි
***	වෛතලාව රාජ්‍ය වතුයාය 2008-2017 සිට මරුති සමාගම විසින් කළමනාකරණය කෙරේ
**	2018 වර්ෂයට පෙර, වුඩ්සයිඩ් වතුයාය පිටතට පවරා දී තිබුණි
*	රබර් කිරිවල DRC අගය කිලෝග්‍රෑම් වලට පරිවර්තනය කර ඇත (Dry Rubber Content)



රූපය 03 – අමු තේ දළු අස්වැන්න පසුගිය වසර 10ක් සමග සංසන්දනාත්මක




රූපය 04 - රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමග සංසන්දනාත්මකව


වගුව 07 - හෙක්ටයාරයකට ලබාගත් අස්වැන්න අමු තේ දළු හා රබර් (ලේටෙක්ස්) ප්‍රමාණය 2012-2021

වතුයාය	අමු තේ දළු ප්‍රමාණය හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්									
	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
අලකොළ	2,856	2,660	2,321	2,293	2,121	2,479	2,367	2,032	2,513	2,692
කොටගඟ	1,316	1,400	1,060	860	819	935	930	809	1,028	922
ගල්පිහිල්ල	4,009	3,819	2,926	2,981	2,916	3,656	3,901	3,362	4,183	5,257
ගෝමර	3,474	3,363	3,121	3,363	3,084	3,451	3,139	3,027	3,677	4,359
හාගල	3,595	3,223	2,772	2,716	2,447	2,781	2,883	2,241	3,141	3,170
හෙයාපාර්ක්	1,274	1,633	1,274	995	674	795	1,260	1,102	1,491	1,506
හුන්නස්ගිරිය	3,321	2,828	2,181	2,744	2,749	2,823	2,599	2,548	2,844	2,900
කැලෑබොක්ක	3,479	3,079	2,353	2,828	2,888	2,777	2,651	2,553	3,617	3,986
කුඩාඔය	-	-	-	-	-	-	-	70	488	571
මීඩ්ලන්ඩ්	2,498	2,460	2,084	2,167	1,995	2,293	2,585	2,204	2,334	2,321
නිකොළොය	-		1,772	1,702	2,544	2,884	3,218	2,860	3,715	3,901
ඔපල්ගල	3,619	3,972	2,944	2,814	2,309	2,940	4,013	2,999	4,317	4,021
රංගල	3,772	3,256	2,553	3,247	2,916	2,316	2,581	2,660	2,723	2,869
වෛතලාව	-	-	-	-	-	-	2,688	2,093	2,894	3,132
විහාරගල	-	-	-	-	-	-	-	223	480	608
සාමාන්‍ය	**3,042**	**2,828**	**2,298**	**2,433**	**2,386**	**2,474**	**2,537**	**2,282**	**2,768**	**2,949**

වතුයාය	රබර් (ලේටෙක්ස්) - හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්									
	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
වලහන්දුව	603	690	618	566	577	649	510	430	474	272



රූපය 05: හෙක්ටයාර එකකට අමු දළු අස්වැන්න (2012-2021)



රූපය 06: හෙක්ටයාර එකකට රබර් අස්වැන්න (2012-2021)

වගුව - 08 – බටහිර මැදරට කලාපයේ 2021 වසරේ වාර්ෂික වර්ෂාපතනය

බටහිර මැද කලාපයේ වාර්ෂික වර්ෂාපතනය - 2021	
වතුයාය	වර්ෂාපතනය (මි.මී.)
අලකොළ	2364
කොටගහ	2790
ගල්පීල්ල	3810
ගෝමර	2816
හාගල	2805
හෙයාර්පාර්ක්	3551
හුන්නස්ගිරිය	1727
කැලෑබොක්ක	3934
කුඩාඔය	2483
මිඩ්ලන්ඩ්	3106
නිකොළොය	2761
ඔපල්ගල	2432
රංගල	5184
වෛතලාව	2231

ඉහත විස්තර වලට අනුව, 2020 වර්ෂය පුරාවටම බටහිර මැද රට කලාපයට හොඳ වර්ෂාපතනයක් ලැබී තිබුණි.

පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය

වගුව - 09 – පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය


වර්ෂය	භාවිතා කළ පොහොර ප්‍රමාණය (මෙ.ටොන්)	පොහොර පිරිවැය (රු.)	භාවිත කළ වල් නාශක ප්‍රමාණය (ලීටර/කි.ග්‍රෑ)	වල් නාශක පිරිවැය (රු.)
2019	215	4,794,653	3207 ලීටර	14,431,500
2020	350	8,548,750	5156 ලීටර	22,740,604
2021	552	15,924,100	3844 ලීටර	10,222,571
			692 කි.ග්‍රෑම්	2,698,800

2021 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් නිෂ්පාදනය කරනු ලැබූ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 89.74 වූ අතර බටහිර මධ්‍යම කලාපයේ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 78.28ක් විය. ඒ අනුව, 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ විකුණුම් අනුපාතය, බටහිර මධ්‍යම කලාපයේ විකුණුම් අනුපාතයට වඩා රුපියල් 11.46 කින් වැඩි අගයක පවත්වා ගෙන ඇත.

පසුගිය වසර 03ක සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන වියදම

වගුව - 10– පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක සංඝන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

වර්ෂය	අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය (රුපියල්)					
	දළු නෙලීම	ක්ෂේත්‍ර වැඩ	පොහොර	වල්නාශක	පොදු වියදම්	එකතුව
2019	45.34	18.34	2.15	12.34	44.19	122.36
2020	45.47	15.44	2.18	9.96	39.18	112.23
2021	47.94	12.61	5.02	6.00	32.78	104.35



රූපය 07 – පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක සංඝන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

ඒ අනුව අමු දළු කිලෝග්‍රෑම් එකක සමස්ත නිෂ්පාදන වියදමෙන් පොහොර පිරිවැය ඉතා අඩුය. නිෂ්පාදන පිරිවැයේ විශාල පංගුවක් ගන්නා අමු දළු නෙලීමේ සහ පොදු වියදම් කළමනාකරණය නොකර පොහොර පිරිවැය පාලනය කර ඇති බැවින් අපේක්ෂිත අස්වැන්න අඩු වී ඇත. පාලන අධිකාරිය සහ කළමනාකාරීත්වය මේ තත්ත්වය වටහා නොගැනීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවතින දිගුකාලීන පාඩුවට එක් හේතුවක් වී ඇත.


තේ නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව දැනට තේ නිෂ්පාදන කර්මාන්තශාලා දහයක් ඇති අතර එයින් සී.ටී.සී තේ කර්මාන්තශාලා තුනක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී.කැලැබොක්ක,මිඩ්ලන්ඩ්ස් සහ රංගල තේ කර්මාන්තශාලා තුන මගින් අපගේ වතුයායන් කිහිපයකින් ලබා ගන්නා අමු දළුවලින් තේ නිෂ්පාදනය කරයි. පහත වගුවෙන් එම කර්මාන්තශාලා මඟින් සිදුකරන ලද තේ නිෂ්පාදනය නිරූපනය කරයි.


වගුව 11 නිමි තේ නිෂ්පාදනය 2020-2021

කර්මාන්තශාලාව	අමු තේ දළු (කිලෝ ග්‍රෑම්)		නිමි තේ (කිලෝ ග්‍රෑම්)		නිපදවූ නිමි තේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස		නිෂ්පාදන පිරිවැය - කිලෝ ග්‍රෑම් එකකට රුපියල්		ශුද්ධ විකුණුම් සාමාන්‍ය - කිලෝ ග්‍රෑම් එකකට රුපියල්	
	2020	2021	2020	2021	2020	2021	2020	2021	2020	2021
කැලැබොක්ක	1,742,062	1,765,256	382,930	405,796	21.98	22.99	655.26	723.99	453.69	444.21
මිඩ්ලන්ඩ්	506,119	514,909	111,910	112,300	22.11	21.81	610.65	666.40	409.48	390.51
රංගල	642,059	604,650	142,483	146,498	22.19	24.23	604.41	635.23	469.82	435.15
එකතුව	**2,890,240**	**2,884,815**	**637,323**	**664,594**						





රූපය 08 – නිමි තේ නිෂ්පාදනය



රූපය 09 – කර්මාන්ත ශාලාවන්ට අදාල අමු තේ දළු ප්‍රමාණය නිෂ්පාදනය

වගුව 12- කර්මාන්තශාලා පිළිබඳ විස්තර

කර්මාන්තශාලාව	පිහිටි දිස්ත්‍රික්කය	නිෂ්පාදනය කරන තේ වර්ගය	පෙරීමේ ධාරිතාවය (කිලෝ ග්‍රෑම්)	වර්තමාන තත්ත්වය
කොටගහ	මහනුවර	ඔතඩොක්ස්	1290	ක්‍රිය
ගෝමර	මහනුවර	ඔතඩොක්ස්	8000 (සමස්ත ධාරිතාවය)	ක්‍රිය
හාගල	මහනුවර	ඔතඩොක්ස්	1419	ක්‍රිය
හූන්නස්ගිරිය	මාතලේ	සීටීසී	1720	ක්‍රිය
කැලෑබොක්ක	මහනුවර	සීටීසී	12000(සමස්ත ධාරිතාවය)	ක්‍රියාත්මකයි
මිඩිලන්ඩ්	මාතලේ	සීටීසී	1400	ක්‍රියාත්මකයි
දන්කන්ද	මාතලේ	ඔතඩොක්ස්	860	ක්‍රිය
නිකොළොය	මාතලේ	ඔතඩොක්ස්	645	ක්‍රිය
රංගල	මහනුවර	සීටීසී	1500	ක්‍රියාත්මකයි

අපගේ කර්මාන්තශාලාවල නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ මට්ටමක පැවතීම සහ අපගේ නිෂ්පාදන අලෙවි වන ඉතා අඩු මිල යන හේතු මත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබේ.

මනා පළපුරුදු සහ පුහුණු කළමනාකාරීත්වයක් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලයක් සිටින ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන අමු දළු සහ තේ සඳහා මැදරට සාමාන්‍ය මිලට වඩා අඩු මිලක් ලැබීම කණගාටුදායක තත්ත්වයකි.

මිඩිලන්ඩිස් තේ කර්මාන්තශාලාව මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි එකම සී.ටී.සී තේ කර්මාන්තශාලාවයි. කැලෑබොක්ක සහ රංගල තේ කර්මාන්තශාලා මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

මීඩ්ලන්ඩ්ස් තේ කර්මාන්තශාලාව



කැලෑබොක්ක තේ කර්මාන්තශාලාව



රංගල තේ කර්මාන්ත ශාලාව



නවීකරණය කිරීමට නියමිත ගොමර කර්මාන්ත ශාලාව











සංස්ථා තේ

දේශීය වෙළඳපොළට සංස්ථා තේ ලබා දීම තුළින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ මිල, තේ වෙන්දේසිය තුළ උච්චාවචනය වීමෙන් ඇතිවන තාවකාලික මූල්‍ය අර්බුදයන්ට සහනයක් ලබා දීම පිණිස 2016 වර්ෂයේ නොවැම්බර් මස "සංස්ථා තේ" නිෂ්පාදනය ආරම්භ කරන ලදී.



වගුව 13: සංස්ථා තේ අලෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2019-2021)


මාසය	අලෙවි ක තේ ප්‍රමාණය (කිලෝග්‍රෑම්)		
	2019	2020	2021
ජනවාරි	2,602	2,788	5,234
පෙබරවාරි	4,636	2,675	3,695
මාර්තු	2,789	3,275	6,103
අප්‍රේල්	939	3,709	2,619
මැයි	2,475	2,878	7,592
ජූනි	1,134	2,921	4,420
ජූලි	3,270	5,587	5,436
අගෝස්තු	2,683	4,472	3,988
සැප්තැම්බර්	3,159	2,617	5,242
ඔක්තෝම්බර්	3,043	4,859	5,227
නොවැම්බර්	4,313	3,846	4,089
දෙසැම්බර්	3,032	5,750	6,685
එකතුව	**34,075**	**45,375**	**60,330**



රූපය 10: සංස්ථා තේ අලෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2019-2021)

වගුව 14 සංස්ථා තේ අළෙවි ආදායම (2019-2021)

මාසය	සංස්ථා තේ අළෙවි ආදායම (රුපියල්)		
	2019	2020	2021
ජනවාරි	1,948,166	1,543,704	3,869,097
පෙබරවාරි	3,210,598	1,975,437	2,712,282
මාර්තු	2,117,157	1,352,505	4,403,836
අප්‍රේල්	747,593	1,492,498	1,937,444
මැයි	1,661,434	2,158,450	5,383,608
ජූනි	939,405	2,249,149	3,144,305
ජූලි	2,490,901	4,081,756	3,928,085
අගෝස්තු	2,080,813	3,294,264	2,916,045
සැප්තැම්බර්	2,261,770	2,008,403	3,819,845
ඔක්තෝම්බර්	2,139,277	3,561,445	3,795,002
නොවැම්බර්	3,112,667	2,833,044	3,212,859
දෙසැම්බර්	2,345,364	4,267,934	5,097,536
එකතුව	**25,055,143**	**30,818,588**	**44,219,943**




රූපය 11: සංස්ථා තේ අළෙවි ආදායම මාසිකව (2019-2021)

රබර් නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පවතිනුයේ එක් රබර් වතුයායක් පමණි. එය ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දුව ප්‍රදේශයේ පිහිටා ඇත. වර්ෂ තුනක් සඳහා මුළු රබර් කිරි නිෂ්පාදනය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 15- වර්ෂ තුනක් සඳහා මුළු රබර් නිෂ්පාදනය

වර්ෂය	ලේටෙක්ස් (කිලෝ ග්‍රෑම්)	මුළු වියදම (කිලෝ ග්‍රෑම්)	ලාභය / (අලාභය) (රු.ශත)	ශුද්ධ විකිණුම් අගය (රු.ශත)	නිෂ්පාදන පිරිවැය කිලෝ ග්‍රෑම් එකකට (රු.ශත)	කිලෝ ග්‍රෑමයකට ලාභය / (අලාභය) (රු.ශත)
2021	19,063	13,117,780.90	(5,286,725.15)	410.80	688.13	(277.33)
2020	29,660	13,494,113.60	(5,151,942.00)	281.26	454.96	(173.70)
2019	28,122	14,686,995.72	(7,806,787.00)	300.00	522.26	(222.26)



රූපය 12: රබර් නිෂ්පාදනය (2019-2021)

භාණ්ඩාගාර ප්‍රතිපාදන

මෙම වසරේදි පසුගිය වසර මෙන් වැටුප් හා එදිනෙදා වියදම් කළමනාකරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් මුල්‍ය ප්‍රතිපාදන ලබා ගෙන නොමැත.

*වගුව - 16– ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත මහා **භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් පිලිබඳ සාරාංශය***

අයිතමය	2017	2018	2019	2020	2021
මෙහෙයුම් වියදම් (කම්කරු වේතන සහ කාර්ය මණ්ඩල වැටුප්)	130	68	222	-	-
ව්‍යවස්ථාපිත ගෙවීම් (සේවක අර්ථ සාධක අරමුදල /සේවක භාරකාර අරමුදල /පාරිතෝෂික)	134	90	-	-	-
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සංවර්ධන කටයුතු -කර්මාන්ත ශාලා නවීකරණ කිරීම සඳහා	-	-	-	-	14
මුළු ලැබීම් (රුපියල් මිලියන)	**264**	**158**	**222**	**-**	**14**

2021වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සහ 2021 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පහත පරිදි නිරූපණය වේ


වගුව 17 – 2021 -2020 වර්ෂයන් සඳහා සංසන්දනාත්මක මූල්‍ය කාර්ය සාධනය -

විස්තරය	2021 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2021	කාර්ය සාධනය %	2020 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2020	කාර්ය සාධනය %
සැකසූ තේ - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	432.60	562.56	130.04	490.68	492.88	100.45
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.)	445.04	464.45	104.36	452.48	432.14	95.51
රබර් - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	239.50	688.13	287.32	312.85	428.06	136.83
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.)	300.00	410.80	136.93	300.00	277.73	92.58
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - සැකසූ තේ (කිග්‍රෑ)	2,250,940	1,803,223	80.11	1,980,891	1,728,728	87.27
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - රබර් (කිග්‍රෑ)	43,500	19,063	43.82	43,500	29,660	68.18
ආදායම්	රු:	රු:	රු:	රු:	රු:	රු:
සැකසූ තේ සහ තේ දළු	1,001,747,364	837,510,629	83.60	896,312,171	758,598,254	84.64
රබර් -ලේටෙක්ස්	13,050,000	7,831,089	60.01	13,050,000	8,237,326	63.12
මුළු ආදායම	**1,014,797,364**	**845,341,718**	**83.30**	**909,362,170.68**	**766,835,579.56**	**84.33**
අඩු කළා: නිෂ්පාදන පිරිවැය						
සැකසූ තේ සහ තේ දළු	973,747,394	1,014,421,407	104.18	971,988,808	852,056,592	87.66
රබර්	10,418,299	13,117,781	125.91	13,608,793	12,696,168	93.29
මුළු නිෂ්පාදන පිරිවැය	**984,165,693**	**1,027,539,188**	**104.41**	**985,597,601**	**864,752,760**	**87.74**
දළ ලාභය/(පාඩුව) - වතුයාය	**30,631,671**	**(182,197,470)**	**(594.80)**	**(76,235,430)**	**(97,917,181)**	**128.44**
එක් කළා: වෙනත් ආදායම්						
වෙනත් ආදායම් - වතුයාය	558,984,506	159,982,251	28.62	447,155,724	108,706,579	24.31
වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය	90,415,963	36,595,417	40.47	59,930,000	49,771,702	83.05
මුළු වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	**649,400,469**	**196,577,668**	**30.27**	**507,085,724**	**158,478,281**	**31.25**
මුළු ආදායම	**680,032,140**	**14,380,198**	**2.11**	**430,850,294**	**60,561,100**	**14.06**
අඩු කළා: වියදම්						
පරිපාලන වියදම් - වතුයාය	91,764,130	94,248,387	102.71	88,602,646	81,860,486	92.39
-ප්‍රධාන කාර්යාලය	47,685,023	58,132,610	121.91	38,905,198	40,726,247	104.68
පුද්ගල වියදම් - ප්‍රධාන කාර්යාලය	57,230,921	52,489,375	91.72	60,421,500	58,338,254	96.55
මූල්‍ය ගාස්තු - වතුයාය	8,113,140	6,458,818	79.61	7,949,744	5,597,184	70.41
-ප්‍රධාන කාර්යාලය	29,743,333	34,248,604	115.15	23,220,000	23,666,011	101.92
මුළු වියදම	**234,536,547**	**245,577,794**	**104.71**	**219,099,087**	**210,188,182**	**95.93**
ලාභය/(පාඩුව) - වතු සහ ප්‍රධාන කාර්යාලය	**445,495,593**	**(231,197,596)**	**(51.90)**	**211,751,207**	**(149,627,081)**	**(70.66)**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පසුගිය වසර 05 තුළ ලාභ/අලාභය

වගුව 18 – ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පසුගිය වසර 05 තුළ ලාභ /අලාභය

වර්ෂය	ලාභ/අලාභ
2016	(150,916,820)
2017	(94,932,600)
2018	(147,798,507)
2019	(329,884,391)
2020	(149,627,081)
2021	(231,197,596)



රූපය- 13– පසුගිය වසර 5 මත පදනම්ව ලාභ හා අලාභ සංසන්දනය කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මානව සම්පත්

2021 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකරණ, අධීක්ෂණ සහ නිෂ්පාදන කාර්ය මණ්ඩලය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව - 19– රාජ්‍ය වැවිලි සංස්ථාවේ සතු මානව සම්පත්

වතුයාය	වතු අධිකාරිවරුන් ගණන	සහකාර වතු අධිකාරිවරුන් ගණන	කාර්යය මණ්ඩලය		කම්කරුවන්		එකතුව
			ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	අනියම්	
අලකොළ	1	2	13	-	264	0	264
කොටගඟ	1	1	13	-	197	0	197
ගල්පිල්ල	1	2	19	-	182	8	190
ගෝමර	1	2	17	2	246	4	250
හාගල	1	1	11	.	157	0	157
හෙයාර්පාර්ක්	1	1	11	1	137	3	140
හුන්නස්ගිරිය	1	2	16	-	191	19	210
කැලෑබොක්ක	1	4	34	2	730	58	788
මිඩ්ලන්ඩ්	1	2	24	1	305	13	318
නිකොළොය	1	-	6	-	70	0	70
ඔපල්ගල	1	2	10	1	67	0	67
රංගල	1	1	22	1	195	55	250
වලහන්දුව	1	-	3	1	35	17	52
වෙතලාව	1	-	3	-	57	39	96
වුඩ්සයිඩ්	1	-	2	1	30	0	30
විහාරගල					39	2	41
ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාලය	-	-	58	2	3	-	63
එකතුව	**15**	**20**	**262**	**12**	**2905**	**218**	**3183**

2020 වසර අවසන් වන විට ප්‍රධාන කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 63ක් වූ අතර, 2021 වර්ෂයේදීද එම අගය 63ක් ලෙස සමාන සංඛ්‍යාවක් වාර්තා කර ඇත. රුපියල් මිලියන 48.1ක් 2020 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2021 වර්ෂයේදී රුපියල් මිලියන 43.4 ක් වැය කර ඇත. 2020 ට සාපේක්ෂව 2021 දී රු.මිලියන 5.1 ක් එනම් 10.52% කින් අඩුවී ඇත.2020 වසර අවසන් වන විට වතු අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් ඇතුළු කාර්යාල කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 249ක් වූ අතර 2021 වර්ෂයේදී එය 297ක් ලෙස වැඩි අගයක් වාර්තා කර ඇත. රුපියල් මිලියන 114.72ක් 2020 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2021 වර්ෂයේදී රු. මිලියන 121.32ක් වැයකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12ක් හා විගණන කමිටු රැස්වීම් 03ක් පවත්වා ඇත.

වගුව - 20 – අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටු රැස්වීම්

අංකය	රැස්වීමේ නම	රැස්වීමේ දිනය	රැස්වීමේ අංකය
1	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	2021.01.27	11
		2021.02.25	12
		2021.03.26	13
		2021.04.29	14
		2021.05.31	15
		2021.06.30	16
		2021.07.27	17
		2021.08.26	18
		2021.09.27	19
		2021.10.26	20
		2021.11.30	21
		2021.12.29	22
2	විගණන කමිටු රැස්වීම්	2021.03.30	1
		2021.09.09	2
		2021.12.23	3

2021 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශනයට රජයේ විගණකාධිපතිවරයා අභිතකර මතයක් ලබාදී ඇත. දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අයහපත් අදහස් ලැබී ඇති අතර, එය නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ශ්‍රී ලංකා රුපියල්වලින්

දෙසැම්බර් 31 වන දිනට	**සටහන්**	**2021**	**2020**
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	8	957,032,724	756,246,749
ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය	9	3,356,355,765	3,507,753,636
ආයෝජන දේපළ	10	1,611,520,641	1,611,520,641
ස්ථාවර තැන්පතු		9,425,987	9,175,806
විලම්බිත වත්කම්	26	438,730	781,064
මුළු ජංගම නොවන වත්කම්		**5,934,773,847**	**5,885,477,895**
ජංගම වත්කම්			
තොග	11	63,861,196	74,595,535
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	12	248,384,533	184,025,544
මුදල් හා මුදල් හා සමාන දෑ	13	41,794,882	45,886,973
මුළු ජංගම වත්කම්		**354,040,611**	**304,508,052**
මුළු වත්කම්		**6,288,814,458**	**6,189,985,947**
ස්කන්ධය හා වගකීම්			
ප්‍රාග්ධන හා සංචිත			
දායකත්ව ප්‍රාග්ධනය	14	5,893,852,850	5,879,852,850
රඳවාගත් ආදායම්		(2,127,008,077)	(1,725,362,785)
මුළු ස්කන්ධය		**3,766,844,772**	**4,154,490,065**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ වගකීම්	15	610,141,017	469,291,620
මුළු ජංගම නොවන වගකීම්		**610,141,017**	**469,291,620**
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	16	1,640,065,683	1,363,998,504
බැංකු ණය	16.1	100,000,000	100,000,000
බැංකු අයිරාව		171,762,986	102,205,759
මුළු ජංගම වගකීම්		**1,911,828,669**	**1,566,204,263**
මුළු වගකීම්		**2,521,969,686**	**2,035,495,883**
මුළු ස්කන්ධය හා වගකීම්		**6,288,814,458**	**6,189,985,947**

පිටු අංක 5 සිට 19 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බව යටින් අත්සන් කර ඇති අය විසින් සහතික කරනු ලැබේ.

එස්.අයි.එම්. හසන් මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් අනුමත කර අත්සන් කරනු ලැබේ.

ශ්‍රීමාල් විජේසේකර මයා	**වයි.කේ වැගොඩපොළ මයා**	**ඩබ්.ඩබ්.එම්.බී.පී.කඹුරාදෙණිය මයා**
සභාපති/ප්‍රධාන විධායක නිළධාරී	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2022 ජූනි මස 28 වන දින, කොළඹ දීය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව			
ආදායම් ප්‍රකාශය			
ශ්‍රී ලංකා රුපියල්වලින්			
දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වර්ෂය	**සටහන්**	**2021**	**2020**
ආදායම	17	**845,341,718**	**766,835,580**
විකුණුම් පිරිවැය		(1,027,539,188)	(864,752,760)
දළ ලාභය / (අලාභය)		**(182,197,471)**	**(97,917,181)**
වෙනත් ආදායම්	18	194,790,022	156,276,640
පරිපාලන වියදම්	19	(204,870,371)	(180,887,340)
මෙහෙයුම් ලාභය / (අලාභය)		**(192,277,820)**	**(122,527,882)**
මූල්‍ය ආදායම්	18	1,787,646	2,201,642
මූල්‍ය වියදම්	20	(40,707,422)	(29,300,841)
කාල සීමාව සඳහා ලාභය/ (අලාභය).		**(231,197,596)**	**(149,627,081)**

පිටු අංක 5 සිට 19 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි .

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය **ශ්‍රී ලංකා රුපියල් වලින්.**

2021 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා

	ප්‍රාග්ධනය	ඉඩම් දායකත්වය	සමුච්චිත ලාභය/(පාඩුව)	එකතුව
	රු.	රු.	රු.	රු.
2020 ජනවාරි 01 දිනට ශේෂය	3,659,250,925	2,220,601,926	(1,570,849,043)	4,309,003,808
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන	-	-	-	-
වසරෙහි පාඩුව	-	-	(149,627,081)	(149,627,081)
පෙර වසරෙහි ගැළපීම් (සටහන 25)	-	-	(4,886,661)	(4,886,661)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,659,250,925**	**2,220,601,926**	**(1,725,362,785)**	**4,154,490,066**
2021 ජනවාරි 01 දිනට ශේෂය	3,659,250,925	2,220,601,926	(1,725,362,785)	4,154,490,066
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන	14,000,000	-	-	14,000,000
වසරෙහි පාඩුව	-	-	(231,197,596)	(231,197,596)
පෙර වසරෙහි ගැළපීම් (සටහන 25)	-	-	(170,447,696)	(170,447,696)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,673,250,925**	**2,220,601,926**	**(2,127,008,077)**	**3,766,844,772**

පිටු අංක 5 සිට 19 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ .

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල්වලින්

දෙසැම්බර් 31 වන අවසන් වන වර්ෂය සඳහා	සටහන්	2021	2020 (R)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
බදුකරණයට පෙර ශුද්ධ ලාභය /(පාඩුව)		**(231,197,596)**	**(149,627,081)**
ගැළපීම් :			
ජීවවිද්‍යාත්මක වත්කම් ක්ෂයවීම්	8.1	3,035,076	4,019,863
වත්කම් ක්ෂයවීම්	8	9,428,089	8,667,581
විලම්බිත වත්කම් ක්‍රමක්ෂය කිරීම		39,128	-
මූල්‍ය වියදම්	20	40,707,422	27,989,617
මූල්‍ය ආදායම	18	(1,787,646)	(2,201,642)
පාරිතෝෂික වෙන්කිරීම්	15	37,508,004	30,226,545
විගණන ගාස්තු වෙන්කිරීම්		547,019	-
රක්ෂණ වෙන්කිරීම්		954,089	-
රජයේ ප්‍රදාන හා ආධාර	18	(1,575,000)	-
පෙර වර්ෂයේ ගැළපීම්		(175,084,833)	(4,886,661)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර ලාභය		**(317,426,248)**	**(85,811,778)**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්			
තොග (වැඩිවීම්)/ අඩුවීම්		10,734,339	(12,092,894)
වෙළඳ හා වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම්		(64,358,989)	(8,815,799)
ජංගම වගකීම් (වැඩිවීම්)/ අඩුවීම්		392,131,886	72,413,700
මෙහෙයුම්වලින් උත්පාදනය කරන ලද මුදල්		**338,507,236**	**51,505,007**
පාරිතෝෂික ගෙවීම්		(15,461,867)	(7,145,102)
මූල්‍ය පිරිවැය ගෙවීම්	20	(39,107,422)	(26,389,617)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**(33,488,302)**	**(67,841,489)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහයන්			
මූල්‍ය ආදායම්	18	1,787,646	2,201,642
රජයේ ප්‍රදාන හා ආධාර	18	1,575,000	-
භාණ්ඩාගාර ප්‍රදාන ලැබීම්		14,000,000	-
දේපළ, පිරියත හා උපකරණවලට වන එකතුකිරීම්	8	(51,141,051)	(12,522,619)
ජීවවිද්‍යාත්මක වත්කම්වලට වන එකතුකිරීම්	9.2	(6,132,431)	(27,989,617)
බැංකු ණය-මහජන බැංකුව		-	100,000,000
ස්ථාවර තැන්පතුවල ආයෝජන		(250,181)	(312,007)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**(40,161,017)**	**61,377,398**
මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම් /(අඩුවීම්)		**(73,649,318)**	**(6,464,091)**
මුදල් හා මුදල් හා සමාන දෑ හි වෙනස්වීම්			
කාලසීමාව ආරම්භයේදී	13	(56,318,786)	(49,854,694)
වසරෙහි වැඩිවීම/ (අඩුවීම)		(73,649,318)	(6,464,091)
වසර අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ	13	**(129,968,104)**	**(56,318,786)**
වසර අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ (සටහන13)			
අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්			
- ප්‍රධාන කාර්යාලය		40,829,610	43,342,178
- වතුයායන්		965,273	2,544,796
බැංකු අයිරා		(171,762,986)	(102,205,759)
		(129,968,104)	**(56,318,786)**

1. ආයතනික තොරතුරු

සාමාන්‍ය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (සංස්ථාව) යනු 1958 අංක 4 දරන පනත යටතේ 1958 දී සංස්ථාපිත කර ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති රජයේ සංස්ථාවකි. එය කොළඹ 12", මීරානියා වීදියේ, අංක 21 හි පිහිටා ඇත.
සංස්ථාව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරන අතර මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලාත්මක කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

තේ නිෂ්පාදනය සහ සැකසූ නිමි තේ, තේ නිෂ්පාදනය හරහා අලෙවි කිරීම, රබර් කිරි සහ සුළු හෝ අපනයන භෝග (කරාබු නැටි, ගම්මිරිස්, එනසාල්, කුරුඳු ආදිය) විකිණීම සහ සංස්ථාවේ වාණිජ දැව සිටුවීම සහ විකිණීම.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.
සාධාරණ වටිනාකමට අගයන ලද ජීව විද්‍යාත්මක වත්කම් හැර, වෙනත් ඓතිහාසික පිරිවැයක පදනමක් මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3.සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිලිබඳ සාරාංශය

3.1.1 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්රකාශන සකස් කිරීමේදී සංස්ථාව විසින් පහත සඳහන් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනී.

3.1.2 දේපල පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම් සහ සමුච්චිත හායන පාඩු ඇතිනම් ඒවා අඩුකිරීමෙන් පසුවය. එවැනි පිරිවැයක් තුල දේපල, පිරියත හා උපකරණවල ආංශික කොටස් ආදේශ කිරීමේ පිරිවැය සහ හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. දේපල, පිරියත හා උපකරණවල සුවිශේෂී කොටස් අන්තරයක් සහිතව ආදේශ කිරීමට අවශ්‍ය වන්නේ නම්, සංස්ථාව එසේ ආදේශ කරන ලද කොටස හඳුනාගැනීමෙන් තොරව බැහැර කරන අතර, ඊට අදාල ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත, ක්‍රමක්ෂය කළ හැකි නව කොටසක් හඳුනාගැනීමට ලක් කරයි. මේ හා සමානව, යම් ප්‍රධාන පෙලේ විමර්ශනය කිරීමක් සිදුකළහොත්, හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, එහි පිරිවැය, ආදේශකයක් ලෙස එම පිරියත හා උපකරණයෙහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම තුල හඳුනාගැනේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය හටගත් පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශ තුල හඳුනාගැනේ.

3.1.3 ක්ෂය කිරීම

මිලදීගත් දිනයේ සිට බැහැර කරන දිනය දක්වා වර්ෂය තුල අත්පත්කරගත් හා බැහැර කරන ලද දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම් සිදු කෙරේ.
ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය සහ දේපල, පිරියත හා උපකරණවල ක්ෂය කිරීමේ අනුපාත පහත සඳහන් පරිදි වේ:

අයිතමය	ප්‍රයෝජ්‍ය ආයුකාලය	අනුපාතය
ගොඩනැඟිලි	අවුරුදු 20	5%
මෝටර් රථ	අවුරුදු 4	25%
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 8	12.5%
කාර්යාල උපකරණ	අවුරුදු 8	12.5%
යන්ත්‍ර	අවුරුදු 8	12.5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	අවුරුදු 3	33.33%

3.1.4 ජීවවිද්‍යාත්මක වත්කම්

ජීවවිද්‍යාත්මක වත්කම් යම් ජීවී සත්ත්වයෙකුට හෝ පැළෑටියකට අදාල වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41ට අනුව, ජීවවිද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් යම් පොදු ලක්ෂණ කිහිපයක් ඇත, එනම්, (අ) වෙනස් වීමට ඇති හැකියාව (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හැකියාව) (ආ) වෙනස්වීම කළමනාකරණය කරගැනීම (එම ක්‍රියාවලිය සිදුවීම සඳහා අවශ්‍ය තත්ත්වයන් වැඩිදියුණුකිරීමෙන් ජීවවිද්‍යාත්මක පරිවර්තනය වීම සඳහා කළමනාකරණය මගින් පහසුකම් සලසයි. එවැනි කළමනාකරණයක් මගින් කෘෂිකාර්මික කටයුතු වෙනත් කටයුතුවලින් වෙන් කර දක්වයි. උදාහරණයක් ලෙස, කළමනාකරණය නොකරන ලද මූලාශ්‍ර මගින් අස්වැන්න ලබාගැනීම) සහ (ඇ) වෙනස්වීම ගණනය කිරීම (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හෝ එමගින් ඇති වූ වෙනස දෛනික කළමනාකරණ කාර්යයක් ලෙස ගණනය කර, අධීක්ෂණය කෙරේ.)
ජීවවිද්‍යාත්මක වත්කම්, ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (bearer biological assets) සහ පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් (consumable biological assets) ලෙස දෙවැදෑරුම් වේ.

3.1.4.1 ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (Bearer Biological Assets)

පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් හැර අන් වත්කම් ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, සංස්ථාවට අදාළව තේ පඳුරු, රබර් ගස් හා ඕනෑම ක්ෂේත්‍ර වගාවක් වැනි ප්‍රධාන පෙළේ වැවිලි කටයුත්තක් ඊට අයත් විය හැකිය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් ලබා දී ඇති විකල්පය පරිදි හා 2021 වසරෙහි සිට දේපළ, පිරියත හා උපකරණ යටතේ දැක්වෙන පරිදි යම් සමුච්චිත ක්ෂය කිරීමක් හා යම් සමුච්චිත හායන පාඩුවක් අඩු කර ලැබෙන පිරිවැයට මෙහි අගය ඉදිරියට ගෙන යනු ලැබේ.

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

පොල්	අවුරුදු 25	කොකෝවා	අවුරුදු 20
ගම්මිරිස්	අවුරුදු 15	කුරුඳු	අවුරුදු 25
රබර්	අවුරුදු 35	සාදික්කා	අවුරුදු 30
කරාබුනැටි	අවුරුදු 50	ඉහුරු	අවුරුදු 01
කෝපි	අවුරුදු 25	තේ	අවුරුදු 100
පුවක්	අවුරුදු 40		
එනසාල්	අවුරුදු 20		

3.1.4.2 පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම්

කෘෂිකාර්මික නිෂ්පාදිතයක් ලෙස අස්වැන්න ලබාගත හැකි හෝ ජීවවිද්‍යාත්මක වත්කම් ලෙස අලෙවි කළ හැකි වත්කම් පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, ඊට දැව ඇතුළත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදිත වෙළඳපොලට රැගෙන යාම සඳහා අවශ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත අලෙවි පිරිවැය අඩු කර ලැබෙන සාධාරණ වටිනාකමට මෙකී නිෂ්පාදිත අගය කෙරේ. ඇගයීම මත යම් ලාභයක් හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගැනේ.

3.1.4.3 විලම්භීත වත්කම්

කල් තබන ලද වත්කම් වාර්ෂිකව 10%ක අනුපාතයට ක්‍රමක්ෂය කෙරේ.

3.1.5 ආයෝජන දේපල

ප්‍රාග්ධන ඇගයීම සඳහා සහ/හෝ කුලී ආදායම් ඉපැයීම සඳහා තබාගත් දේපල ආයෝජන දේපල තුළ අන්තර්ගත වේ. අදාල ගණුදෙණු පිරිවැය හා ඉන් අනතුරුව යම් දේපලකට එකතු කිරීම, යම් දේපලක් ආදේශ කිරීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් හටගත් පිරිවැය ඇතුලු පිරිවැයට මෙම දේපල මූලික වශයෙන් ගණනය කෙරේ. ඉන්පසුව සිදු කෙරෙන ගණනය කිරීම් ද සමුච්චිත ක්‍රමක්ෂය කිරීමෙන් අඩු කර ලැබෙන පිරිවැයට සිදු කෙරේ.

3.1.6 දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන් (Capital work in progress)

වර්ෂය තුල හට ගත්, එහෙත් ශේෂ පත්‍රය සකස් කරන දිනට ප්‍රාග්ධනීයකරණය නොකරන ලද ප්‍රාග්ධන වියදම්, දැනට සිදු කෙරෙන ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුල ප්‍රාග්ධනීයකරණය කරන ලද සහ භාවිත කළ ප්‍රාග්ධන වත්කම්, දේපල, පිරියත හා උපකරණවලට මාරු කර ඇත.

3.1.7 කල්බදු පහසුකම්

යම් පහසුකම් සැලසීමක් කල්බදු පහසුකමක් හෝ ඊට කල්බදු පහසුකමක් ඇතුළත් වන්නේද යන්න තීරණය කිරීම, එකී පහසුකමේ අන්තර්ගතය මත පදනම් වන අතර, එම පහසුකම් සැලසීම සපුරාලීම, යම් නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කිරීම මත සහ එමගින් වත්කම භාවිත කිරීමට අයිතිය ලබාදෙන්නේද යන්න මත රඳා පවතී.

මූල්‍ය කල්බදු පහසුකම්

වත්කමිහි අයිතියට ආනුශංගික වන, එහෙත් අත්‍යවශ්‍යයෙන් නීතිමය හිමිකම් නොවන සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු අන්දමින් ප්‍රතිපාර්ශ්වයන් වෙත මාරු කරන ගිවිසුම්, මූල්‍ය කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ.සංස්ථාව මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කල්බදු පහසුකම ලබාගන්නා බවට පත්වන විට, කල්බදු පහසුකමට යටත් වත්කම් ප්‍රාග්ධනීයකරණය කර, 'දේපල, පිරියත හා උපකරණ' තුල ඇතුළත් කරන අතර, කල්බදු පහසුකම් සපයන්නා හට ඇති කෙරෙන වගකීමේ බැඳීම 'කල්බදු ණයහිමිකරුවන්' තුල ඇතුළත් කෙරේ. වත්කමේ සාධාරණ වටිනාකමට හෝ වටිනාකම අඩු මට්ටමක පවතී නම්, අවම කල්බදු ගෙවීම්වල වත්මන් වටිනාකමට මූල්‍ය කල්බදු පහසුකමක් හා ඊට අදාල වගකීම මූලික වශයෙන් හඳුනාගැනේ. වගකීමේ ශේෂය මත ස්ථීර පොලී අනුපාතයක් ලබා දිය හැකි පරිදි කල්බදු පහසුකම තුල සැඟවුණු පොලී අනුපාතය මත පදනම්ව කල්බදු කාලසීමාව තුල 'ශුද්ධ පොලී ආදායම' තුල ගෙවිය යුතු මූල්‍ය ගාස්තු හඳුනාගැනේ.

මෙහෙයුම් කල්බදු

අනෙකුත් සියලුම කල්බදු පහසුකම් මෙහෙයුම් කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව කල්බදු පහසුකම ලබාදෙන්නා බවට පත්වන විට, කල්බදු දී ඇති වත්කම් ශේෂ පත්‍රය තුල හඳුනා නොගැනේ. කල්බදු කාලසීමාවන් තුල මෙහෙයුම් කල්බදු යටතේ ගෙවිය යුතු හා ලැබිය යුතු කුලී ගාස්තු සෘජු රේඛීය පදනම මත ගිණුම්ගත කෙරෙන අතර, පිළිවෙලින් 'පරිපාලන වියදම්' සහ 'වෙනත් මෙහෙයුම් ආදායම්'හි ඇතුළත් කෙරේ.

3.2.1 තොග/භාණ්ඩ ලේඛන

පෙර පිවිසි පෙර නිකුත්(First in first out) පදනම මත අගයන ලද, යල්පැන ඇති හා සෙමින් ක්‍රියාකරන අයිතමයන් සඳහා දීමනා ලබාදීමෙන් අනතුරුව, පිරිවැයට හා නිෂ්කාශනය කළ හැකි ශුද්ධ උපලබ්ධි අගයට ට (Net Realizable Value) හෝ මින් කවර හෝ අඩු අගයකට භාණ්ඩ ලේඛන හඳුනාගැනේ.

භාණ්ඩ ලේඛන ගණනය කිරීම

3.2.2 භාණ්ඩ ලේඛනවල පිරිවැය

අමුද්‍රව්‍ය

යම් ආනුශංගික වියදමක් ද සහිතව මිලදීගැනීම්වල පිරිවැය.

දැනට සිදු කරගෙන යන කාර්යයන්

අමුද්‍රව්‍ය පිරිවැය හා විවලනය වන මුළු නිෂ්පාදන වියදම්.

නිම කර ඇති භාණ්ඩ

අමුද්‍රව්‍ය පිරිවැය හා විවලනය වන මුළු නිෂ්පාදන වියදම්.

3.2.3 මුදල් හා මුදල් සමානයන්

මුදල් හා මුදල් සමානයන් තුළ අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු ආයෝජන, අතිශයින් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු, මාස හයකින් හෝ ඊට අඩු කාලයකින් නියම ලෙස කල් පිරෙන වෙනත් කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ. ශේෂ පත්‍රයේ ජංගම වගකීම්හි ණය ගැනීම් තුළ බැංකු අයිරා අගයන් පෙන්නුම් කෙරේ.

3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබාගැනීමේ අරමුණින් සිදු කරන පර්යේෂණ කටයුතු සඳහා දරන වියදම්, ඒවා හටගැනීමේදී ලාභාලාභ තුළ හඳුනාගැනේ.

4. වගකීම් හා ප්‍රතිපාදන

4.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

4.1.1 අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සංස්ථාව පාරිතෝෂික ගෙවීමට බැඳී සිටියි. සංස්ථාව සමඟ අඛණ්ඩ වසර පහක කාලසීමාවක් සම්පූර්ණ කිරීම මත පමණක් යම් සේවකයෙකු හට පාරිතෝෂික පිළිබඳ වගකීමක් ඇති කෙරේ. මෙම වගකීම සපුරාලීම පිණිස, ශේෂ පත්‍රය තුල යම් ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යයි. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදන හා වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.
මෙම වගකීම සඳහා බාහිර වශයෙන් අරමුදල් නොසැපයේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ වර්ග කෙරේ.

4.1.2 අර්ථ නිරූපිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

සංස්ථාව මගින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා දායකත්ව මුදල් සපයනු ලැබේ. අදාළ රෙගුලාසිය හා සමගාමීව, අදාල දායකත්ව අරමුදල් මගින් මෙම දායකත්ව මුදල් ආවරණය කෙරේ. සේවකයින් ආවරණය කරනු ලබන සැලසුම් සඳහා දායකත්වය ලබාදීමේ වගකීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

සේවක අර්ථසාධක අරමුදල

සංස්ථාව හා සේවකයින් විසින් මූලික වැටුප මත 12%ක් සංස්ථාවෙන්ද, 10%ක් සේවකයින්ගෙන්ද දායක මුදලක් ලබා දෙයි.

සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල

සංස්ථාව විසින් මූලික වැටුප මත සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායක මුදලක් ලබා දෙයි.

5. ආදායම් ප්‍රකාශය

මෙම ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය වෙනුවෙන්, වියදම් ක්‍රමවේදය මගින් සාධාරණ ලෙස සංස්ථාවේ කාර්යසාධනයේ අංග නිරූපණය වන හෙයින්, එකී ක්‍රමවේදයේ කාර්යයන් සඳහා අනුගත වේ.

5.1.1 ආදායම් හඳුනාගැනීම

සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාව සහිත මට්ටම දක්වා ආදායම් හඳුනාගැනෙන අතර, ගෙවීම් සිදු කෙරෙන අවස්ථාව නොසලකා හරිමින් සාධාරණ ලෙස ආදායම් ගණනය කළ හැකිය. ගිවිසුම්ගත ආකාරයෙන් අර්ථනිරූපිත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින්, ලද හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට ආදායම් ගණනය කෙරේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ පරිපාටිය ද සපුරාලිය යුතුය:

භාණ්ඩ අලෙවි කිරීම

සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීම මත භාණ්ඩවල අයිතියේ සුවිශේෂී අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත චිතැන් වන විටදී, භාණ්ඩ අලෙවියෙන් ලද ආදායම් හඳුනාගැනේ.

සේවා සැපයීම

සේවා සපයන ලද හෝ ඉටු කරන ලද ගිණුම්කරණ කාලසීමාවේ සපයනු ලබන සේවාවන්ගෙන් ලද ආදායම් හඳුනා ගැනේ.

වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ. මීට ප්‍රධාන වශයෙන් ආදායම් කළමනාකරණය කිරීම, ලියාපදිංචි ගාස්තු, ගස් සම්බන්ධ ටෙන්ඩර්වලින් ලද ආදායම් හා කල්බදු කුලී ආදායම් අයත් වේ.

5.1.2 වියදම්

ව්‍යාපාරය මෙහෙයවීමේදී හටගන්නා සියලුම වියදම් වර්ෂය සඳහා ලාභයට අයත්වන ආදායම් තුළ අන්තර්ගත කෙරේ. අලුත්වැඩියා කිරීම් හා නවීකරණය කිරීම්, එම වියදම් හටගන්නා වර්ෂයේ ලාභාලාභ තුළ අන්තර්ගත කෙරේ.

5.1.3 මූල්‍ය වියදම්

යම් වත්කමක් අපේක්ෂිත ලෙස භාවිත කිරීමට හෝ අලෙවි කිරීමට හෝ සූදානම් කරන තෙක් සැලකිය යුතු කාලසීමාවක් අත්‍යවශ්‍යයෙන්ම වැය වන එකී වත්කම අත්පත්කරගැනීමට, ඉදි කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම දායක වන ණයට ගැනීමේ පිරිවැය, අදාල වත්කම්හි පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම ණයගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුල වියදම් සේ සැලකේ. සංස්ථාවේ මූල්‍ය වියදම් අයිරාව මත පොලිය, මුදල් මත කොමිස් ගාස්තු, ණය පොලී (බැංකු හා වෙනත්) හා තැරැව්කරුවන්ගේ පොලී යනාදියෙන් සමන්විත වේ.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසුකාලීන ගණනය කිරීම්

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂය පථය තුළ පවතින මූල්‍ය වත්කම්, යෝග්‍ය පරිදි ලාභ හෝ පාඩු, ණය හා ලැබිය යුතු, කල්පිරීමට තබා ඇති ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර, මූලික හඳුනාගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම පිළිබඳව නිර්ණය කරයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ඊට අතිරේකව, ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට නොවන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම ගණුදෙණු පිරිවැයට අදාලව හඳුනාගැනේ.
සංස්ථාවේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ස්ථාවර තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු හා අනෙකුත් තැන්පතු ඇතුළත් වේ. ඉහත මූල්‍ය වත්කම් පහත සඳහන් ජංගම වත්කම් යටතේ පෙන්නුම් කරයි.

6.1.2 පසුකාලීන ගණනය කිරීම්

පසුකාලීනව මූල්‍ය වත්කම් ගණනය කිරීම පහත සඳහන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

6.1.2.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් තුළ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූලික වශයෙන් හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කිරීමේ හෝ නුදුරු කාලයකදී නැවත මිලදීගැනීමේ අරමුණින් අත්පත්කරගන්නේ නම්, එකී වත්කම් අලෙවිය සඳහා තබාගන්නා ලද වත්කම් සේ වර්ගීකරණය කෙරේ. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට ලද කිසිදු මූල්‍ය වත්කමක් නොවීය.

6.1.2.2 ණය හා ලැබිය යුතු

ණය හා ලැබිය යුතු යනු සක්‍රීය වෙළඳපොලක් තුල සඳහන් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කමිය. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, පසුකාලීනව එවැනි මූල්‍ය වත්කම්, භායනය කිරීම් අඩු කර ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. යම් වට්ටමක් හෝ අත්පත්කරගැනීමක් මත රක්ෂණ වාරිකයක් හා EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය ගණනය කෙරේ. මෙම EIR ක්‍රමක්ෂය කිරීම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කෙරේ. භායනය මගින් හටගන්නා පාඩු මූල්‍ය ප්‍රකාශයේ සඳහන් මූල්‍ය පිරිවැය තුළ හඳුනාගැනේ.

6.1.2.3 කල් පිරීමට තබා ඇති ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හා ස්ථාවර කල්පිරීම් කල් පිරෙන තෙක් රඳවාගැනීමේ සද්භාවය සහ හැකියාව සංස්ථාව සතු වන විට, එවැනි වත්කම් කල් පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, කල් පිරීමට තබා ඇති ආයෝජන, භායනය අඩු කර, ඵලදායී පොලී ක්‍රමවේදය අනුගමනය කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. අත්පත්කරගැනීමක් මත යම් වට්ටමක් හෝ රක්ෂණ වාරිකයක් සහ EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුල ඇතුළත් කෙරේ. භායනයෙන් ජනනය වන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගැනේ. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල් පිරීමට තබා ඇති කිසිදු ආයෝජනයක් නොමැත.

6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ස්කන්ධ හා ණය ඇපකර යනාදිය ඇතුළත් වේ. ස්ක්න්ධ ආයෝජන විකිණීමට ඇති සේ වර්ගීකරණය කරනුයේ, අලෙවිය සඳහා ඇති හෝ ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකම සඳහා යනුවෙන් වර්ගීකරණය කර නොමැති හෙයිනි. මෙම කාණ්ඩයේ ණය ඇපකර යනු අවිනිශ්චිත කාලසීමාවක් සඳහා තබා ගැනීමට අපේක්ෂා කරන, ද්‍රවශීලතා අවශ්‍යතාවලට සහ වෙළඳපොල තත්ත්වයන්හි වෙනස්කම්වලට ප්‍රතිචාරී ලෙස අලෙවි කළ හැකි ඇපකර වේ.
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව විකිණීමට ඇති කිසිදු මූල්‍ය ආයෝජනයක් නොමැත.

6.1.2.5 හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් මූල්‍ය වත්කමක් (හෝ අදාල වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ ඒ හා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීමෙන් තොරව බැහැර කරනුයේ,

i). එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වූ විට;

ii). සංස්ථාව මගින් එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරාදුන් විට හා 'pass-through' ක්‍රමය යටතේ යම් තෙවන පාර්ශ්වයක් වෙත කිසිදු ආකාරයක ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීමට යම් වගකීමක් භාර ගත් විට; සහ එමෙන්ම

(අ) සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දී ඇති විට; හෝ

(ආ) සංස්ථාව විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරා දී හෝ රඳවා ගෙන නොමැති නමුත්, වත්කමේ පාලනය පවරා දී ඇති විට.

6.1.2.6 මූල්‍ය වත්කම් හායනය වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හායනය වී ඇති බවට යම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න සංස්ථාව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම අගයනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුව ඇති යම් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙස හායනය සිදු ව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් හා සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකි එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත එම පාඩු සිදු කරන ලද සිදුවීම මගින් බලපෑමක් සිදු කර ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් එකී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය හායනය වී ඇතැයි සැලකිය යුතුය.

යම් ණයගැතියන් හෝ ණයගැතියන් කාණ්ඩයකට සුවිශේෂී මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව, පොලී හෝ ප්‍රධාන ගෙවීම් වංචා කිරීම හෝ පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්වන බව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමකට සූදානම් වන බව සහ වංචාවන් සමඟ සහසම්බන්ධ වන ගෙවුම් හිඟ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුල ගණනය කළ හැකි අඩුවීමක් ඇති බවට නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙන්නුම් කරන විටෙක හායනය වීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. දැනට සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත.

6.1.2.7 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව විසින් පළමුව තනි තනි වශයෙන් වැදගත් හෝ එසේ තනි තනි වශයෙන් සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් හායනය වීමක් ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න අගයනු ලබයි. සුවිශේෂී වන හෝ නොවන යම් තනි තනි වශයෙන් අගයන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හායනය වීමක් පිළිබඳ කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට සංස්ථාව නිර්ණය කරන්නේ නම්, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුල එම වත්කම ඇතුළත් කර, හායනය වීම සම්බන්ධයෙන් සාමූහික ලෙස ඇගයේ. හායනය වීම සම්බන්ධයෙන් තනි තනි වශයෙන් අගයන ලද සහ හායනය වීමක් හඳුනාගත් හෝ එසේ අඛණ්ඩව සිදු වන බව හඳුනාගත් වත්කම් සාමූහික හායන ඇගයුමක් තුළ ඇතුළත් නොකෙරේ.

යම් හායන පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, වත්කමේ ඉදිරියට ගෙන යන ශේෂය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දැනට සිදුව නොමැති අනාගතයේ අපේක්ෂා කරන ණය පාඩු හැර) වෙනස ලෙස එම පාඩුවේ ප්‍රමාණය ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම සඳහා එම මූල්‍ය වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් ලබා දෙයි.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම් හෝ ණය හා ණයගැනීම් හෝ යෝග්‍ය පරිදි ඵලදායී සීමාවක් තුල සීමාසහිත මූල්‍ය උපකරණ ලෙස හඳුනාගෙන ඇති ව්‍යුත්පන්න ලෙස ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක

39හි විෂයපථය තුල පවතින මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම්වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙන යනු ලබයි. මීට සෘජුවම අදාල වන ගණුදෙණු පිරිවැය ඇතුළත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් තුල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු සහ බැංකු අයිරා ඇතුළත් වේ.

පසුකාලීන ගණනය කිරීම්

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් වගකීමක් යටතේ පවතින මූල්‍ය වගකීමක් ඉටු කළ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට එම වගකීම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

7. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පළමු වරට අදාළ කරගැනීම (SLFRS/LKAS)

2012 ජනවාරි මස 01 දින සිට බලාත්මක වන, ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතිකරණ ප්‍රමිතීන් හා ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පළමු වරට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුලු සහ ඒ දක්වා කාලසීමාවන් සඳහා සංස්ථාව විසින් මුල් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

8 දේපළ, පිරියත හා උපකරණ

ප්‍රධාන කාර්යාලය	සිත්නක්කර ඉඩම්	ගොඩනැඟිලි	උපකරණ හා ගෘහභාණ්ඩ	පරිගණක	මෝටර් වාහන				එකතුව
පිරිවැය හෝ තක්සේරුකිරීම්									
2021 ජනවාරි 1 දිනට	**4,031,845**	**4,959,427**	**17,642,944**	**4,696,560**	**66,115,401**				**97,446,176**
එකතුකිරීම්	-	-	(98,676)	321,992	-				**223,316**
බැහැරකිරීම්	-	-	-	-	-				**-**
මාරුකිරීම්	-	-	-	-	-				**-**
2021 දෙසැම්බර් 31 දිනට	**4,031,845**	**4,959,427**	**17,544,268**	**5,018,552**	**66,115,401**				**97,669,492**
ක්ෂයවීම්									
2021 ජනවාරි 1 දිනට	**-**	**4,959,384**	**13,647,035**	**4,057,324**	**66,094,153**				**88,757,896**
වසරෙහි ක්ෂයවීම් සඳහා ගාස්තු	-	-	577,323	385,412	-				**962,734**
පෙර වර්ෂයේ ගැළපීම්									
බැහැරකිරීම්	-	-	-	-	-				**-**
මාරුකිරීම්									
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**4,959,384**	**14,224,357**	**4,442,735**	**66,094,153**				**89,720,630**
ශුද්ධ පොත් අගය									
2021 දෙසැම්බර් 31 දිනට	**4,031,845**	**43**	**3,319,911**	**575,817**	**21,247**				**7,948,863**

වතුයායන්	ඉඩම්	ගොඩනැඟිලි	උපකරණ හා ගෘහභාණ්ඩ හා සවිකිරීම්	පරිගණක	මෝටර් වාහන	යන්ත්‍රෝපකරණ	ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (සටහන 8.1)	හිමිකම් කියන වෙනත් වත්කම්	එකතුව
පිරිවැය හෝ තක්සේරුකිරීම්									
2021 ජනවාරි 1 දිනට	**645,345,972**	**182,789,431**	**25,004,570**	809,772	**82,419,651**	**117,017,392**	**536,851,014**	**6,705,259**	**1,596,943,061**
එකතුකිරීම්	-	1,315,022	1,195,962	160,250	1,780,922	16,602,946	29,862,633	-	**50,917,735**
බැහැරකිරීම්	-	-	-	-	-	-		-	
2021 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**184,104,453**	**26,200,532**	**970,022**	**84,200,574**	**133,620,338**	**566,713,647**	**6,705,259**	**1,647,860,795**
ක්ෂයවීම් හා හානිකරණය									
2021 ජනවාරි 1 දිනට	-	**112,846,289**	**18,761,361**	809,771	**70,601,460**	**102,901,073**	**374,683,577**	**6,672,972**	**687,276,503**
වසරෙහි ක්ෂයවීම් සඳහා ගාස්තු	-	3,835,499	588,224	31,482	1,019,593	3,026,538	3,072,070	-	**11,573,405**
පෙර වර්ෂයේ ගැළපීම්	-	-	-	-	-	-	(17,690)	-	**(17,690)**
මාරුකිරීම්/නිවැරදිකිරීම්							(55,284)		**(55,284)**
බැහැරකිරීම්	-	-	-	-	-	-		-	
මාරුකිරීම්									
2021 දෙසැම්බර් 31 දිනට	**-**	**116,681,788**	**19,349,585**	**841,253**	**71,621,053**	**105,927,611**	**377,682,673**	**6,672,972**	**698,776,934**
ශුද්ධ පොත් අගය									
2021 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**67,422,665**	**6,850,946**	**128,769**	**12,579,521**	**27,692,728**	**189,030,974**	**32,287**	**949,083,861**
ශුද්ධ පොත් අගය ප්‍රධාන කාර්යාලය සහ වතුයාය 2021 දෙසැම්බර් 31 දිනට	**649,377,816**	**67,422,708**	**10,170,857**	**704,586**	**12,600,768**	**27,692,728**	**189,030,974**	**32,287**	**957,032,724**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

8.1 ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් සමුච්චිත ක්ෂයවීම් වලට වඩා අඩු වියදමකින් පවත්වාගෙන යනු ඇත.

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්	තේ		පොල්	ගම්මිරිස්	රබර්	කෝපි	වෙනත්	එකතුව
	නොමේරූ හා මේරූ තේ	නොමේරූ වගාව						
පිරිවැය හෝ තක්සේරුකිරීම්								
2021 ජනවාරි 1 දිනට	**506,933,377**	-	**3,809,207**	**3,551,947**	**15,270,484**	**1,501,242**	**5,784,759**	**536,851,014**
එකතුකිරීම්	-	26,016,418	-	-	-	64,250	3,781,965	**29,862,633**
බැහැරකිරීම්	-	-	-	-	-	-	-	-
2021දෙසැම්බර් 31 දිනට	**506,933,377**	**26,016,418**	**3,809,207**	**3,551,947**	**15,270,484**	**1,565,492**	**9,566,724**	**566,713,647**
ක්ෂයවීම්	**තේ**		**පොල්**	**ගම්මිරිස්**	**රබර්**	**කෝපි**	**වෙනත්**	**එකතුව**
	නොමේරූ හා මේරූ තේ	නොමේරූ වගාව						
2021 ජනවාරි 1 දිනට	**363,277,731**		**2,746,318**	**2,228,590**	**3,859,994**	**1,422,051**	**1,148,894**	**374,683,577**
වසරෙහි ක්ෂයවීම් සඳහා ගාස්තු	2,352,568	-	38,690	97,483	324,312	5,528	253,488	**3,072,070**
පෙර වර්ෂයේ ගැළපීම්							(17,690)	**(17,690)**
මාරුකිරීම්/නිවැරදිකිරීම්	14,919	-	-	(492)	-	-	(69,711)	**(55,284)**
බැහැරකිරීම්	-		-	-	-	-	-	-
2021දෙසැම්බර් 31 දිනට	**365,645,218**	-	**2,785,008**	**2,325,581**	**4,184,306**	**1,427,579**	**1,314,981**	**377,682,672**
ශුද්ධ පොත් අගය								
2021දෙසැම්බර් 31 දිනට	**141,288,159**	**26,016,418**	**1,024,199**	**1,226,366**	**11,086,178**	**137,913**	**8,251,743**	**189,030,975**
2021දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය								**189,030,975**

9 ජීවවිද්‍යාත්මක වත්කම් -පාරිභෝජ්‍ය

පාරිභෝජ්‍ය	**2021දෙසැම්බර් 31 දිනට** රු.	**2020දෙසැම්බර් 31 දිනට** රු.
ජීවවිද්‍යාත්මක වත්කම්	**3,314,581,133**	**3,314,581,133**
නැවත වන වගාකිරීම්		
2021 ජනවාරි 01 දිනට	35,642,201	-
වසර තුළ එකතුකිරීම්	6,132,431	-
මුළු පාරිභෝජ්‍ය ජීවවිදයාත්මක වත්කම්	**3,356,355,765**	**3,314,581,133**

මෙම දැව ප්‍රදේශවලින් කොටසක් නකල්ස් රක්ෂිතයට අයත්වීම හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සීමා නිර්ණය කිරීම අවසන් කර නොමැති බැවින් 2021 වර්ෂය තුළ කිසිදු තක්සේරුවක් සිදු කර නොමැත. එසේම තක්සේරුව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැයවන හෙයින් හා පවතින දුෂ්කර මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවහට මෙම වියදම් දැරීමට මේ අවස්ථාවේ හැකියාවක් නොමැත. මෙම ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අප විසින් ආරම්භ කරනු ලැබ ඇති අතර මූල්‍යමය වශයෙන් සහාය දෙන ලෙස ඉල්ලා රේඛීය අමාත්‍යාංශය වෙතින් ලිඛිතව ඉල්ලා ඇත. මීට අමතරව වතුයායන් කිහිපයක් සඳහා වන සංරක්ෂණ කළමනාකරණ සැලැස්ම සඳහා අනුමැතිය ලැබී ඇති අතර අනෙකුත් වතුයායන්හි කළමනාකරණ සැලසුම් සඳහා ද අනුමැතිය ලබා ගැනීමට කටයුතු සකස් කරමින් පවතී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

10 ආයෝජන දේපළ

	2021.12.31 දිනට රු.	2020.12.31 දිනට රු.
රජයේ ඉඩම් දායකත්වය	1,600,601,926	1,600,601,926
ප්‍රාග්ධන අගය වැඩිකිරීම සඳහා ඉඩම්	10,918,715	10,918,715
	1,611,520,641	**1,611,520,641**

1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 ගැසට් පත්‍රයට අනුව වතුයායන් රැසක අයිතිය ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා ඇත. මේවා 1992 දී දීර්ඝ කාලීන බදු පදනම් මත ප්‍රාදේශීය වැවිලි සමාගම් දහනවයක් (19) වෙත භාර දෙන ලදී. කළමනාකාරිත්වයේ අදහස වන්නේ මෙම ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දුන් දිනට එම ඉඩම්වල පිරිවැය සාධාරණ ලෙස පිළිබිඹු කරන බවත්, එම අගයන් ගිණුම් පොත්වල ඉදිරියට ගෙන යන බවත්ය.

ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 ට අනුව, ආයෝජන දේපලක් මුල් අවස්ථාවේදී (මාරු කිරීමේ අවස්ථාවේ) එහි පිරිවැයෙන් මනිනු ලබන අතර පසුව සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය භාවිතා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වෙත පරිවර්ථනය වන අවස්ථාවේ මාරුකිරීම සිදුකළ දිනයේ අධීක්ෂණ අගයන් ලබා ගැනීමට කළමනාකාරිත්වයට නොහැකි වූ අතර ඒ වෙනුවට ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දෙන අවස්ථාවේ වටිනාකම වතු වල සාධාරණ වටිනාකම ලෙස සැලකේ. එබැවින් 1992 වන විට ඉඩම් වටිනාකම RPC හි ශේෂ පත්‍රවලින් සමානුපාතිකව උපුටා ගන්නා ලදී.

මෙම ආයෝජන දේපල මේ වසරේදී තක්සේරු නොකළේ, තක්සේරු කිරීම සඳහා විශාල මුදලක් අවශ්‍ය වන බැවින් සහ රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි වත්මන් මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් විශාල ව්‍යවස්ථාපිත හිඟ මුදල් පවා මේ වනවිට පියවා නොගන්නා මොහොතක මෙවැනි විශාල වියදමක් දැරීමට අපහසු බැවිනි. එබැවින් බොහෝ පැරණි ව්‍යවස්ථාපිත හිඟ මුදල් පියවීමටත්, රාජ්‍ය වැවිලි සංස්ථාවට එදිරිව පවරා ඇති නඩු කටයුතු සඳහාත් අවශ්‍ය වන මූල්‍යමය සහයෝගය ලබා දෙන ලෙසත් රේඛීය අමාත්‍යාංශය වෙතින් ලිඛිත ඉල්ලීමක් කර ඇත.

11 තොග

	2021.12.31 දිනට රු.	2020.12.31 දිනට රු.
නිමි නිෂ්පාදන	54,387,833	57,919,956
භාවිත කළ හැකි තොග	9,473,362	16,675,579
	63,861,195	**74,595,535**

නිමි නිෂ්පාදන තොගයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්දී අගයේ (Net Realizable Value) අඩු අගය සලකා බැලීමෙන් පසුවය.

12 වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

	2021.12.31 දිනට රු.	2020.12.31 දිනට රු.
වෙළඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලය(අ)	40,984,831	51,009,177
අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ විශේෂ අපහායනයන්	(15,404,568)	(15,404,568)
වෙළඳ ණයගැතියන් - සියලු වතුයායන් (ආ)	200,364,838	130,332,495
අඩුවීම් : වතු ණයගැතියන්ගේ විශේෂ අපහායනයන්	(49,128,420)	(49,128,420)
වෙනත් ලැබීම්-ප්‍රධාන කාර්යාලය	38,713,853	30,966,259
වෙනත් ලැබීම් -වතුයායන්	32,853,999	36,250,601
	248,384,533	**184,025,544**

a). වෙළඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලයට පහත අංශ ඇතුළත් වේ

	2021.12.31 දිනට	2020.12.31 දිනට
B.C.C. සමාගම	15,404,568	15,404,568
අඩුවීම් : ප්‍රධාන කාර්යාලයේ ණයගැතියන්ගේ විශේෂ අපහායනයන	(15,404,568)	(15,404,568)
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
වුඩ්සයිඩ් වතුයාය	992,125	992,125
ඩක්වාරි	2,500,000	2,500,000
ගිණුම් ලැබීම් - තේ දළු මිලදී ගන්නන්	19,122,815	27,487,452
සුළු හා වෙනත් ණයගැතියන්	1,049,231	2,708,940
	25,580,263	**35,604,609**

b). වෙළඳ ණයගැතියන් - වතුයායන්ට පහත අංශ ඇතුළත් වේ.

විවිධ ණයගැතියන්	23,200,768	33,891,252
පාරිභෝගික ණයගැතියන්	41,071,407	41,071,407
සුළු ආදායම් ණයගැතියන්	2,588,530	2,588,530
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	1,668,269	1,668,269
නිෂ්පාදනය සඳහා ණයගැතියන්	726,644	726,644
අඩුවීම් : වතු ණයගැතියන්ගේ විශේෂ අපහායනයන්	(47,537,070)	(47,537,070)
අඩුවීම් : බොල් ණය සඳහා වෙන්කිරීම්	(1,591,349)	(1,591,349)
අන්තර් වැවිලි සංගම ගිණුම්	-	-
වෙනත් ණයගැතියන්	131,109,221	50,386,393
	151,236,419	**81,204,075**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

13 මුදල් හා ඒ හා සමාන දෑ	2021.12.31 දිනට	2020.12.31 දිනට
(a). ධන ශේෂයන්:	රු.	රු.
අතැති හා බැංකුවේ ඇති මුදල්		
- ප්‍රධාන කාර්යාලය	40,829,610	43,342,178
- වතුයායන්	965,273	2,544,796
	41,794,882	**45,886,973**
(b).ඍණ ශේෂයන්		
- මහජන බැංකු ජංගම ගිණුම්	**(171,762,986)**	**(102,205,759)**
වසර අවසානයේදී මුදල් හා ඒ සමාන දෑ	**(129,968,104)**	**(56,318,786)**

පහතින් දැක්වෙන පරිදි ස්ථීර අයිරා පහසුකම් සුරක්ෂිත කර ඇත.
දැනට පවතින ස්ථීර අයිරා පහසුකම් ව්‍යුහය (POD)

ස්ථීර අයිරා සඳහා සුරකුම්	සුරකුම් අගය රු.		ස්ථීර බැංකු අයිරා අගය රු.
මහජන බැංකු ඉතිරිකිරීම් ගිණුම. 046-2005-9-0000933	33,000,000		29,000,000
ස්ථාවර තැන්පතු (850680) 046600100005667-5	2,200,000		1,980,000
ස්ථාවර තැන්පතු (850607) 046600100005591-6	5,000,000		4,500,000
රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් දෙමටගොඩ පිහිටි ගොඩනැගිල්ල	396,000,000		100,000,000
එකතුව			**135,480,000**

මහජන බැංකුවේ ජංගම ගිණුම් අංක 046-1001-5-0000933 සඳහා ලබාගත් ශේෂ මුදල 2021 දෙසැම්බර් මාසයේ කම්කරු වැටුප් ගෙවීම සඳහා තාවකාලික බැංකු අයිරාවක් ලෙස දින තිහක නිරවුල් කාලයක් සහිතව ලබා ගෙන ඇත.

14 දායක ප්‍රාග්ධනය	2021.12.31 දිනට	2020.12.31 දිනට
	රු.	රු.
රාජ්‍ය දායකත්වය	3,277,262,947	3,263,262,947
ඉඩම් සඳහා රාජ්‍ය දායකත්වය	2,616,589,903	2,616,589,903
	5,893,852,850	**5,879,852,850**

සමස්ත රජයේ දායකත්වය රජයෙන් (භාණ්ඩාගාරයෙන්) ලැබෙන මුදල් සහ රජය විසින් ගැසට් නිවේදන මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරා ඇති ඉඩම් වලින් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ ගෝමර පිහිටි කර්මාන්තශාලාව නවීකරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව වෙත රුපියල් මිලියන 14.0 ක ප්‍රතිපාදන ලැබී ඇත.

15 සේවක ප්‍රතිලාභ වගකීම්	2021.12.31 වනවිට	2020.12.31 වනවිට
	රු.	රු.
ආරම්භක ශේෂය- වතුයායන්	448,042,297	397,512,100.00
ප්‍රධාන කාර්යාලය	21,249,322	20,127,083.00
ඌන ප්‍රතිපාදන / අතිරික්ත ප්‍රතිපාදන ගැලපුම් (වතුයායන් හා ප්‍රධාන කාර්යාලය)	159,683,488	66,563,349.00
වසර සඳහා ප්‍රතිපාදන	37,508,004	30,226,545.03
ගෙවිය යුතු පාරිතෝෂික වෙත මාරු කිරීම්	(56,342,094)	(37,774,171.84)
වසර තුළ ගෙවීම්	-	(7,145,102.00)
වෙනත් ගනුදෙනු	-	(218,183.47)
	610,141,017	**469,291,620**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

16	වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	2021.12.31 දිනට රු.	2020.12.31 දිනට රු..
	ප්‍රධාන කාර්යාලය (අ)	346,355,088	316,061,332
	වතුයායන් (ආ)	1,291,777,550	1,046,004,128
	මෙහෙයුම් නොවන ශේෂය	1,933,044	1,933,044
		1,640,065,683	**1,363,998,504**

a).	**ප්‍රධාන කාර්යාල සඳහා වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ අතරට පහත දෑ ඇතුළත් වේ**	**2021.12.31 දිනට**	**2020.12.31 දිනට**
	අත්තිකාරම් - ඔපල්ගල (කල්බදු අත්තිකාරම්)	4,480,000	4,480,000
	දැව අත්තිකාරම්	786,379	786,379
	බහු රසායන	715,389	715,389
	පර්ත් වතුයාය	6,870,411	6,870,411
	ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	97,709,342	97,709,342
	අත්තිකාරම් ලැබීම්- නිමි තේ තැරැව්කරුවන්	17,320,344	1,513,477
	අත්තිකාරම් ලැබීම්- තේ දළු මිලදීගන්නන්	3,893,489	5,742,978
	රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
	පොහොර සංස්ථාව	35,931,679	35,931,679
	හලාවත වැවිලි සමාගම	38,010,959	36,410,959
	ණය - ලංකා බණිජ වැලි	25,000,000	25,000,000
	උපචිත වියදම්	12,769,575	13,527,699
	ගෙවිය යුතු සේ.අ.අ	16,239,547	12,637,260
	ගෙවිය යුතු ව.සේ.අ.අ	5,687,647	1,927,075
	ගෙවිය යුතු වැ.ක.ස	9,288,594	3,225,603
	ගෙවිය යුතු සේ.නි.හ.අ	688,434	1,226,571
	ආපසු ගෙවිය හැකි තැන්පතු	30,142,548	22,287,922
	ගස් අලෙවිය මත ණය	2,801,000	2,801,000
	වෙනත් ගෙවිය යුතු දෑ	9,310,724	14,558,560
	එකතුව	**346,355,088**	**316,061,332**

b).	**වතුයායන් සඳහා වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ අතරට පහත දෑ ඇතුළත් වේ**	**2021.12.31 දිනට**	**2020.12.31 දිනට**
	සුළු ණය හිමියන්	34,672,231	34,047,026
	ඇල්කඩුව වතුයාය	172,137	172,137
	නැවත ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු	6,379,570	6,379,570
	වෙනත් වගකීම්	53,640,544	15,594,104
	වෘත්තීය සමිති	7,996,009	7,428,863
	කාර්ය මණ්ඩලයට සහ කම්කරුවන්ට ගෙවිය යුතු මුදල්	45,631,961	49,177,269
	විගණන ගාස්තු සහ රක්ෂණ සඳහා ප්‍රතිපාදන	9,725,898	8,673,278
	ගෙවිය යුතු සේ.අ.අ	523,734,971	413,339,668
	ගෙවිය යුතු ව.සේ.අ.අ	29,345,773	16,625,046
	ගෙවිය යුතු වැ.ක.ස	24,954	24,954
	ගෙවිය යුතු සේ.නි.හ.අ	33,897,795	23,804,025
	ගෙවිය යුතු පාරිතෝෂික	471,018,313	402,314,300
	උපචිත වියදම්	5,661,419	5,870,908
	පැමිණීමේ ප්‍රසාද දීමනා ප්‍රතිපාදන	1,847,974	2,036,935
	සේ.අ.අ අතිරේක ගෙවීම්	48,447,018	43,640,418
	සේ.නි.හ.අ අතිරේක ගෙවීම්	3,425,078	2,658,745
	පාරිතෝෂික අතිරේක ගෙවීම්	16,155,905	14,296,172
	වෙනත් ගෙවීම්		
	එකතුව	**1,291,777,550**	**1,046,083,419**

16.1	**ණය-මහජන බැංකුව**	**100,000,000**	**100,000,000**

2020 අප්‍රේල් සහ මැයි මාසවලදී අපගේ මුදල් ප්‍රවාහ භීතිය පියවා ගැනීම සඳහා 2020 අප්‍රේල් 09 වන දින මහජන බැංකුවෙන් ඉහත සඳහන් පරිදි ණය පහසුකම් ලබා ගෙන ඇත්තෙමු. මාස හයක ගෙවීම් කාලසීමාවක් සහ පොලී සහිත මෙම ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් සහතික කරන ලද්දකි.එකඟ වූ පොලී අනුපාතය AWPLR + 2.5% විය. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළ අප මුහුණ දුන් දැඩි මුදල් ප්‍රවාහ තත්වය හේතුවෙන්, මෙම ණය ගෙවා දැමීමට නොහැකි විය, ඒ වෙනුවට ගෙවිය යුතු පොලී පමණක් පියවමින් සහන කාලය තවත් වසරකින් දීර්ඝ කරන ලදී. 2021 ඔක්තෝම්බර් මාසයේදීද මෙම ණය ගෙවීමට නොහැකි වූ අතර පියවීමේ කාලය තවත් වසරකින් දීර්ඝ කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

17 ආදායම	2021.12.31 දිනට	2020.12.31 දිනට
	රු.	රු..
තේ	368,159,225	327,616,538
අමු තේ දළු	463,886,452	419,437,439
සුළු බෝග	5,464,951	11,544,276
රබර්	7,831,089	8,237,326
මුළු ආදායම	**845,341,718**	**766,835,580**

කොළඹ තේ වෙන්දේසියේදී නිමි තේ විකිණීමෙන් ලැබෙන ආදායම, සංස්ථා තේ වලින් ලැබෙන විකුණුම් ආදායම සහ විකුණන ලද කසළ තේ වලින් ලැබෙන ආදායම තේ අලෙවියට ඇතුළත් වේ

18 වෙනත් ආදායම්	2021.12.31 දිනට	2020.12.31 දිනට
	රු.	රු.
ගස් ටෙන්ඩර්	145,337,204	97,038,052
බදුකුලී	23,536,325	36,042,725
කළමනාකරණ ගාස්තු	17,931,688	17,174,029
මූල්‍ය ආදායම	1,787,646	2,201,642
හුන්නස්ගිරි දියඇල්ල ආශ්‍රිතව ලැබෙන ආදායම	186,344	712,535
රජයේ ප්‍රදාන හා ආධාර	1,575,000	-
මදුරු විකර්ශක කුරු විකිණීම	254,500	-
පැළ තවාන්-විකිණුම් ආදායම	1,192,297	-
ප්‍රවේශපත් ආදායම	1,754,661	1,344,670
වෙනත් ආදායම්- වතුයායන් හා ප්‍රධාන කාර්යාලය	2,604,003	3,442,121
සංචාරක බංගලා ආදායම	418,000	1,867,178
වෙනත් ආදායම්හි එකතුව	**196,577,668**	**158,478,281**

19 පරිපාලන වියදම්	2021.12.31 දිනට	2020.12.31 දිනට
	Rs.	Rs.
කාර්ය මණ්ඩල ගෙවීම්	43,373,611	48,550,223
නිර්වචනය කරන ලද දායකත්වයන් - EPF, CPPS & ESPS	4,947,320	7,071,270
නිර්වචනය කරන ලද දායකත්වය - ETF	1,234,284	1,540,406
ක්ෂයවීම් - ප්‍රධාන කාර්යාලය	962,734	1,303,308
පාරිතෝෂික වියදම් ප්‍රධාන කාර්යාලය හා වතුයායන්	37,508,004	30,226,545
විකුණුම් වියදම්	18,517,288	13,927,535
වෙනත් පරිපාලන වියදම් - වතුයායන් හා ප්‍රධාන කාර්යාලය	98,327,130	78,268,055
මුළු පරිපාලන වියදම්	**204,870,371**	**180,887,340**

20 මූල්‍ය වියදම්	2021.12.31 දිනට	2020.12.31 දිනට
	රු.	රු.
මුදල් මත කොමිස්	6,458,818	5,597,184
තේ බ්‍රෝකර්වරුන්ගේ අත්තිකාරම් මත පොලී	4,310,113	2,015,159
බැංකු ගාස්තු	1,241,697	239,718
බැංකු අයිරා සහ බැංකු ණය පොළී	27,096,793	19,848,781
වෙනත් ණය පොලී - හලාවත වැවිලි සමාගම	1,600,000	1,600,000
මුළු මූල්‍යමය වියදම්	**40,707,422**	**29,300,841**

21 ආදායම් බදු

ශ්‍රී.ලං.රා.වැ.ස හි පසුගිය වසර දහඅටක වාර්ෂික ගිණුම්වල ආදායම් බදු ගණනය කිරීම් දක්නට නොලැබේ. මේ හේතුව නිසා සහ අඛණ්ඩව අලාභ ලැබීම නිසා අනාගතයේදී බදු ගෙවිය යුතු ලාභ නොපවතිනු ඇතැයි ද ආදායම් බදු ගෙවීමට ශ්‍රී.ලං.රා.වැ.ස සිදු නොවනු ඇතයිද උපකල්පනය කරනු ලැබේ. පසුගිය වසර විසි දෙක තුළ (1995 සිට 2016 දක්වා) ශ්‍රී.ලං.රා.වැ.ස ලාභ ලබා ඇත්තේ වසර හතරක් සඳහා පමණි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

22 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

රජය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ ගනුදෙනු

සාමාන්‍ය ක්‍රියාකාරිත්වයේ දී, සංස්ථාව ආශ්‍රිත පාර්ශ්වයන් සමඟ ගනුදෙනුවලට එළඹේ. ආශ්‍රිත පාර්ශ්වයන් අතරට; ශ්‍රී ලංකා රජය (සංස්ථාවේ අවසාන හිමිකරු ලෙස), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය පාලිත ආයතන ඇතුළත් වේ. තනි තනි වශයෙන් වැදගත් වන සහ සාමූහිකව ගත් කලෙක මිස තනිව ගත්කළ වැදගත් නොවන රාජ්‍ය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ සංස්ථාව විසින් සිදු කරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ .:

	2021	2020
	රු.	රු.
නිඹ ශේෂයන්		
ගෙවිය යුත්තේ		
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
හලාවත වැවිලි සමාගම	38,010,959	36,410,959
ලංකා ඛණිජවැලි සමාගම	25,000,000	25,000,000
ඇල්කඩුව වැවිලි සමාගම	172,137	172,137
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	97,709,342	97,709,342
පර්ත් වත්ත	6,870,411	6,870,411
	232,403,557	**230,803,557**
ලැබිය යුතු වන්නේ		
ඇල්කඩුව වැවිලි සමාගම	1,916,092	1,916,092
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	41,071,407	41,071,407
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	1,668,269	1,668,269
	44,655,768	**44,655,768**

23 බැඳීම් හා අවිනිශ්චිතතාවයන්

දිගු කාලයක් තිස්සේ ව්‍යවස්ථාපිත වගකීම් (EPF, ETF සහ පාරිතෝෂික) නොපියවීම සම්බන්ධයෙන් ශේෂ පත්‍ර දිනය වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකාරීත්වයට එරෙහිව පන්විල , තෙල්දෙණිය සහ මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයන්හි නඩු කටයුතු 700 ක් ගොනුකර ඇත.වසර තුළදී නඩු කටයුතු 116 සම්බන්ධයෙන් නිරවුල් කිරීම් කර ඇති අතර නව නඩු 119 ක් ශ්‍රී.ලං.රා.වැ.සට එදිරිව ගොනුකර ඇත. සංස්ථාවේ නීතිඥයින් විසින් නඩු කටයුත්ත සාර්ථකවිය හැකි නමුත් එහි සාර්ථකවීමේ සම්භාවිතාවය ඉතා අඩුබවට සංස්ථාව දැනුවත් කරනු ලැබ ඇත.ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශනවලින් කිසිදු අවිනිශ්චිත වගකීමක් සඳහා ප්‍රතිපාදන සපයා නොමැත

2020 සහ 2021 වසර වලදීද, මහා භාණ්ඩාගාරයෙන් කිසිදු ආධාරයක් ලබා නොගෙන සතිපතා පැමිණෙන නඩු කටයුතු සඳහා අබණ්ඩව මුදල් ගෙවීම් සිදු කළෙමු. 2021 වර්ෂය තුළ අපට මාසයක් සඳහා පමණක් දායක මුදල් ගෙවීමට හැකි විය. මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ 2021 මාර්තු මාසයේ සිට කම්කරු වැටුප් රුපියල් 1000 දක්වා 34.5% කින් ඉහළ යාම සහ ඒ සඳහා වැය වී ඇති අමතර වියදම රුපියල් මිලියන 147.2 ක් පමණ වීමත්ය.

24 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති සියලුම වැදගත් සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත

25 පෙර වර්ෂයේ ගැළපීම්

පූර්ව මුදල් වර්ෂයන්ට අදාළව පෙර වර්ෂයේ ගැළපීම් අතරට පහත ගනුදෙනු ඇතුළත් වන අතර මෙම ගැලපීම් මෙම වර්ෂය තුළ සිදු කරන ලදී.පාරිතෝෂික ඌණ ප්‍රතිපාදනයන්ට හේතු වී ඇත්තේ 2021 මාර්තු මාසයේ සිට කම්කරු වැටුප දිනකට රු.1,000 දක්වා වැඩි කිරීමයි.

විස්තර	2021	2020
	රු.	රු.
පාරිතෝෂික ගෙවීම් / ප්‍රතිපාදන (අඩු/වැඩි ප්‍රතිපාදන)	168,951,369	-
පාරිතෝෂික අධිභාර	651,732	-
සේ.අ.අ අධිභාර	2,426,005	-
සේ.භා.අ. අධිභාර	1,089,055	-
2020 වර්ෂයේ එළවළු හා එනසාල් වගා වියදම්	1,118,489	-
වෙනත් වියදම්/ගැළපීම්	(3,788,954)	(4,886,661)
එකතුව	**170,447,697**	**(4,886,661)**

26 විලම්බිත වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.3 ට අනුව විලම්බිත වත්කම් 10% කින් ක්‍රමක්ෂය කරන ලද අතර ලාභ හා අලාභ ගිණුමේ සාමාන්‍ය ගාස්තු -මාර්ග යටතේ අය කරන ලදී. පෙර මූල්‍ය වර්ෂය සඳහා වන ගැලපීම් ද ලාභාලාභ විසර්ජන ගිණුමට ගිණුම්ගත කර හර කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAL/G/SLSPC/01/2021/11 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 අප්‍රේල් 12 දින

සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 හි 42 හා 43 ඡේද ප්‍රකාරව පෙර වර්ෂ වලදී සිදු වූ වැරදි අතීතානුයෝගීව ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂය සමඟ ඉදිරිපත් කරන සංසන්දනාත්මක තොරතුරු නිවැරදි කළ යුතු නමුත්, සංස්ථාව සමාලෝචිත වර්ෂය තුළ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි දක්වා ඇති රු.170,447,696 ක් සහ 2020 වර්ෂයෙහි රු.4,886,661ක් වූ වැරදි නිවැරදි කිරීම් ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව සංසන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි .

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 හි 27 ඡේදය ප්‍රකාරව සංස්ථාව සතු වතු 14 කට අයත් හෙක්ටයාර් 11,178 ක් වූ ඉඩම්, සාධාරණ අගයට තකසේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව රු.275,125,774 ක පිරිවැය වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දැනටමත් භාවිතා කරන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකමට ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 වගන්තිය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම් ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු නමුත්, සංස්ථාව විසින් රු. 610,141,017 ක සේවක ප්‍රතිලාභ ගණනයේදී ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති රු.1,611,520,641 ක ආයෝජිත දේපළ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 ප්‍රකාර හෙළිදරව් කළ යුතු පහත සඳහන් කරුණු හෙළිදරව් කර නොතිබුණි.

(i) 75 (ඌ) ඡේදය පරිදි උක්ත ආයෝජිත දේපළ වලට අදාළ ගැණුම්, ඉදිකිරීම්, සංවර්ධනය කිරීම්, අලුත්වැඩියා, නඩත්තු හෝ වැඩිදියුණු කිරීම්වලට අදාළ ගිවිසුම්මය බැඳීම් තිබේද යන්න.

(ii) 78 (අ) ඡේදය ප්‍රකාරව ආයෝජිත දේපළවල විස්තරයක් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, 1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව තිබී මෙම සංස්ථාවට ලබා දී ඇති දේපළ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 ඡේදය හා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.2 අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනා ගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු බව දක්වා ඇතත්, සංස්ථාවේ වතු 11 ක හෙක්ටයාර් 726.73 ක් පුරා විහිදුනු ග්‍රාන්ඩිස්,ඇල්බීසියා යනාදී වන වගාවන් සමාලෝචිත වර්ෂය අවසානයටද නිසි තක්සේරු කිරීමකින් තොරව හෝ සාධාරණ අගයකට අගය කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.3,356,355,765 ක් ලෙස දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 43 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් පරිනත හා පරිනත නොවූ වගාවන් ලෙස වෙන වෙනම ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ අනාවරණය කර තිබුණු රු. 21,726,399 ක පොල්, රබර්, ගම්මිරිස් යනාදී ජීව විද්‍යාත්මක වත්කම්වල ශුද්ධ පොත් අගය එසේ වර්ගීකරණය කර ඉදිරිපත් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) වෙළඳ හා වෙනත් ලැබියයුතු ශේෂය තුළ භෞතිකව නොපවතින රු.1,111,215 ක පැළ තවාන් වටිනාකමක් ඇතුළත්ව තිබුණු බැවින් එම වටිනාකමින් සංස්ථාවේ වත්කම් වැඩිවී අලාභය අඩු වී තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන් අතර සිදුවන භාණ්ඩ සහ මුදල් හුවමාරු කර ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම තුළ සමාලෝචිත වර්ෂය අවසානයට එකිනෙකට හිලව් නොවූ රු.131,109,221 ක ශේෂයක් පැවති අතර එය වෙනත් ණයගැතියෝ ලෙස ජංගම වත්කම්වල ඇතුළත් කර ඇති බැවින් ජංගම වත්කම් එම වටිනාකමින් අධිගණනය වී තිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 15 අනුව පාරිතෝෂික වෙන්කිරීම්වල ආරම්භක හා අවසාන ශේෂයන් ලෙජර් ගිණුම් අනුව පාරිතෝෂික වෙන්කිරීම්වලට වඩා පිළිවෙළින් රු.85,257,147කින් හා රු.85,247,549 කින් අඩු වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(ඈ) සංස්ථාවේ ගල්පිල්ල වතුයාය විසින් සේවක අර්ථ සාධක අරමුදල් සම්බන්ධ නඩු සඳහා ගෙවූ රු.5,000,000 ක් ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් ගිණුමට ගැලපීමෙන් තොරව ණයගැති ශේෂය තුළ සේවක අර්ථ සාධක අරමුදල් තැන්පතු ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඉ) 2014 ඔක්තෝබර් 15 දින සංස්ථාව විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව රු.මිලියන 6 ක ණය මුදලක් ඇල්කඩුව වැවිලි සමාගමට ලබා දී තිබුණු අතර, 2015 වර්ෂයේ සිට සමාගම විසින් මෙම ණය මුදල ගෙවීම පැහැර හැරීම නිසා අය නොවී පවතින ණය ශේෂය රු.1,500,000 ක් වුවත් ඒ සඳහා අඩමාණ ණය වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල ශුද්ධ පොත් අගය රු.189,030,975 ක් වුවද ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යන උපලේඛනය අනුව ශේෂය රු.187,610,006 ක් බැවින් රු.1,420,969 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන්හි 2021 දෙසැම්බර් 31 දිනට පැවති ස්ථාවර වත්කම් ශේෂය හා ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් උපලේඛනය අතර රු.114,098,354 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2018 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවේ බැංකු අයිරාව රු.මිලි.40.2 ක් වූ අතර 2019 දී එය රු.මිලි.87.6 ක්ද 2020 දී රු.මිලි 102.2 ක්ද වූ අතර 2021 දී එය රු.මිලි.167.10 දක්වා ඉහළ ගොස් තිබුණි. එසේ තිබියදී 2020 වර්ෂයේදී නැවත රු. මිලි. 100 ක බැංකු ණයක් ලබාගෙන තිබුණද මෙම ණය ආපසු ගෙවීමේ සැලැස්මක් සංස්ථාව සතුව නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයටද එම ණය වටිනාකම එලෙසම ගිණුමේ පැවතුණි.

(ආ) සංස්ථාව හලාවත වැවිලි සමාගම වෙත රු.මිලි 38 ක් ද, ලංකා මිනරල් සෑන්ඩ් සමාගමටරු.මිලි 25 ක් හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත රු. මිලි. 97 ක් වශයෙන් රු.මිලි. 160 ක ණය හා පොලී පියවීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ණයගැති ශේෂයෙන්, වර්ෂ 05 ඉක්මවා ඇති ශේෂය රු.84,290,038 ක් වූ අතර මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදීද ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ඕපල්ගල වතුයායේ රු. 786,379 ක ගස් විකිණීමේ ටෙන්ඩර් සඳහා ටෙන්ඩර් කරුවන් විසින් 2010 හා 2011 වසර තුළ තැන්පත් කර ඇති ටෙන්ඩර් තැන්පතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඉ) වතු කාර්යමණ්ඩල අර්ථසාධක සංගමය (ESPS) වෙත නිසි පරිදි දායක මුදල් නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව විසින් ප්‍රධාන කාර්යාලය හා වතු වෙතුවෙන් ගෙවිය යුතු දායක මුදල රු. 35,033,420 ක් විය.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) 2021 වර්ෂය අවසානයට වූ රු. 3,356,355,765ක් වටිනා පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය සනාථ කර ගැනීම සඳහා පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජීව විද්‍යාත්මක වත්කම් යටතේ රු. 189,030,975 ක ධාරක ජීව විද්‍යාත්මක වත්කම් අගයක් දක්වා ඇතත් එම වත්කම්වල පැවැත්ම හා අගය සනාථ කරගැනීම සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර සටහන් පොත්,වයස් විශ්ලේෂණ ආදි ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ යටතේ සංස්ථාව විසින් වෙනත් පවරාගත් වත්කම් (Other Vested Assets) ලෙස රු.6,705,259 ක් දක්වා ඇතත් එම පවරාගත් වත්කම් පිළිබඳ උප ලේඛනයක් සහ එක් එක් වත්කමේ වටිනාකම් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන්හි රු.944,431,956 ක දේපළ පිරියත හා උපකරණ (වාහන හැර) පැවති නමුත් එම වත්කම්වල පැවැත්ම, අයිතිය හා වටිනාකම් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පිඹුරුපත්, තක්සේරු වාර්තා, ඉදිකිරීම් පිරිවැය වාර්තා හා සැලසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) සංස්ථාවේ රු.63,861,195 ක අවසන් තොගය ඇගයීම් වාර්තා සහ තොග සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.248,384,533ක වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂයේ ඇතුළත් රු.23,519,844 ක් වටිනා ණයගැති ශේෂ කුමන පුද්ගලයින්ගෙන් අයවිය යුතු ද යන්න සහ එම ශේෂයන් සනාථ කිරීම සඳහා අවශ්‍ය උපලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර රු.93,636,387ක ණයගැතියන් සඳහා ශේෂ සනාථනද ඉදිරිපත්කර නොතිබුණි.

(උ) සංස්ථාවේ රු.1,640,065,683ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු ශේෂයෙන් රු.156,576,309 ක ණයහිමි ශේෂ 16 ක් සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) 2006 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බොල්ණය වෙන්කිරීම් සහ විශේෂ හානිකරණය සඳහා වෙන් කිරීම් පිලිවෙලින් රු.1,591,349ක් හා රු.47,537,070ක් සඳහා භාවිතා කළ පදනම් මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කර නොතිබුණි.

(එ) 2012 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,933,043 ක චලනය නොවන ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස දක්වා තිබුණු අතර, මෙම ශේෂය හඳුනා ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) 2006 වසරේ සිට වතුයායන් 12 කට අයත් රු.6,379,570 ක "ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු" ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ පෙන්වා තිබුණු අතර, මෙම ශේෂ සනාථ කර ගැනීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ගස් අලෙවිය මත ණය වටිනාකම් වූ රු.2,801,000 ක් නහවුරු කර ගැනීම සඳහා අදාළ තක්සේරු වර්තා, ඉන්වොයිස්පත්, ගනුදෙනුකරුවන්ගේ තොරතුරු සහ විකුණුම් ගිවිසුම් ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ෂ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ තුළ රු.16,523,010 ක පැළ කවාන් වටිනාකමක් ඇතුළත් කර තිබුණු නමුත් ලැබිය යුතු දෑ තුළ මෙම ශේෂය දැක්වීමට හේතු පැහැදිලි කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබෙ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන නහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2.1 (අ) (ආ) (ඇ) (ඉ) (ඊ) (උ) 1.2.2(ආ), 1.2.5(ඇ) (ඈ) (ඉ) (ඊ) (උ) (ඌ) (එ) (ඒ) (ඔ) යන නිරීක්ෂණ හැර, අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනෘජාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ නිරණයවලට යොමුව	අනුකූල නොවීම
(අ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ 11 කොටසේ 16(1) වගන්තිය	2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවිය යුතු රු.539,974,518 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් දායකය සහ රු.34,586,229 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකය සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, 2021 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ගෙවිය යුතු වූ අංශයේ අධිභාර වවිනාකම් පිළිවෙලින් රු.48,447,018ක් හා රු 3,425,078 ක් විය.
(ආ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 5 (1) වන උප වගන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වූ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත් සංස්ථාව විසින් ඒ අනුව නියමිත දිනට පාරිතෝෂික නොගෙවීම් හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික ගිණුමේ ශේෂය රු. 471,018,313 ක් වූ අතර 2021 වර්ෂය අවසාන වන විට රු.16,155,905 ක අධිභාර ප්‍රමාණයක්ද ගෙවිය යුතුව තිබුණි.

9

(ඇ)	2017 අංක 24 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනත	
	(i) 90 වගන්තිය	පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක් ස්වයං තක්සේරු පදනම මත කාර්තුවක් අවසානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පිළිවෙලින් අගෝස්තු 15, නොවැම්බර් 15, පෙබරවාරි 15 හා ඊළඟ වර්ෂයේ මැයි 15 යන දින හෝ ඊට පෙර ආදායම් බදු ගෙවිය යුතුය. ඉතිරි බදු මුදලක් වෙතොත් එය ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර ගෙවිය යුතු වුවද සංස්ථාව 2021 වර්ෂයේ තක්සේරු කළ ආදායම් බදු 2022 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොමැති අතර ආදායම් බදු වගකීමද ගණනය කර නොතිබුණි.
	(ii) 93 වගන්තිය	ආදායම් බදු වාර්තාව ඊළඟ වර්ෂයේ නොවැම්බර් 30 හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දිය යුතු අතර ආදායම් බදු වගකීමක්, නොමැති වුවත් අදාළ තොරතුරු ඇතුළත් කර බදු වාර්තාව අදාල දින හෝ ඊට පෙර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට භාර දිය යුතු නමුත් සංස්ථාව 2021 තක්සේරු වර්ෂයට අදාළ 2020/2021 ආදායම් බදු වාර්තාව 2022 දෙසැම්බර් 31 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය (i) 5(2) ඡේදය	මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට කලින් ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේබීය අමාත්‍යාංශය , රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් සංස්ථාව විසින් ව්‍යාපාරික සැලැස්මක් පිළියෙළ කර

		නොතිබුණි.
	(ii) එම	ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් සංස්ථාව 2021 වර්ෂය වෙනුවෙන් ණය ආපසු ගෙවීමේ සැලැස්ම ඇතුළත්කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ඉ)	2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.3 හා 4.2.6 වගන්ති	කාර්ය සාධන වාර්තා/ ප්‍රගති වාර්තා කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික වශයෙන් පිළියෙල කර නොතිබුණි.
(ඊ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	වතුයායන්හි හා ප්‍රධාන කාර්යාලයේ වර්තමානය වන විට භාවිතයට ගත නොහැකි අපහරණය කළ යුතු මට්ටමේ පවතින අබලි තත්වයේ ඇති වාහන 22 ක් හා ධාවන තත්ත්වයේ නොමැති වුවද අළුත් වැඩියා කර ධාවනය කළ හැකි වාහන 14 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට හෝ අළුත් වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.
(උ)	2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමිකම් නොමැති නිලධාරීන් දෙදෙනෙකුට 2021 වර්ෂයේ රු.850,000ක ප්‍රවාහන දීමනාවක් සහ රු.293,880ක ඉන්ධන දීමනාවක් ගෙවීම් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2021 වර්ෂයේ රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ නිෂ්පාදනය සලකා බැලීමේදී 2020 ට සාපේක්ෂව 2021 වර්ෂයේදී සංස්ථාව සියයට 5ක වර්ධනයක් පෙන්නුම් කළද සංස්ථාවේ වතුයායන් අතරින් කොටගහ, හෙයාර්පාර්ක්, ඕපල්ගල හා වුඩ්සයිඩ් යන වතු හතරක මුළු තේ අස්වැන්න 2020 වර්ෂයට වඩා 2021 වර්ෂයේ දී සියයට 4 සිට සියයට 11 දක්වා පහළ ගොස් තිබුණි.

(ආ) සංස්ථාව විසින් 2021 වර්ෂයේ දී තේ කිලෝ ග්‍රෑම් 10,345,524 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කර තිබුන නමුත් සත්‍ය වශයෙන් නිෂ්පාදනය කිරීමට සමත් වී තිබුණේ තේ කිලෝ ග්‍රෑම් 8,385,003 ක් පමණක් බැවින් අපේක්ෂිත අගය හා සැසඳීමේදී සියයට 19 ක අඩුවීමකි.

(ඇ) 2021 වර්ෂයේ දී බාහිර වැවිලිකරුවන් වෙත ලබාදී තිබුණු භූමි ප්‍රමාණයෙන් තේ කිලෝ ග්‍රෑම් 1,059,607 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂාකර තිබුණු නමුත් සත්‍ය වශයෙන්ම නිෂ්පාදනය කර තිබුණේ තේ කිලෝග්‍රෑම් 793,501 කි. ඒ අනුව අපේක්ෂිත තේ නිෂ්පාදනය හා සැසඳීමේදී සියයට 25 ක අඩු වීමක් නිරීක්ෂණය විය.

3 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙහි අනුමත කාර්ය මණ්ඩලයෙහි ස්ථිර තනතුරු 109 ක් වුවද 2021 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු 22 ක් පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට සංස්ථාව විසින් කටයුතුකර නොතිබුණි.

(ආ) 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදයට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති කළමනාකරු-ප්‍රවාහන, නීති උපදේශක යනාදි තනතුරු 06 ක් සඳහා පත්වීම් ලබාදී එම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.3,986,928 ක වියදමක් දරා තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2 වගන්තිය ප්‍රකාරව යම් තනතුරක පුරප්පාඩුවක් ඇති වූ වහාම එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කළ යුතු වුවත් 2008 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින "කළමනාකරු නීති" තනතුරු සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකොට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු පත්කර තිබුණු අතර 2021 වර්ෂයේදී එම නිලධාරියාට රු.653,571 ක් ගෙවීමකර තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව කිසියම් තනතුරකට බඳවා ගැනීම සඳහා නිබිය යුතු අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් ඇතුළත් කර සකස් කරන ලද අනුමත බඳවා ගැනීම් හා උසස්කිරීමේ කාර්ය පරිපාටියක් සංස්ථාව සතුව නොතිබුණි.

ඩබ්ලිව්.සී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

13

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සඳහන් විගණන ඡේදවලට අදාල පිළිතුරු

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්.

(අ) විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු ඇති නොවන පරිදි 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමු.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මැනුම් කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ 2021.10.14 දිනැති ලිපියෙන් සහ සමගාමී වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත බෝග වගා තේ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ 2021.07.01 දිනැති ලිපිය මඟින් ලබාදුන් උපදෙස් පරිදි අදාල කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

වසර ගණනාවක සිට ආයතනයේ පවතින අයහපත් මූල්‍ය තත්වය නිසා සංස්ථාව සතු ඉඩම් තක්සේරු කිරීම ප්‍රමාද වී ඇත. එසේ වුවද තක්සේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වෙමින් අදාළ තක්සේරු කිරීම් සඳහා යන වියදම ගණනය කර ඒ සඳහා අවශ්‍ය මුදල් ලබාගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ මඟින් මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අතර, එම මුදල් ලද වහාම අදාළ තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කරන බව දන්වා සිටිමු.

(ඇ) සංස්ථාව සතු සියළු ගොඩනැගිලි සහ කර්මාන්තශාලා, යන්ත්‍රසූත්‍ර තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරය වෙතින් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. එසේම ආයතනය සතු සියළුම මෝටර් ප්‍රත්‍යාගණය කිරීමට අදාල කටයුතු ද 2023 වර්ෂය තුල ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 19 සහ එහි 57 ඡේදය අනුව පාර්තෝෂික ප්‍රතිලාභ ගණනය කිරීමට ජීවගණක/ආයුගණන තක්සේරුවක් (Actuarial Valuation) කල යුතුව ඇත. වර්තමානයේ දී එම ජීව ගණක තක්සේරුව කිරීම සඳහා අප සංස්ථාව සතුව දැනුම සහ සම්පත් නොමැත. එබැවින් 2023 වර්ෂය තුල ශ්‍රී ලංකාව තුල ඇති එම කාර්යය ඉටුකරනු ලබන ආයතන කිහිපය අතුරෙන් එක් ආයතනයක් තෝරාගෙන අප සංස්ථාවේ සේවක පාරිතෝෂික ප්‍රතිලාභ ගණනය කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

(ඉ) සංස්ථාව විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දී ඇති දේපළ වටිනාකම ආයෝජන දේපළ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අතර, එම දේපළ පිළිබඳ විස්තර හා ගිවිසුම්ගත බැඳීම් පිළිබඳව 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(ඊ) පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමේ මුල් පියවර වශයෙන් සියළුම වතුයායන් වල ඇති වාණිජ වටිනාකමක් ඇති සියළුම ගස් අංක කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස සියළු වතු අධිකාරීවරුන් වෙත දන්වා ඇති අතර, දැනටමත් වතුයායන් 10 කින් එම වාර්තා ලැබී ඇත. ඒ අනුව මෙම වත්කම් තක්සේරු කිරීමේ කටයුතු 2023 වර්ෂය තුල සිදුකිරීමට නියමිත බව දන්වා සිටින්නෙමු.

(උ) 2021 මූල්‍ය ප්‍රකාශන මඟින් සංස්ථාවට අයත් වතුවල තේ වගාව පරිනත හා අපරිනත වශයෙන් වෙන් වෙන්ව පෙන්වා ඇති අතර, අනෙකුත් ජීව විද්‍යාත්මක වත්කම් පරිනත හා අපරිනත වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කිරීම 2023 ට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සිදුකරන බව දන්වා සිටින්නෙමු.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමේ මුල් පියවර වශයනේ සියළුම වතුයායන්වල ඇති වාණිජ වටිනාකමක් ඇති සියළුම ගස් අංක කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස සියළු වතු අධිකාරීන් වෙත දන්වා ඇති අතර, දැනටමත් වතුයායන් 10 කින් එම වාර්තා ලැබී ඇත. ඒ අනුව මෙම වත්කම් තක්සේරු කිරීමේ කටයුතු 2023 වර්ෂය තුල සිදුකිරිමට නියමිත බව දන්වා සිටින්නෙමු.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මේ වන විට වතුයායන්වල ස්ථාවර වත්කම් ලේඛන සකස් කිරීම සඳහා වත්කම් හඳුනා ගැනීම ආරම්භ කර ඇති අතර, එම කටයුතු අවසන් කිරීමෙන් පසුව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. තවද ප්‍රධාන කාර්යාලයේ 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මේ වන විට වාර්තා ලැබී ඇති බැවින්, ප්‍රධාන කාර්යාලයේ ස්ථාවර වත්කම් ලේඛණ සකස් කිරීමේ කටයුතු 2023 වර්ෂය තුල අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ආ) මේ සම්බන්ධයෙන් සොය බලා අවශ්‍ය ගිණුම් ගැලපීම් 2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිදුකරන බව දන්වා සිටින්නෙමු.

1.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

(අ) විගණන විමසුම හා එකඟ නොවේ. විමසුමේ සඳහන් බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව ලබාගත් බැංකු ශේෂයන් අතරින් පහත සලකුණු කර ඇති වතු යායන්වල වටිනාකම් විගණන විමසුමේ වැරදි ලෙස සටහන් කර ඇත. නමුත් රංගල වතුයායේ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හා ශේෂපත්‍රයේ බැංකු ශේෂය අතර රු. 1,000.00 ක වෙනසක් පමණක් දක්නට ලැබේ.

වතුයායේ නම	විමසුම අනුව ලෙජර් ගිණුම් බැංකු ශේෂය (බැංකු සැසඳුම් අනුව) (රු. ශත)	ශේෂ පත්‍රයේ බැංකු ශේෂ (රු.ශත)	ලෙජර් අනුව බැංකු ශේෂය (රු.ශත)
අලකොල්ල	25,263.00	25,562.70	25,562.70
කොටගහ	39,298.00	45,138.00	45,138.00
ගල්පිහිල්ල	44,027.00	21,187.37	21,187.37
ගෝමර	62,847.00	62,847.60	62,847.60
හාගල	63,921.00	26,080.88	26,080.88
හෙයාර්පාක්	47,908.00	47,908.48	47,908.48
හුන්නස්ගිරිය	93,448.00	124,007.08	124,007.08
කැලෑබොක්ක	156,044.00	156,043.94	156,043.94
මිඩිලන්ඩ්	35,016.00	35,015.51	35,015.51
නිකොලොය	187,470.00	42,470.12	42,470.12
ඕපල්ගල	17,041.00	(2,305.78)	(2,305.78)
රංගල	58,736.00	59,736.29	59,736.29
වෛයිතලාව	47,560.00	47,559.76	47,559.76
වලහන්දුව	17,219.00	17,219.35	17,219.35
විහාරගල	96,713.00	96,713.84	96,713.84
වුඩ්සයිඩ්	22,194.00	22,193.93	22,193.93
කුඩාඔය	65,820.00	65,819.08	65,819.08

(ආ)මෙම වතු ආශ්‍රිත ගිණුම් ශේෂයන් ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමට මාරු කිරීමේ දී සිදුවී ඇති ගිණුම්කරණ අඩුපාඩු හේතුවෙන් මෙම තත්වය පැන නැගී ඇති අතර, මේ පිළිබඳව සොයාබලා අවශ්‍ය ගිණුම් ගැලපීම් 2023 වර්ෂය තුලදී සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

1.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) 1. මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන් හි පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය රු. 3,356,355,765.04 වන අතර, එම වටිනාකම හා සංස්ථාවේ ලෙජර් ගිණුම් අනුව ශේෂයන්වල වෙනසක් නොමැත. අදාළ වටිනාමක ලෙජර් ගිණුම් අනුව සැකසා ඇති ආකාරය පහත දක්වා ඇත.

ජීව විද්‍යාත්මක වත්කම් (වුඩ්සයිඩ් වතුයාය)	-	229,104,709.00
දැව තක්සේරු කිරීම	-	3,085,476,423.89
නැවත වන වගාව	-	41,774,632.15
එකතුව	-	3,356,355,765.04

නමුත් ඊට අදාළ උපලේඛනවල වුඩ්සයිඩ් වතුයායේ වගාවන් හි වටිනාකම් වන රු. 229,104,709.00 ක මුල ඇතුළත් වී තිබුණ ද එම වටිනාකම් අවසාන එකතුවට ඇතුළත්වී නොමැත.

(ආ) 2. 2021.12.31 දිනට ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වලට අදාල ලේජර් ශේෂයන් අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර, ඒ අනුව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල ශුද්ධ අගය ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති රු. 189,030,975.00 ක වටිනාකම නිවැරදි වේ. කෙසේවුවත් මෙම වත්කම් වටිනාකම අදාල උපලේඛන සකස් කිරීමේ දී වැරදීම් සිදුවී ඇති අතර, මේ වන විට එම වැරදි නිවැරදි කර ඇත.

ඒ අනුව උපලේඛන මඟින් නිවැරදි කර ඇති ශේෂ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

වගාව	ලෙජර් ශේෂය	නිවැරදි කරන ලද උපලේඛණ අනුව ශේෂය	වෙනස
නොමේරූ තේ	141,288,159.00	141,277,617.26	10,541.74
මේරූ තේ	26,016,418.00	26,016,418.00	-
පොල්	1,024,199.00	1,024,199.00	-
ගම්මිරිස්	1,226,366.00	1,231,191.70	(4,825.70)
රබර්	11,086,178.00	11,084,246.16	1,931.84
කෝපි	137,913.00	137,897.19	15.81
වෙනත්	8,251,743.00	8,159,687.84	92,055.16
එකතුව	**189,030,976.00**	**188,931,248.15**	**99,715.85**

නිවැරදි කරන ලද ධාරක ජීව විද්‍යාත්මක වත්කම් පිළිබඳ උප ලේඛණ අංක PAL/C/SLSPC/2021/AQ/04 හා 2023.01.12 දිනැති විගණන විමසුම සඳහා එවන ලද පිළිතුර සමඟ අමුණා ඇත.

මෙහිදී මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උප ලේඛණ ශේෂ අතර පවතින වෙනස්කම් පිළිබඳ සොයාබලා 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරන බව කාරුණිකව දන්වා සිටින්නෙමු.

(ඇ) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී වතු සම්බන්ධ සේවක ප්‍රතිලාභ බැඳීම් වලට අදාල ශේෂය පෙන්නුම් කිරීමේදී වතුවලට අදාල ලෙජර් ගිණුම් ශේෂය වූ රු. 670,881,826.00 මුදලින් රු. 85,247,549.00 හර ශේෂයක් අඩුකර අදාල වගකීම් වටිනාකම රු. 585,634,277.00 ක් ලෙස දක්වා ඇත. මෙම වටිනාකමින් රු. 85,527,147.00 ක වටිනාකම 2011 ට පෙර සිට පැවත එන හර ශේෂයක් වන අතර, ඉතිරි රු. 9,598.00 ක මුදල 2021 වර්ෂයේ පැන නැඟුණු බැර ශේෂයකි. මේ පිළිබඳ පරීක්ෂා කර බලා අවශ්‍ය නිවැරදි කිරීම් 2023 ප්‍රකාශනය පිළියෙල කරන අවස්ථාවේ සිදු කරන බව දන්වා සිටිමි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇති ගෙවිය යුතු පාරිතෝෂික ගිණුමේ රු. 471,018,313.00 ක් වූ ශේෂය සැකසී ඇති ආකාරය පහතින් දක්වා ඇත.

2021.01.01 ආරම්භක ශේෂය	-	රු. 402,314,300.00
එකතුකලා		
පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමෙන් ගෙවීමේ ගිණුමට මාරු කිරීම	-	රු. 55,788,495.44
පාරිතෝෂික ගෙවීම් ගිණුමේ අඩු තක්සේරුව නිවැරදි කිරීම	-	රු. 9,267,881.84
නඩුවකට අදාල ගෙවීමට ඉවත්කල අගයක් නැවත එකතු කිරීම		රු. 72,653.75
2020 වැරදි නිවැරදි කිරීම්	-	රු. 18,481,969.47
		රු. 485,925,300.00
අඩුකලා		
වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් - නඩු සඳහා	-	රු. (12,723,580.52)
වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් - සාමාන්‍ය	-	රු. (56,000.00)
ගෙවිය යුතු පාරිතෝෂික ගිණුමේ තිබූ අධිභාර ගෙවීම්	-	රු. (2,127,386.93)
2021.12.31 ශේෂය	-	රු. 471,018,332.55
මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇති ශේෂය	-	රු. 471,018,313.00
වෙනස	-	රු. 19.55

මෙම වෙනස පිළිබඳව සොයා බලා 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමේ ගලපා ඇති රු. 9,267,881.34 ක වටිනාකම සැකසී ඇති ආකාරය පහතින් දක්වා ඇත.

වතුයාය	වටිනාකම (රු. ශත)
කොටහග	78,400.00
නිකොලොය	2,732,130.66
රංගල	6,457,350.68
එකතුව	**9,267,881.34**

උක්ත කරුණට අදාළව එක් එක් වතුවලින් ලැබී ඇති ලිපි මේ සමඟ අමුණා ඇත.

(ඇමුණුම් අංක 01)

විගණන විමසුමේ සඳහන් ලෙජර් ශේෂයන් සහ සංස්ථාවේ ලෙජර් ශේෂයන් අතර වෙනස්කම් ඇති අතර, ඒ පිළිබඳව විස්තර පහත වේ.
(ඊ)

වත්කම් කාණ්ඩය	සංස්ථාවේ ලෙජරය අනුව ශේෂය			විගණන විමසුම් අනුව ලෙජර් ශේෂය	වෙනස
	වතුයායන්	ප්‍රධාන කාර්යාලය	එකතුව		
ගොඩනැගිලි	184,104,453.00	5,959,427.00	189,063,880.00	189,478,858.00	(684,978.00)
පරිසණක සහ ප්‍රින්ටර්	970,022.00	5,018,552.00	5,988,574.00	5,506,574.00	482,000.00
උපකරණ හා ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	26,200,532.00	17,544,268.00	43,744,800.00	42,648,014.00	1,096,786.00
මෝටර් වාහන	84,200,574.00	66,115,401.00	150,315,975.00	148,535,052.00	1,780,923.00
යන්ත්‍ර සූත්‍ර	133,620,338.00		133,620,338.00	117,017,392.00	16,602,946.00

ස්ථාවර වත්කම් වලට අදාල ලෙජර් ශේෂයන් සහ ස්ථාවර වත්කම් උපලේඛණයෙහි දැක්වෙන ශේෂයන් අතර, වෙනස්කම් පැන නැගී ඇත්තේ සංස්ථාවට අයත් වතුයායන් සඳහාය.

ඒ පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

වත්කම් කාණ්ඩය	වතුයායන්			ප්‍රධාන කාර්යාලය		
	ලෙජරය අනුව ශේෂය	උප ලේඛණය අනුව ශේෂය	වෙනස	ලෙජරය අනුව ශේෂය	උප ලේඛණය අනුව ශේෂය	වෙනස
ගොඩනැගිලි	184,104,453.00	148,266,753.00	35,837,700.00	4,959,427,.00	1,959,427.00	-
පරිසණක සහ ප්‍රින්ටර්	970,022.00	952,522.00	17,500.00	5,018,552.00	5,018,552.00	-
උපකරණ හා ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	26,200,532.00	15,227,568.00	10,972,964.00	17,544,268.00	17,544,268.00	-
මෝටර් වාහන	84,200,574.00	36,142,310.00	48,058,264.00	66,115,401.00	66,115,401.00	-
යන්ත්‍ර සූත්‍ර	133,620,338.00	114,408,412.00	19,211,926.00	-	-	-

වතුවල නිසි පරිදි ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු නොවීම හේතුවෙන් මෙම තත්ත්වය පැන නැඟී ඇත. ඒ අනුව වෙනස්කම් කොපමණ කාලයක සිට කුමන හේතුවක් නිසා පැන නැඟී තිබේද යන්න සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම්/අවශ්‍ය ගිණුම් ගැලපීම් 2023 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ)

2020 වර්ෂයේදී ලබාගත් රුපියල් මිලියන 100 ක බැංකු ණය වාර්ක 10 කින් නැවත ගෙවීමට බැංකුව සමඟ එකඟවී ඇති අතර, ඒ අනුව පළමු වාරිකය 2023 ජනවාරි මස ගෙවා ඇත. ඉතිරි බැංකු අයිරා ආයතනයේ මුදල් තත්ත්වය යහපත්වන අවස්ථාවල දී වරින් වර පියවීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ආ)

සංස්ථාව විසින් පහත සඳහන් රාජ්‍ය ආයතන වෙත පියවිය යුතු ණය ශේෂයන් පිළිබඳව අදාල ආයතන, රේඛීය අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මෙම මුදල් පියවීමට හෝ පොත්වලින් කපා හැරීමට අපේක්ෂා කෙරේ.

සී/ස හලාවත වැවිලි සමාගම - රුපියල් මිලියන 38

සී/ස ලංකා මිනිරල් සෑන්ඩ් සමාගම- රුපියල් මිලියන 25

ජනතා වතු සංවර්ධන මණ්ඩලය - රුපියල් මිලියන 97

(ඇ) වසර 5 කට වඩා පැරණි සියලුම ණයගැති ශේෂයන්ගෙන් මෙතෙක් අඩමාණ ණය යටතේ වෙන් කිරීම් සිදුනොවූ ණය ගැතියන් සඳහා 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අදාල වෙන්කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමු. එසේම අනෙකුත් ණය ගැතියන් වෙතින් මුදල් අයකර ගැනීම හෝ අඩමාන ණය යටතේ වෙන්කිරීම් සිදුකිරීම/පොත්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු 2023 වර්ෂය තුලදී සිදු කරන බව දන්වමු.

(ඈ) ඇල්කඩුව වැවිලි සමාගමෙන් අයවිය යුතු රු. 1,916,092.00 ක මුදල (ලැබිය යුතු ණය මුදල රු. 1,500,000.00 හා ලැබිය යුතු වැටුප් රු. 416,092.00 පිළිබඳව අදාල ආයතනය හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එය පොත්වලින් කපා හැරීමට හෝ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු 2023 වර්ෂය තුල සිදුකරන බව දන්වා සිටින්නෙමු.

(ඉ) ගස් අලෙවියට අදාලව ලැබී ඇති රු. 786,379.00 ක අත්තිකාරම් 2013 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් බැවින් එම මුදල 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නැවත ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඊ) වතු කාර්ය මණ්ඩල (ESPS) ආර්ථ සාධක අරමුදල වෙත 2021.12.31 දිනට ගෙවිය යුතු මුදල රු. 29,345,773.00 වන අතර ආයතනය මුහුණ දෙන මූල්‍ය අර්බුධය හේතුවෙන් මෙම මුදල් නියමිත පරිදි පියවීමට නොහැකි වී ඇති බව දන්වා සිටින්නෙමු.

1.27 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

(අ) පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීමේ මුල් පියවර වශයෙන් සියළුම වතුයායන් වල ඇති වාණිජ වටිනාකමක් ඇති සියළුම ගස් අංක කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස සියළු වතු අධිකාරීන් වෙත දන්වා ඇති අතර, දැනටමත් වතුයායන් 10 කින් එම වාර්තා ලැබී ඇත. ඒ අනුව මෙම වත්කම් තක්සේරු කිරීමේ කටයුතු 2023 වර්ෂය තුල සිදු කිරීමට නියමිත බව දන්වා සිටින්නෙමු.

ඒ අනුව 2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මඟින් සංස්ථාව සතු සියළු වතුවල පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වල වටිනාකම දැක්විය හැකි බව දන්වා සිටිමු.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ධාරක ජීව විද්‍යාත්මක වත්කම් එක් එක් වගාවන් අනුව වයස් විශ්ලේශණයක් 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී පිළියෙල කරන බව දන්වා සිටින්නෙමු.

(ඇ) 2. වුඩ්සයිඩ්, වෛතලාව, විහාරගල හා මිඩ්ලන්ඩ් වතුයායන්ට අදාල සේවක පාර්තෝෂිත වෙන්කිරීම් ශේෂ සැකසී ඇති ආකාරය දැක්වෙන වාර්තා PAL/C/SLSPC/21/AQ/07 හා 2023 ජනවාරි 12 දිනැති විගණන විමසුමට අදාල පිළිතුර සමඟ අමුණා ඇත.

(ඈ) පාරිතෝෂිත වෙන්කිරීමේ ගිණුමේ ගලපා ඇති රු. 159,683,488.00 ක වටිනාකම සැකසී ඇති ආකාරය පහතින් දක්වා ඇත. 2021 වර්ෂයේ වතු කම්කරුවන්ගේ දෛනික වැටුප් 33% කින් වැඩිවීම වැඩිවීම හේතුවෙන් වසර අවසානයේ පාරිතෝෂිත වෙන්කිරීම් ගැලපුම් වටිනාකම ඉහළ අගයක් ගෙන ඇත.

ප්‍රධාන කාර්යාල පාරිතෝෂිත වෙන්කිරීම් 2021.12.31 දිනට සේවක වැටුප් මත පදනම් වී ඇති බැවින් ඒ අනුව අවශ්‍ය ගැලපීම් 2021 දෙසැම්බර් මස සිදුකර ඇත.

වතුයාය	වතු ජංගම ගිණුමට මාරු කල මාසය	හර සටහන් (රු.ශත)	බැර සටහන් (රු.ශත)
අලකොල්ල	දෙසැම්බර් 2021	21,245,404.45	-
කොටහග	දෙසැම්බර් 2021	11,777,743.34	-
ගල්පිහිල්ල	දෙසැම්බර් 2021	10,749,716.73	-
ගෝමර	දෙසැම්බර් 2021	15,169,288.71	-
හාගල	දෙසැම්බර් 2021	10,347,150.42	-
හෙයාර්පාක්	දෙසැම්බර් 2021	16,926,000.00	3,805,883.50
හුන්නස්ගිරිය	දෙසැම්බර් 2021	14,322,000.00	-
කැලෑබොක්ක	දෙසැම්බර් 2021	48,869,872.75	-
ඕපල්ගල	දෙසැම්බර් 2021	5,377,500.44	-
රංගල	දෙසැම්බර් 2021	8,892,724.34	-
මිඩ්ලන්ඩ්	දෙසැම්බර් 2021	-	1,974,016.00
නිකොලොය	දෙසැම්බර් 2021	-	724,878.37
ප්‍රධාන කාර්යාලය	දෙසැම්බර් 2021	2,510,865.00	-
		166,188,266.18	6,504,777.87

ශුද්ධ ගැලපුම් වටිනාකම - රු. 159,683,488.31

(ඉ) 2021.12.31 දිනට දේපළ පිරියත සහ උපකරණ යටතේ පෙන්නුම් කර ඇති රු. 6,705,259.00 ක් වූ වෙනත් පවරාගත් වත්කම් (Other Vested Assets) ශේෂය, 1997 වසරට පෙර සිට පැවත එන ශේෂයකි. තවද මෙම වත්කම් වලට අදාළ කිසිදු ලේඛනයක් අප සතුව නැත.

වතුයායන් සඳහා ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීමෙන් පසුව මෙම පවරාගත් වත්කම් ශේෂය හඳුනා ගැනීමට හැකිවන බව දන්වා සිටින්නෙමු.

(ඊ)

5. සංස්ථාව සතු ඉඩම්, ගොඩනැගිලි, කර්මාන්තශාලා, යන්ත්‍රෝපකරණ තක්සේරු කිරීමට අදාල මූලික කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති අතර, සංස්ථාව සතු ඉඩම් මැනීම් කටයුතු ද මේ වන විටත් ආරම්භ කර ඇත. ප්‍රධාන කාර්යාලයේ භාවිතයේ ඇති සියළුම වාහන වලට අදාල ලියාපදිංචි සහතික, රක්ෂණ සහතික සහ ලොග් පොත් ආයතනය භාරයේ පවතින බව දන්වා සිටින්නෙමු. එම වාහන වලට අදාල විස්තර පහත වගුවේ දක්වා ඇත.

වාහන අංකය	ලියාපදිංචි සහතිකය	රක්ෂණ සහතිකය	ලොග් පොත
KY 4653 කාර්	ඇත	ඇත	ඇත
PB 8673 ඩබල් කැබ්	ඇත	ඇත	ඇත
43-1066 වෑන්	ඇත	ඇත	ඇත
LW 0203 ජීප්	ඇත	ඇත	ඇත
204-4233 ත්‍රීවිල්	ඇත	ඇත	ඇත
KG 5690 කාර්	ඇත	ඇත	ඇත

ඉහත ලිපි ලේඛණ වල පිටපත් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 02)

වතුයායන්ට අයත් උපකරණ, ගෘහ භාණ්ඩ සහ පරිසණක තක්සේරු කිරීමට අදාල මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

(උ) අප ආයතනය වෙනත් ස්ථානයකට රැගෙන යාම හේතුවෙන් PAL/C/SLSPC/INFO/2021/04 විමසුමට පිළිතුරු සැපයීමට ප්‍රමාද විය. කෙසේ වුවත් අදාල සත්‍යාපන වාර්තා PAL/C/SLSPC/2021/AQ/08 හා 2023 ජනවාරි 12 දිනැති විගණන විමසුම අදාල පිළිතුර සමඟ අමුණා එවා ඇති බව දන්වා සිටින්නෙමු. එසේම 2021.12.31 දිනට සංස්ථාවේ තොග තුල ඇතුළත් රු. 63,861,195.00 තොග විටිනාකම සැකසී ඇති ආකාරයට දැක්වෙන වාර්තාවක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 03)

(ඌ) ඉඩම් බදුදීමට අදාලව ලැබිය යුතු රු. 15,780,848.00 ක මුදල අඩමාන ණය යටතේ වෙන්කිරීම් 2022 වර්ෂයට ආදල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිදු කිරීමට කටයුතු කරන බව දන්වමු. ඉතිරි ණය ගැන ශේෂ පිළිබඳව 2023 වර්ෂය තුල සොයාබලා ඒ සම්බන්ධ අවශ්‍ය ගිණුම් ගැලපීම් 2023 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි සිදු කිරීමට කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වමු.

දැනටමත් ආයතනය සමඟ ගණුදෙනු කරන ආයතන වලට ආදල ණයගැති ශේෂයන් සම්බන්ධව පසු කාලීන නිරවුල් කිරීමේ පිළිබඳ විස්තර 2022.12.23 දිනැති ලිපිය මඟින් ලබාදී ඇත.

(එ) පහත සඳහන් ණය හිමි ශේෂවලට අදාල 2021.12.31 පැවති ශේෂයන් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් ලිපිවල පිටපත් PAL/C/SLSPC/2021/AQ/10 හා 2023 ජනවාරි 12 දිනැති විගණන විමසුමට අදාල පිළිතුරු සමඟ අමුණා එවා ඇත.

පොහොර සංස්ථාව	-	රු.35,931,679.00
හලාවත වැවිලි සමාගම	-	රු.38,010,958.00
ලංකා මිනරල් සෑන්ඩ්	-	රු.25,000,000.00
		රු.98,942,637.90

පහත විස්තර සඳහන් කල්ගත වූ ණය හිමි ශේෂ 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නැවත ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට නියමිතය.

පොලිකෙමෙක්ස්	-	රු. 715,388.50
ගැටගහවෙල තේ කර්මාන්තශාලාව	-	රු. 337,883.00
මවුන්ට් ලීසරි ලංකා පුද්ගලික සමාගම	-	රු. 200,000.00
වෝටර්ස් බේ තේ කර්මාන්තශාලාව	-	රු. 3,224,640.67
		රු. 4,497,912.17

දැනට ආයතනය මුහුණ දෙන මූල්‍ය අර්බුධය හේතුවෙන් රු. 255,518,946.39 ක් වූ ණය හිමි වටිනාකම තුල ඇතුලත් රජයට අයත් ආයතනයන්ට අදාල ණය හිමි ශේෂ නිරවුල් කිරීමට නොහැකි වී ඇත. අනෙකුත් ණය හිමි ශේෂ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් 2023 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි සුදුසු කටයුතු සිදුකරන බව දන්වා සිටින්නෙමු.

(ඒ) 2010 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව අඩමාණ ණය වෙන් කිරීම් සහ විශේෂ හානි කරන සඳහා වෙන්කිරීම් සැකසී ඇති ආකාරය පහත දක්වා ඇත.

i අඩමාණ ණය යටතේ වෙන් කිරීම්		
2006 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂය	-	රු. 1,591,349.00
ii විශේෂ හානි කරන සඳහා වෙන්කිරීම්	-	රු. 47,537,070.00
		රු. 49,128,419.00

ඉහත අඩමාණ ණය වෙන්කිරීම් සඳහා වන ණය ගැති ශේෂ

පරිභෝගික ණය ගැතියන් ජනවසම	-	රු. 41,071,407.00
විවිධ ආදායම් ණය කරුවන්	-	රු. 2,588,530.00
නිෂ්පාදකයින් සඳහා ණය ගැතියන්	-	රු. 726,644.00
නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ණය ගැතියන්	-	රු. 25,876.00
ලැබිය යුතු ණය (ජනවසම)	-	රු. 1,668,269.00
විවිධ ණය ගැතියන්	-	රු. 3,047,693.00
		රු. 49,128,419.00

2010 මූල්‍ය ප්‍රකාශන වල හා ණයගැති උපලේඛනවල පිටපත් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 04)

2004 වර්ෂයට පෙර සංස්ථාවේ ගිණුම් , වතු හා ප්‍රධාන කාර්යාලයේ ගිණුම් ලෙස කොටස් 02 ක් වශයෙන් පවත්වා ගෙන ගොස් තිබූ අතර, 2006 වර්ෂයේදී මෙම ගිණුම් කොටස් 02 එක්කර එක් ගිණුම් ඒකකයක් ලෙස සැකසීමේ දී සිදු වූ වරදක් හේතුවෙන් රු. 1,933,044.00 ක වෙනසක් පැන නැගුණු හෙයින් එම මුදල අක්‍රිය ගිණුම් ශේෂයක් ලෙස ඉදිරියට ගෙනවිත් ඇත. මෙම මුදල 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමු.

(ඕ) ආපසු ගෙවිය යුතු ටෙන්ඩේ තැන්පතු ලෙස ගිණුම්වල දැක්වෙන රු. 6,379,570.00 ක මුදල 2006 වර්ෂයේ සිට පැවත එන ශේෂයක් බැවින් එම මුදල 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමු.

(ක) ගස් අලෙවිය මත ණය වටිනාකම් වූ රු. 2,801,000.00 ක මුදල 2013 වර්ෂයේ සිට පැවත එන ශේෂයක් වන බැවින් මෙම මුදල 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නැවත ආදායම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු සිදුකරන බව දන්වා සිටින්නෙමු.

(ග) 2020 දෙසැම්බර් මාසයට අදාල සංස්ථාවේ විධායක නොවන කාර්යය මණ්ඩලයේ වෛද්‍යාධාර රු. 312,238.00 දායක මුදල් සංස්ථාවට අයත් මහජන බැංකුවේ අංක 046100240000933 ගිණුමෙන් ලංකා බැංකුවේ අංක 2327539 ගිණුමට මාරු කිරීමට අදාල සටහන් තැබීමේ වරදක් හේතුවෙන් මෙම ගැටලුව පැන නැගී ඇත.

(ච) වතුයායන්හි ශේෂ පත්‍රයන්හි පෙන්වා ඇති වෙළඳ ලැබිය යුතු දෑ හි අන්තර්ගත වටිනාකම් තොරතුරු ගෙන්වා ගැනීමට වතුයායන් වෙත ලිපි යවා ඇති අතර, යැවූ ලිපිවල හා ලැබුනු ලිපිවල පිටපත් (අලකොල්ල, ගල්පිහිල්ල, විහාරගල, හුන්නස්ගිරිය, කොටහඟ, හෙයාර්පාක්) PAL/C/SLSPC/INFO/2021/05 සම්බන්ධයෙන් පිළිතුරු වාර්තාව වර්ෂ 2022.12.23 දින ඔබ විගණන අංශය වෙත භාරදී ඇත.

(ජ) මෙම මුදල ගල්පිහිල්ල වතුයාය විසින් සේවක අර්ථ සාධක අරමුදල් නඩු සඳහා ගෙවන ලබන වාරික වෙනුවෙන් පවත්වාගෙන යන ගිණුමක් වන අතර, වාරික ගෙවා අවසන් වූ පසු ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් ගිණුමට මාරු කරනු ලැබේ.

2.2.2 නීතිරීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම.

(අ) සංස්ථාව බොහෝ කලක සිට මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් සේවක අර්ථ සාධක දායක මුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ දායක මුදල් සහ සේවක පාරිතෝෂික මුදල් නියමිත පරිදි ගෙවීමට නොහැකිවීමෙන් මෙම අධිභාර පැනවීම සිදුව ඇත. මෙම හිඟ මුදල් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර, එම මුදල් ලැබීමෙන් පසුව අදාළ ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු. සංස්ථාවේ 2021.12.31 දිනට ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමදුල් ශේෂයන් රු. 539,974,518.00 ක් හා රු. 34,586,229.00 කි. මෙම ශේෂ පිළිබඳ විස්තරාත්මක තොරතුරු ආයතනය සතුව නොමැති බව පිලිගන්නා අතර, ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර එම උපදෙස් පරිදි ඉදිරි කටයුතු කරන බව දන්වමු.

(ආ) බොහෝ කලක සිට ආයතනය මුහුණ දෙන මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සේවක පරිතෝෂිත ගෙවීම් නියමිත දිනට නිරවුල් කිරීමට නොහැකි වී ඇති අතර, ඒ හේතවෙන් ගෙවිය යුතු පාරිතෝෂිත ශේෂයන් මත අධිභාර පැනවීම ද සිදුකර ඇත. මෙම හිඟ මුදල් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාගැනීමට අපේක්ෂා කරන අතර, එම මුදල් ලැබීමෙන් පසුව අදාල ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පසුගිය වසර ගණනාවක සිට අලාභ ලබා ඇති අතර, ඒ අනුව 2021.12.31 දිනට සමුච්චිත අලාභය රු. මිලියන 2.127 කි. එබැවින් මෙම මූල්‍ය අර්බුදය හේතුවෙන් ආයතනය විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබූ බදු පිළිබඳව අවධානයක් යොමු වී නොමැත. නමුත් අනෙකුත් බදු වාර්තා (මුද්දර බදු උපයන විට ගෙවන බදු (PAYE) නියමිත දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ලය දැන්වත් කර ඒ සම්බන්ධව ලැබෙන උපදෙස් අනුව ඒ් සඳහා ගත යුතු ඉදිරි පියවරයන් ගැනීමට අපේක්ෂා කෙරේ.

(ඈ) සංස්ථාව අයත් ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යන සියලුම ජංගම බැංකු ගිණුම් වලට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමේ දී 2022 ජනවාරි මාසයේ සිට සැසඳුම් ප්‍රකාශ පිළියෙල කල දිනය සටහන් කිරීමට කටයුතු කර ඇත.

(ඉ) 5. සංස්ථාවේ 2023 වර්ෂයට අදාල ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීම ජාතික වැවිලි කළමණාකරන ආයතනයට භාරදී ඇති අතර, මේ වනවිට එය පිළියෙල වෙමින් පවතින අතර, එම ව්‍යාපාර සැලැස්ම 2023 වර්ෂයේ අප්‍රේල් මස වනවිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

සංස්ථාව සඳහා ව්‍යාපාර සැලැස්මක් නොමැතිවුව ද වැවිලි අංශය සඳහා 2021 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියල කල අතර, ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතිය ද ලැබී ඇත. රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද 2021 වර්ෂයට අදාල වැවිලි අංශය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 05)

(ඊ) පොදු ව්‍යාපාර සඳහා යහපාලන මාර්ගෝපදේශ 4.2.3 හා 4.2.6 ප්‍රකාරව කාර්ය සාධන වාර්තා/ප්‍රගති වාර්තා පිළියෙල කර කාර්තුමය අර්ධ වාර්ෂික හා වාර්ෂික වශයෙන් ඉදිරිපත් කලයුතු නමුත් 2019,2020 හා 2021 වර්ෂ වෙනුවෙන් එසේ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු බව පිළිගනිමු.

2021 වාර්ෂයේ කොරෝනා වසංගතය හා වෙනත් හේතූන් මත කාර්යාලීය කටයුතු නිසි පරිදි සිදුනොවීම හේතුවෙන් කාර්ය සාධන වාර්තා/ප්‍රගති වාර්තා කාර්තු පදනම මත සකස් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්

2022 වර්ෂය වෙනුවෙන් වැවිලි අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්තු පදනම මත කාර්ය සාධන වාර්තා පිළියෙල කර ඇත.

2021 වර්ෂයට අදාල සංස්ථාවේ අයවැය ලේඛණය සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ද ලබාගෙන ඇත. අදාල අයවැය ලේඛණයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 06)

(උ) විගණන ඡේදයේ සඳහන් අපහරණය කලයුතු මට්ටමේ පවතින වාහන හා දැනට ධාවනයේ පවතින වාහන පිළිබඳ විස්තර 2022.08.19 දින සිදු කරන ලද වාහන පිළිබඳ භෞතික පරීක්ෂාව අනුව පහත දක්වා ඇත.

- ධාවන තත්වයේ ඇති වාහන

වාහනය දැනට පවතින ස්ථානය	වාහන අංකය	වාහන වර්ගය
ප්‍රධාන කාර්යාලය	43-1066	වෑන්
ප්‍රධාන කාර්යාලය	204-4233	ත්‍රීවිල්
ප්‍රධාන කාර්යාලය	37-9005	ට්‍රැක්ටර්

- අලුත්වැඩියා කරමින් පවතින වාහන

වාහනය දැනට පවතින ස්ථානය	වාහන අංකය	වාහන වර්ගය
කොටහඟ වතුයාය	GA 0343	ලොරි
කැලෑබොක්ක වතුයාය	GJ 3629	ලොරි

- අලුත්වැඩියා කිරීමට සැලසුම් කර ඇති වාහන

වාහනය දැනට පවතින ස්ථානය	වාහන අංකය	වාහන වර්ගය
කැලෑබොක්ක වතුයාය	43-1067	වෑන්
ගල්පිහිල්ල වතුයාය	32-4773	ජීප්
ගල්පිහිල්ල වතුයාය	32-5871	ජීප්
ගල්පිහිල්ල වතුයාය	32-3753	ජීප්
ගල්පිහිල්ල වතුයාය	32-3646	ජීප්
ගල්පිහිල්ල වතුයාය xxx	32-4734	ජීප්

- අබලි ද්‍රව්‍ය ලෙස ඉවත් කිරීමට මෝටර් රථ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂා කර ලබාදී ඇති වාහන ලැයිස්තුව පහත පරිදි වේ. මේම වාහන කොටස්වල වැසි අංක කපා ඉවත්කර ලියාපදිංචි සහතික අවලංගු කිරීමෙන් පසු අබලි ලෙස විකිණීම සඳහා සැලසුම් කර ඇත.

වාහනය දැනට පවතින ස්ථානය	වාහන අංකය	වාහන වර්ගය
කැලෑබොක්ක වතුයාය	46-2086	ට්‍රැක්ටර් රථය
කැලෑබොක්ක වතුයාය	46-1229	ට්‍රැක්ටර්
කැලෑබොක්ක වතුයාය	43-1192	ලොරි
කැලෑබොක්ක වතුයාය	41-5682	ලොරි
කැලෑබොක්ක වතුයාය xxx	43-1570	ලොරි
කැලෑබොක්ක වතුයාය	43-1435	ලොරි
ගල්පිහිල්ල වතුයාය	125-4601	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	127-3478	මෝටර් සයිකල්
අලකොල්ල වතුයාය	43-2641	ලොරි
අලකොල්ල වතුයාය	43-2623	ට්‍රැක්ටර්
ගල්පිහිල්ල වතුයාය	16-1107	කාර්
ගල්පිහිල්ල වතුයාය xxx	145-6413	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	GI 9961	මෝටර් සයිකල්
ගල්පිහිල්ල වතුයාය	15-0386	කාර්
කැලෑබොක්ක වතුයාය xxx	127-3372	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	46-0225	ට්‍රැක්ටර්
ගල්පිහිල්ල වතුයාය	127-3399	මෝටර් සයිකල්
ගල්පිහිල්ල වතුයාය	125-4632	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	127-3415	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	43-1814	ලොරි
ගල්පිහිල්ල වතුයාය	26-3316	ලොරි
ගල්පිහිල්ල වතුයාය	127-3759	මෝටර් සයිකල්

- විකිණීමෙන් පසු අලුත්වැඩියා කර භාවිතා කිරීමට හැකි වහාන මෝටර් රථ ප්‍රවාහන දේපාර්තමේන්තුව මඟින් පරීක්ෂා කර ලබාදී ඇති වාර්තා අනුව (ධාවන තත්වයේ නොමැති) 2023.01.10 දින (දිණමින, ඩෙලිනිවුස් හා තිනකරන්) යන පුවත්පත් වල පුවත්පත් දැන්වීම් යොදා වාහන විකිණීම සඳහා ටෙන්ඩර් පත් කැඳවා ඇත. ටෙන්ඩර් පත් කැඳවීමේ අවසාන දිනය 2023.03.10 වේ. එම වාහන ලැයිස්තුව පහත පරිදි වේ.

වාහනය දැනට පවතින ස්ථානය	වාහන අංකය	වාහන වර්ගය
කැලෑබොක්ක වතුයාය	41-5412	මෝටර් ලොරි
කැලෑබොක්ක වතුයාය	41-4850	මෝටර් ලොරි
ගල්පිහිල්ල වතුයාය	40-5185	මෝටර් ලොරි
ගල්පිහිල්ල වතුයාය	16-1075	කාර් රථය
කැලෑබොක්ක වතුයාය	GI 9543	මෝටර් සයිකල්
අලකොල්ල වතුයාය	GI 9544	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	GI 9591	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	GI 9561	මෝටර් සයිකල්
කැලෑබොක්ක වතුයාය	GI 9670	මෝටර් සයිකල්
ගල්පිහිල්ල වතුයාය	16-1103	කාර් රථය
ගල්පිහිල්ල වතුයාය	125-4662	මෝටර් සයිකල්
ගල්පිහිල්ල වතුයාය	127-3753	මෝටර් සයිකල්
ප්‍රධාන කාර්යාලය	16-1108	කාර් රථය
ප්‍රධාන කාර්යාලය	16-0967	කාර් රථය

xxx අදාල විගණන විමසුමේ සඳහන්ව නොමැති එහෙත් වාහන පිළිබඳ භෞතික පරීක්ෂාවේදී හඳුනාගන්නා ලද වාහන ඉහත වගුවේ මෙලෙස සලකුණු කර ඇත.

ඒ අනුව වාර්තා වී ඇති ආකාරයට සංස්ථාවට අයත් වාහන සංඛ්‍යාව පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

අදාල විගණන විමසුමේ සඳහන් වාහන සංඛ්‍යාව	-	98
අදාල විගණන විමසුමේ සඳහන්ව නොමැති නමුත් භෞතික පරික්ෂාවේදී හඳුනා ගන්නා ලද වාහන සංඛ්‍යාව	-	06
එකතුව	-	104
අඩුකලා		
ඉහත සඳහන් වගුවල දක්වා ඇති වාහන සංඛ්‍යාව	-	47
ඉතිරි වාහන සංඛ්‍යාව	-	57

වාහන පිළිබඳව භෞතික පරීක්ෂාවේදී සංස්ථාව භාරයේ නොමැති ලෙස හඳුනාගත් වාහන සංඛ්‍යාව 57 ක් වන අතර, සංස්ථාව සතු වත්කම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත පැවරීමේ දී මෙම වාහන ද පවරා ඇති බවට දැනගැනීමට ලැබී ඇති හෙයින් මේ පිළිබඳව ඉදිරියේදී පරික්ෂා කිරිමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු. අදාල වාහන ලේඛණය මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 07)

(ඒ) විගණන ඡේදයේ සඳහන් KY 4353 දරණ කාර් රථය සංස්ථාවේ සභාපති විසින් භාවිතා කරන නිල රථය වන අතර, PB 8673 දරණ කැබ් රථය 2021 වර්ෂය තුල සංස්ථාව විසින් භාවිතා කර නොමැත. වැවිලි අමාත්‍යාංශය මඟින් ලබාදී ඇති මෙම රථය අලුත්වැඩියාවෙන් අනතුරුව 2022 වර්ෂයේ මැද භාගයේ සිට සංස්ථාවේ භාවිතය සඳහා ගෙන ඇත.

අංක 11/2006 හා 2006 ජූලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයෙහි සඳහන් ඇමුණුම් 03 ආකෘතිය භාවිතා කරමින් අතිරේක ඉන්ධන සඳහා අනුමැතිය ලබාගෙන නොමැති බවට විගණන ඡේදයේ සඳහන් වුවද 2015 වර්ෂයේ සිට අංක PED/1/2015 හා 2015.05.25 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම් වල නිළධාරින්ගේ ඉන්ධන හා ප්‍රවාහන දීමනා පාලනය වේ. එම චක්‍රලේඛයේ 3.2 වගන්තිය අනුව අතිරේක ඉන්ධන සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත්, ඒ සඳහා භාවිතා කළයුතු ආකෘතිය පිළිබඳව සඳහන් වී නොමැත.

2021.03.31 දිනැති අංක NPI/ADMIN/09/පොදු උපදෙස් v-3 දරණ වැවිලි අමාත්‍යාංශයේ ලිපිය අනුව අවශ්‍ය විස්තර සහිතව ඉදිරිපත් කර ඇති වාර්තාවක් මඟින් අතිරේක ඉන්ධන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ PED/01/2020 මඟින් PED/01/2015 දරණ චක්‍රලේඛය මඟින් අතිරේක ඉන්ධන ලබාගැනීම සඳහා පනවා තිබූ විධි විධාන අවලංගුවී ඇති අතර, ඉන් පසුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති PED/04/13(1) හා /2021.03.18 දිනැති ලිපිය අනුව වැවිලි අමාත්‍යාංශයේ ලේකම් විසින් උක්ත ලිපිය නිකුත් කර ඇත. රේඛීය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 08)

(ඒ) ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව ලබාගත් අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කල නිළධාරියා 2021.05.31 දින සේවයෙන් ඉවත් වී ඇති අතර, ඉන් පසුව අදාළ දීමනා ගෙවීම් සිදුකර නොමැත. එසේම කළමණාකාරිනී (ඉඩම්) තනතුරේ සේවය කරන නිළධාරිනියට ගෙවන ලද ප්‍රවාහන හා ඉන්ධන දීමනා 2022.01.01 දින සිට නතර කර ඇත.

2.2.3 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ බලතල කාර්තවය හා කාර්යයන් අනුකූල ලෙස කටයුතු කර ඇති බව දන්වා සිටින්නෙමු.

2.2.4 සංස්ථාවේ කළමණාකරනය සංස්ථාව සතු සම්පත් සැකසුරුම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා හැකි උපරිම අයුරින් කටයුතු කර ඇත.

(අ) 2021 වර්ෂයේ රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ නිෂ්පාදනය 2020 වර්ෂයට සාපේක්ෂව 4% ක වර්ධනයක් ලබා ඇත. සංස්ථාවේ ලිපිගොනු අනුව සමලෝචිත වර්ෂයේ සංස්ථාවේ වතුයායන් අතරින් කොටහග, හෙයාර්පාක්, මිඩ්ලන්ඩ්, ඔපල්ගල හා වුඩ්සයිඩ් යන වතුවල අස්වැන්න 2020 වර්ෂයට වඩා 2021 වර්ෂයේද 4% සිට 11% දක්වා පහළ ගොස් තිබූ බව පිළිගනිමු.

කොටහග හා හෙයාර්පාක් වතුයායන්වල තේ වගාවේ වැඩි ප්‍රතිශතයක් ඉපැරණි ඇට තේ වගාවක් වන අතර, සමාලෝචිත වර්ෂයේදී ඉපැරණි ඇට තේ වගාවන්ට පොහොර ලබාදීමේ දී 2020 වර්ෂයට වඩා අඩු ප්‍රතිශතයක් ලබාදීමත්, ලබාදුන් පොහොර වලින් ප්‍රතිඵල ලබාගැනීමේ දී රිකිලි තේ වගාවට වඩා වැඩි කාලයක් ගතවීමත් මෙම වතුයායන් දෙකෙහි අස්වැන්න 2020 වර්ෂයට වඩා අඩුවීමට බලපා ඇති බවත් මිඩ්ලන්ඩ්, ඔපල්ගල වතුයායන් වලට සමාලෝචිත වර්ෂයේ ලැබී ඇති වාර්ෂික වර්ෂාපතනය 2020 වර්ෂයට වඩා අඩුවීම එම වර්ෂයේ එම වතුයායන් දෙකෙහි අස්වැන්න අඩු වීමට බලපා ඇත.

(ආ) 2021 වර්ෂයේ දී කිලෝ ග්‍රෑම් 10,345,522 ක ප්‍රමාණයෙන් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කර තිබුණත් එවකට රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වයන් සමඟ මතුවූ ගැටළු සහගත තත්වයන් මත 2021 සත්‍ය නිෂ්පාදනය තේ කිලෝ ග්‍රෑම් 8,385,002 ක් විය. ඒ අනුව ඒය අපේක්ෂිත නිෂ්පාදනය හා සැසඳීමේදී 19% ක අඩුවීමකි.

(ඇ) 2021 වර්ෂයේ බාහිර වැවිලි කරුවන්ට ලබාදී තිබූ ඉඩම් වලින් අපේක්ෂිත තේ අස්වැන්න කිලෝ ග්‍රෑම් 1,059,607 ක් වුවද සත්‍ය නිෂ්පාදනය කර තිබුනේ කිලෝ ග්‍රෑම් 793,501 කි. එය අපේක්ෂිත තේ නිෂ්පාදන අස්වැන්නෙන් 75% කි. කෙසේ වෙතත් බාහිර වැවිලි කරුවන්ට ලබාදී ඇත්තේ ඉතාමත් අඩු ඵලදාවකින් යුත් තේ ඉඩම් වන අතර, එසේම 2021 වර්ෂයේ රසායනික පොහොර මිලදි ගැනීමේ දී පැවතුන ගැටළු සහගත තත්වය මත බාහිර වැවිලිකරුවන් වෙත අඩු පොහොර ප්‍රමාණයක් ලබාදීමට සිදුවීම හේතුවෙන් අපේක්ෂිත පරිදි තේ නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට නොහැකි විය.

(ඈ) මෙම ක්‍රමවේදය පිළිබඳව නැවත සමාලෝචනයක් සිදුකර ඒ අනුව සුදුසු පරිදි 2024 වර්ෂයේදී මෙම ක්‍රමවේදයෙහි අවශ්‍ය සංශෝධනය සිදුකිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමු.

(ඉ) අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක් නිෂ්පාදනය කිරීමේ සාමාන්‍ය පිරිවැය සමාලෝචිත වර්ෂයේ රුපියල් 121.08 වන අතර විහාරගල වතුයායේ නිෂ්පාදන පිරිවැය රුපියල් 360 කි.

මෙම වතුයාය වසර ගණනාවක් බාහිර පාර්ශවයේ පාලනය යටතේ පැවති අතර, එහි 100% ක් පවතින්නේ ඉපැරණි ඇට තේ වගාවකි. ඒ අනුව දින තේ අස්වැන්න ඉතා අඩු මට්ටමක පැවති හෙයින් එහි නිෂ්පාදන පිරිවැය සංස්ථාවේ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැයට වඩා ඉහළ අගයක් ගෙන ඇත.

(ඊ) නව තාක්ෂණය යටතේ අගය දාමය වැඩි කිරීමේ අරමුණින් නවීකරණය කල (Orthodox) කල ගෝමර කර්මාන්ත ශාලාව 2023 වර්ෂයේ වැඩ ආරම්භ කිරීමට නියමිත අතර, ඒ තුලින් සංස්ථාවේ වතුයායන් කිහිපයක අමුදළු එම කර්මාන්ත ශාලාවට ලබාදීමට හැකිවනු ඇත. මීට අමතරව කැලැබොක්ක කර්මාන්තශාලාව ද නව යන්ත්‍ර සූත්‍ර යොදා නවිකරණය කිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව ඉදිරියේදී සංස්ථාව සතු වතුයායන් වල තේ දළු මඟින් සංස්ථාවේ තේ කර්මාන්තශාලා ක්‍රියාත්මක කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරේ.

2.3 අනෙකුත් විගණන නිරීක්ෂණ

i තේ දළු විකිණීමට අදාලව මිළ ගණන් කැඳවීම සඳහා පුවත්පත් වල දැන්වීම් පලකර ඇති අතර, එම පුවත්පත් දැන්වීම් වල පිටපත් අංක PAL/C/2021/AQ/03 හා 2023 ජනවාරි 12 දිනැති විගණන විමසුමට අදාල පිළිතුරු සමඟ එවා ඇත. අදාල ගොනුවල එම දැන්වීම් වල පිටපත් ඇතුලත් වී නොතිබුනු අතර, මේ වනවිට එම අඩුපාඩු සම්පූර්ණ කර ඇත.

ii තේ දළු විකිණීම සඳහා තෝරාගන්නා ලද සියළු ගැණුම්කරුවන් වෙතින් ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල් ලබාගෙන ඇත. හැටන් ප්ලාන්ටේෂන් සමාගම 2020.02.28 දින ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු ලෙස රු. 1,100,000.00 ක් ගෙවා ඇති අතර, එම මුදල් නැවත ලබාගෙන නොමැත. තේ දළු මිලට ගැනීමට අදාලව ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී අදාල කුවිතාන්සි අංකය ටෙන්ඩර් පතෙහි සටහන් කර ඇත. කෙසේ වෙතත් මින් ඉදිරියට එම කුවිතාන්සි පිටපත් අදාල ගොනුවලට ඇතලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

iii දළු මිලදී ගැනීම සඳහා තෝරගත් පාර්ශව සමඟ අත්සන් කර ඇති ගිවිසුම් අනුව එම ආයතන මාසිකව මිලදී ගන්නා දළු ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලකට බැංකු බැඳුම්කර හෝ මුදල් බැඳුම්කර ලබාගෙන ඇත.

iv සෑම මසකම පළමු දින සංස්ථාවට අයත් වතුයායන්හි තේ දළු විකිණීම අනිවාර්යෙන්ම සිදුකල යුතු හෙයින් රට තුල පැවති අයහපත් සෞඛ්‍ය තත්වයන් හා වෙනත් නොවැලැක්විය හැකි හේතූන් නිසා අදාල ගිවිසුම් කොන්දේසි සම්පූර්ණ වි නොතිබුණ ද දීර්ඝ කාලයක සිට දළු මිලට ගනු ලබන ආයතන සමඟ ඇතිකර ගත් විශ්වාසය මත දළු විකිණීම සිදුවී ඇත. එසේ වුවද පසුව අදාල ලිපිගොනු සම්පූර්ණ කිරීමට කටයුතු කල බව දන්වා සිටිමු.

v 2021 වර්ෂයේ රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල පැමිණීම ද අඩු මට්ටමක පැවතීම නිසා මෙම තත්වය පැනනැගී ඇත. එසේ වුවද සියළු ලංසු විවෘත කිරීම් ලංසු ඉදිරිපත් කල පාර්ශවකරුවන් ඉදිරියේදී සිදුකර ඇති බව දන්වා සිටින්නෙමු.

vi සංස්ථාව මුහුණ දී ඇති බලවත් මූල්‍ය අර්බුදය හමුවේ වැඩි ආදායමක් ලබාගැනීමේ අරමුණින් ගැණුම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් වලට වඩා වැඩි මිලක් තේ දළු සඳහා ගෙවීමට කුරුගම තේ කර්මාන්ත ශාලාව එකඟතාවය පල කල හෙයින් අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේද එකඟතාවය මත අදාල තේ දළු ටෙන්ඩරය පිරිනැමීම සිදු කර ඇත. මෙම දළු මිලට ගැනීම සඳහා කුරුගම තේ කර්මාන්ත ශාලාව ද මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, ඊට අදාල 2021.10.21 දින සිදුකර තිබූ මිල ගණන් විවෘත කිරීම පිළිබඳ කමිටු වාර්තාවේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 09)

(ආ) 2021.12.31 දිනට ලැබිය යුතු තේ දළු ආදායමෙන් වසර 2-4 පැරණි ශේෂයන් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කර ඇත. වසර 1 ට වඩා අඩු අනෙකුත් ශේෂයන්ගෙන් පහත සඳහන් ආයතන වෙතින් අයවිය යුතුව තිබූ මුදල් දැනටමත් අයවී ඇත.

ණය ගැතියාගේ නම	2021.12.31 දින ශේෂය	පිය වූ දිනය	පිය වූ මුදල	කුවිතාන්සි අංකය
කැරොලිනා වත්ත	4,360,872.28	2022.01.09	5,000,000.00	RH/22/09
ස්ටැඩ්ඩන්	1,339,769.17	2022.01.24	1,500,000.00	RH/22/50
කුරුගම තේ කර්මාන්ත ශාලාව	2,105,193.00	2022.01.07	2,105,911.00	RH/22/14
රාක්ෂාව තේ කර්මාන්ත ශාලාව	1,493,118.00	2022.01.10	1,493,118.00	RH/22/20

ඉවිටගල තේ කර්මාන්ත ශාලාව යන ආයතනය විසින් අයවිය යුතු ලෙස දැක්වෙන රු. 242,503.00 ක මුදල 2019 වර්ෂයේ සිට පැවත එන ගිණුම්කරණ අඩුපාඩුවක් නිසා පැන නැගුණු ශේෂයක් වන අතර, මෙය නිවැරදි කිරීමට අදාල ගිණුම් ගැළපීම් 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිදුකරන බව දන්වා සිටිමු.

ණය අයකර ගැනීම සඳහා මේ වනවිටත් නීතිමය පියවර ගෙන ඇති ආයතන පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

ආයතනය	මුදල (රු.ශත)
එම්ඊසීසී වැවිලි පුද්ගලික සමාගම	3,541,873.00
නාකුඔය තේ කර්මාන්ත ශාලාව	5,136,192.00
පුස්සතැන්න තේ කර්මාන්ත ශාලාව	655,279.00

(ඇ) සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති තනතුරු 22 ක් ඌනතාවය සැකසී ඇති ආකාරය හා ඒ පිළිබඳ වර්තමාන තත්වය පහත දක්වා ඇත.

1 කළමණාකරු (අලෙවි)

මෙම තනතුර 2020.07.01 දින සිට පුරප්පාඩු වී පැවතී නමුත් එම අංශයේ රාජකාරී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) ගේ අධීක්ෂණය යටතේ සිදුවිය. කෙසේ වෙතත් මෙම පුරප්පාඩු පිරවීම සඳහා රේඛීය අමාත්‍යාංශය මඟින් මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

ii අභ්‍යන්තර විගණක

අභ්‍යන්තර විගණක වශයෙන් සේවය කල නිළධාරියා 2021.05.31 වන දින සංස්ථා සේවයෙන් ඉවත්වූ අතර, 2022.01.03 දින නැවත එම තනතුර සඳහා නිළධාරියෙකු පත්කරන ලදී.

iii ජෙෂ්ඨ වතු අධිකාරී

මෙම තනතුර යටපත් කර වතු අධිකාරි තනතුරක් අනුමත කරන ලෙස ඉල්ලා රේඛීය අමාත්‍යාංශය විසින් මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

iv ගණකාධිකාරී

ගණකාධිකාරි ලෙස සේවය කල නිළධාරියා 2021.06.19 වන දින සේවයෙන් ඉවත්වූ අතර, 2022.11.15 වන දින නැවත එම තනතුර සඳහා නිළධාරිනියක පත් කරන ලදී.

v සාමාන්‍යාධිකාරීගේ පෞද්ගලික සහකාර (PA to General Manager)

මෙම තනතුර සඳහා 2018.11.12 දින බඳවාගත් නිළධාරියා 2020.05.27 වන දින සේවයෙන් ඉල්ලා අස්වූ අතර, එම තනතුර සඳහා 2022.04.21 දින බඳවාගත් නිළධාරියා ද 2022.08.05 දින සේවයෙන් ඉවත් විය. මෙම පුරප්පාඩුව පිරවීම සඳහා අනුමැතිය ඉල්ලා රේඛීය අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත.

vi කළමණාකරන සහකාර (විගණන)

2019 වර්ෂයේදී නව විගණන නිළධාරි තනතුරක් අනුමත කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද මුත් එම තනතුර අනුමත කිරීම නොහැකි බව දන්වා ඒ වෙනුවට විගණන අංශයට කළමණාකරන සහකාර තනතුරක් අනුමත කරන ලදි. ඒ අවස්ථාව වන විට අභ්‍යන්තර විගණන අංශයේ කළමණාකරන සහකාර කාර්යය මණ්ඩලයේ අවශ්‍යතාවයක් නොපැවතුනද, මේ වන විට අභ්‍යන්තර විගණන අංශය සඳහා කළමණාකරන සහකාරවරයෙකු අවශ්‍ය බැවින් ඒ සඳහා අනුමැතිය ඉල්ලා රේඛීය අමාත්‍යාංශයට ලිපියක් යොමු කර ඇත.

vii කළමණාකරන සහකාර

කළමණාකරන සහකාර තනතුරු 6 ක පුරප්පාඩුවක් ඒ වන විට පැවතිය ද එම තනතුරු සඳහා 2022.01.19 දින බඳවා ගැනීම් සිදු කරන ලදී.

viii රියදුරු

රියදුරන් 4 දෙනෙකුගේ පුරප්පාඩු පිරිවීම සඳහා අනුමැතිය ඉල්ලමින් රේඛීය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත.

xi කම්කරු

කම්කරුවන් 4 දෙනෙකුගේ පුරප්පාඩු පිරිවීම සඳහා අනුමැතිය ඉල්ලමින් රේඛීය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත.

x සහකාර කළමණාකරු (ප්‍රාදේශීය කාර්යාලය)

ප්‍රාදේශීය කාර්යාලයේ සහකාර ගණකාධිකාරී වරයෙකු සේවය කරන බැවින් සහකාර කළමණාකරුගේ රාජකාරී එම නිලධාරියා මඟින් ඉටුකර ගැනීමට හැකිවීම නිසා මෙම තනතුර සඳහා වෙනත් නිළධාරියෙකු බඳවා නොගන්නා ලදී. කෙසේ වෙතත් මේ වන විට එම පුරප්පාඩුව පිරිවීම සඳහා අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත.

බොහෝ කලක සිට ආයතනය මුහුණදෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් සීමිත කාර්යය මණ්ඩලයක් මඟින් සංස්ථාවේ කාර්යයන් ඉටුකර ගැනීමට සිදුව ඇත. කෙසේ වෙතත් 2020 සහ 2021 වර්ෂවල රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් නව බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබාගැනීමට දුෂ්කරතා පැවති බවද සඳහන් කරනු කැමැත්තෙමු.

(ඇ) ආයතනයේ සේවා අවශ්‍යතාවය මත මෙම බඳවා ගැනීම් සිදුකර ඇති අතර, මෙම තනතුරු දරන්නාට පෞද්ගලික වනසේ අනුමත කර ගැනීම සඳහා 2022.10.10 දිනැති ලිපිය රේඛීය අමාත්‍යාංශය මඟින් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට යොමු කර ඇත.

(ඉ) 5. ඉඩම් අංශයේ සේවා අවශ්‍යතා හේතුවෙන් කොන්ත්‍රාත් පදනම මත නිති නිළධාරනියක පත්කර ගන්නා ලද අතර, එම නිළධාරිනිය ඉවත්වීමෙන් පසුව 2022.01.03 දින මෙම තනතුර සඳහා ස්ථිර පදනම මත නිළධාරිනියක් පත්කර ලදී.

(ඊ) සංස්ථාව සඳහා සකස් කරන ලද බඳවා ගැනීම් හා උසස් කිරීම් කාර්යය පටිපාටිය රේඛීය අමාත්‍යාංශය මඟින් 2022.01.26 දින කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඉන් පසුව අවස්ථා කිහිපයකදීම මේ සම්බන්ධව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය සංශෝධන ද සිදුකරන ලදී. ඒ අනුව සංස්ථාවේ බඳවා ගැනීම් හා උසස් කිරීම් කාර්යය පටිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් කඩිනමින් අනුමත කර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(උ) SLSPC/PL/TB/T-166/2021 දරණ ටෙන්ඩරයට අදාල ගිවිසුම මේ වනවිට ගොනුවට ඇතුලත් කර ඇත.

(ඌ) පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට වගබලා ගන්නා බව දන්වා සිටින්නෙමු.

(එ) ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා ලබාගන්නා ආපසු ගෙවීමේ තැන්පතු මුදල අදාල ටෙන්ඩර්කරු විසින් ලබාදෙන ඉල්ලීම් ලිපිය අනුව නැවත ගෙවනු ලබන අතර, හානි පූර්ණ තැන්පත් මුදල ඊට අදාලව වතු අධිකාරී විසින් ලබාදෙන වාර්තාව අනුව අදාල පරිදි මුදල් අඩුකර ගැනීමෙන් පසු නැවත ගෙවීම් කරනු ලැබේ. මේ පිළිබඳ විස්තර ප්‍රසම්පාදන ලිපිගොනු තුල ඇත්ලත් වී නොමැති බවට පිළිගන්නා අතර, මෙම අඩුපාඩු ඉදිරියේදී වලක්වා ගන්නට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඒ) ගස් විකිණීමට අදාල ගොනුවල ගස් ඉවත්කිරීම පිළිබඳව විස්තර ඇතුලත්ව නොමැති බව පිලිගන්නා අතර, මෙම අඩුපාඩු ඉදිරියේදී වලක්වා ගන්නට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.